# රසවත් රසකථා

## (3 වන පොත)

## කතෘ: චානක බණ්ඩාරගේ

BA (Hons), LLB, GDLP (Aust), DAG, DTAG (UK)

**KKN ප්‍රකාශණයකි**

**කොළඹ 8**

දුරකථනය: 071 133 4224

arwdc@bigpond.com

**සියළු හිමිකම් ඇවිරිණි**

Copyrights Protected

කතෘවරයාගේ වෙනත් කෘති:

- හොඳ උවදෙස් (1 වන පොත) (පිටු 200)

(අප සමාජය/ජීවිතය, ආදරය/විවාහය/පවුළ, අපගේ දෑස් වැනිවූ දරුවෝ, ඉංග්‍රීසි ගැන, අපට අත්‍යාවශ්‍යම නීරෝගීකම, /මනා සෞඛ්‍ය, සතුන්/ වනජීවීන්/සුරතල් සතුන්, කාළින රසවත් ප්‍රස්ථාව පිරුළු)

- හොඳ උවදෙස් (2 වන පොත) (පිටු 200)

(අපේ පරිසරය විනාශ වීම අපි වළකමු, අපේ රට දියුණු කිරිම සඳහා වූ සාධාරණ හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති මෙන්න:, කළාව/ක්‍රීඩා, මගී ප්‍රවාහන දියුණු කරන ක්‍රම)

- රසවත් රස කථා (1වන පොත) (පිටු 160)

(හිනා හිනා හිනා හතර හිනා, මසුරන් වටිනා වැකි)

- රසවත් රස කථා (2වන පොත) (පිටු 128)

(අප සමාජය, වෛද්‍යය සේවය , හෝටල්, සුන්දර අතීතය, හොඳ තේරවිලී)

- **Selected Writings of Chanaka Bandarage** (336 pages; in English)

**රසවත් රසකථා (3 වන පොත)**

*බාල, වැඩිහිටි සැමට එක හුස්මට කියවන්න පුළුවන් වටිනා පොතක්*

*නම්, ස්ථාන මනංකල්පිතයි*

**පිළිගැන්වීම - ආදරණීය මාතෘ භූමියට සහ මා සහෘද ශ්‍රී ලාංකික ඔබ වෙත ............**

---

**Copyrights@චානක බණ්ඩාරගේ, KKN ප්‍රකාශණයකි, කොළඹ 8**

---

**ISBN 887 – 057 – 5658223 -2 – 0**

---

**ප්‍රථම මුද්‍රණය: 2016 සැප්තැම්බර්**

---

# පටුන

පිටු


- පෙම්වතුන්/විවාහය/පවුල් ජීවිතය/ නැට්ටුක්කාරියෝ 1 – 34
- රස ආහාර පාන 35 -52
- බීමතුන් 53 -79
- සොඳුරු පාසැල් දිවිය 80 – 99
- සිඟන්නෝ 100 – 105
- පිස්සෝ 106 – 110
- හොල්මන්/මරණ/ මිනීමැරුම්/ජ්‍යොතිෂ (බොහොමයක් ප්‍රබන්ධනාත්මකයි) 111– 140

# • පෙම්වතුන්/විවාහය/පවුල් ජීවිතය/නැට්ටුක්කාරියෝ

1. මීට වසර ගණනකට පෙර පෙම්වතියක් සුපුරුදු පරිදි වැඩට යන බව ගෙදරට පවසා පෙම්වතා සමග මෝටර් සයිකලෙන් නුවර ගිහින් එදා තිබුන ජාත්‍යන්තර ක්‍රිකට් මැච් එකක් නරඹලා තිබුනා. ටී වී කැමරා කරුවෙකුගේ කැමරාවට අහම්බෙන් මේ ජෝඩුව අහුවෙලා, ඒක ප්‍රවෘත්ති වලින් ඒ ගෑනු ළමයාගේ දෙමව්පියන් දැකලා,එයාගේ ගේ මළ ජරමරේ. ඇයි ඒ ගෑනු ළමයාගේ බන්දවන්න ඉඳලා තියෙන්නේ එයාගේ ඇවැස්ස මස්සිනාට.

2. මාගේ උපන් දිනේට හස්බන්ඩ් අලින්ට අන්දන ඇඳුමක් ගෙනත් තිබුනා. අවුරුදු 22ක් මඟුල් කාලා දෙයියනේ මේ මිනිහා තාම දන්නේ නැහැ මම සයිස් 8 කියලා. මම ඇහුවහම කියනවා ‘හැඩට ඉන්න කෙල්ලන්ට ඇඳුම් තෝරන්න මම දන්නේ නැහැ’ කියලා. මම හාදුවක් දුන්නා, තැග්ගට වැඩිය ඒ කියපු කතාවට.

3. වයිෆ් එක්ක තරහවෙලා ආයි නම් කවදාවත් කතා කරන්නේ නැතුව ඉන්නවා කියලා හිටියා. ගෑනි කතාවටම එනවා. බැරිම තැන ‘මම ඔච්චර නරකනම් ඔයා මොකද මාව බැන්දේ කියලා’ ඇහුවා. ‘ඔයා ටෝනි රණසිංහ වගේනේ’

කියලා කිව්වා. මගේ තිබුන තරහ කොහෙන් ගියාද කියලා නැහැ.

4. චිත්‍රපටයේ අතරමැද විරාමයේදී අයිස් ක්‍රීම්, සිසිල් බීම රැගෙන එන වෙළෙන්දන් පෙන්වමින් පෙම්වතිය මොනවහරි ගමු යයි පෙම්වතාට ඇවිටිලි කලාය. මහ වියදම් හැරුණු කොට යාන්තම් ප්ලේන්ටියක රස බැලීමට පමණක් මුදල් තමන් සතු බව දත් පෙම්වතා සෙමින් මෙසේ කීය. 'අද මට ටිකක් හිසරදේ වගේ. අපි යන ගමන් උණු මොනව හරි බොමු'. ආපසු එන අතර කුඩා හෝටලයකට ගොඩ වැදුණු දෙන්නා, පෙම්වතියගේ ඉල්ලීම මත එක ප්ලේන්ටියක් ගෙන රස වින්දෝය. 'ඔයා දන්නවද, මේ ලෝකේ තියෙන රසම කෑමටත් වඩා, අපි දෙන්න එකට බොන මේ ප්ලේන්ටිය මට ගොඩක් රසයි', පෙම්වතාගේ සිත වටහා ගත් පෙම්වතිය ඔහුගේ අත සෙමෙන් අල්ලමින් කීවාය.

5. දවසක් යාළුවත් එයාගේ පෙම්වතියත් සමඟ චිත්‍රපටයක් බලල එලියට අවලු. අතේ සල්ලි තියෙන්නේ ගෙදර යන්න විතරමලු. ඒත් නිකමට වගේ පෙම්වතියගෙන් ඇහුවලු මොනවද බොන්නේ කියලා. පෙම්වතිය කිවුවලු 'ඔයා කැමති දෙයක්' කියලා. එහෙනම් වතුර දෙකක් බිල යමු කියලා ලගම තිබුණු හොටෙලේ පයිප්පෙන් ඇල්වතුර දෙක බිල ගෙදර ගියාලු.

6. දවසක් ආදරයෙන් ඉන්න දෙන්න දෙමාල්ලෝ විරසක වෙලා. දවසම ගනු දෙනු කලේ කතා නොකර. රෑට නිදා ගන්න බිරිඳ කාමරය සූදානම් කලත් සැමියා අල්ලපු කාමරේ නිදාගත්තා. බිරිඳ බලා ඉන්නවා ඉන්නවා එන්නේ නෑ. බැරි තැන විදුලි පහන නිවල නිදාගත්තා. ටිකකින් බිරිය යටිගිරියෙන් කෑගහන සද්දයක් ඇහුනා. සැමියා බලන්න ගියා. 'කැරපොත්තෙක්, කැරපොත්තෙක්'. බිරිඳ බය වෙලා දෙන්නම එකතු වෙලා කැරපොත්තාව හෙව්වත් හමු වුනේ නෑ. 'ඉතින් කැරපොත්තට බයේ ඔය කාමරේ නිදාගන්න බැරිනම් යමු අර කාමරේට'. ඒ විරසකයත් ඔන්න ඔහොම සොඳුරු ලෙසින් අවසන් වුනා.

7. 'නංගිට කතා කරන්න? මම අදයි දන්නේ මගේ දුවට අයියා කෙනෙක් ඉන්න බව'.

8. ඉස්සර අවුරුද්දට ගර්ල් ෆ්‍රෙන්ඩ් එක්ක ඇඳුම් ගන්න සෙනඟ ඉන්න කඩයකට ගියාම වෙන ගැහැණු ළමයෙක් මගේ අතේ එල්ලිලා. බලනකොට, මුහුණ දිහා බැලුවම ලැජ්ජා හිතිලා පැත්තකට ගියා. එයාගේ බෝයි ෆ්‍රෙන්ඩ් කියලා ඔහේ අත අල්ලාගෙන, මම හිතුවේ මගේ එක්කෙනා මාව අල්ලගෙන කියලා.

9. අපේ අක්කට ආපු යෝජනාවකදී අක්කාට දෑවැද්දට දෙනවා කියූ ඉඩමේ හරියටම කියපු පර්චස් ගාන තියෙනවාද කියලා එක මනමාලයෙක් මිනින්දෝරුවෙක් එක්ක ගිහිල්ලා ඉඩම

මැනලා. ඒ එක්ක ගිහින් තියෙන්නේ අපේ මාමා කෙනෙක්ගේ පුතෙක්. කියලා තියෙන්නේ විකුණන්න තියෙන ඉඩමක් කියලාලු. මඟුල එතැනින්ම ඉවරයි.

10. මඟුල් ගෙදරක යන්න බිරිඳ පැය ගණනක් තිස්සේ සැරසෙනවාලු. සැමියාට තරහා ගිහින් මෙහෙම කිව්වාලු. 'සූරිය මුදුන් වෙනතුරු රෙදි තේරිල්ල, සාරිය හොඳ මදිය කියමින් දෙඩවිල්ල, කාරිය ඉවර නැත තවමත් හැඩවිල්ල, බාරිය නැතුව මම යමි අම්මාපල්ල'.

11. අපේ ගමේ ජීවත්වුනු අඹු සැමි යුවලක්. මේ දෙපල හේන් වගාකර වන සතුන්ගෙන් ඒ වගාව ආරක්ෂා කර ගැනීම සඳහා ගහක් උඩ කුඩා පැලක් සදා ගෙන රාත්‍රී කාලය ඒ පැලේ ගත කිරීමත් කවි කියමින් සතුන් පලවා හැරීමත් මේ දෙපලගේ දින චරියාවේ කොටසක් වුනා. රාත්‍රී කාලයේ කවි කියවීම පුරුද්දක් වුනා. ඒ නිසා සතා සීපාවා හෝ මිනිස් පුලුටක්වත් ඒ පැත්තේ ආවේ නැහැ. ඒ දෙපල සතුටින් ජීවත් වුනා.

12. අවුරුදු 50 පැන්න මිනිසෙක් සිය ප්‍රථම ප්‍රේමය පටන් ගත්තා. තම සහකාරියට තදින්ම ආදරය කළා මොහු. පස්සේ දැනගැන්න ලැබුනා මේ යුවතිය ඔහුට ඇවැස්ස සහෝදරියක් වන බව. මේ නිසා මගුල කෙරුනේ නැහැ. බලවත් සිත් තැවුලට පත් මේ පුද්ගලයා සිය දිවි නසා ගැනීමට පවා සිතුවා. පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ ආශ්‍රයෙන් එයින්

ඔහු ගැලවුනා. දැන් මුළු දිවියම ආගමික දේ සඳහා යොදවනවා.

13. අපේ අම්මගේ අක්ක බඳින්න පෙර මනමාල මහත්තයා ගෙදරට ආවලු. ඉතින් මේ මඟුලට ගෙදර දෙමුපියෝ කැමති නැතිලු. මනමාලයට මේකට අකමැති බව දැන්නුවත් මනාලයාගේ ගමන නතර කර නැතිලු. ඊට පස්සේ දෙමාපියන්ට හොඳ අදහසක් ආවලු . තිත්ත තිබ්බටු උයල මනමාලයට කන්න දුන්නලු. ගමන නතර කර ගන්න හිතා ගෙන, අනේ බැලින්නම් තිත්ත තිබ්බටු දෙපාරක්ම ඉල්ලගෙන කාලා, රස නිසා දිගටම ගෙදර ආවලු. පස්සේ කසාදෙත් කරගත්තලු.

14. එක්තරා පුද්ගලයෙක්ගේ මව මියගිය පසු ආදාහනයට පෙර ඇගේ අත පැළඳ සිටි මුද්ද ගලවා ගෙදර ගෙනවුත් තිබුනා. මෙය සිහිවටනයක් ලෙස සළකා බිරිඳ ඒක ප්‍රවේශම් කරලා තැබුවා. කලකට පසු මහත්තයාගේ ඔෆිස් එකේ මිතුරෙක්ගේ විවාහ මංගල්‍ය උත්සවයට මේ යුවලම සහභාගී වුනා. එහිදී බිරිඳ අහම්බයෙන් දුටුවා මවගේ මුද්දට සමාන මුද්දක් එක්තරා කාන්තාවක් පැළඳ සිටිනවා. අනේ ලස්සන මුද්දක්. මේක බොහොම පැරණි මෝස්තරයක් නේද? දැන් කාලේ හදන ඒවා මෙහෙම නැහැනේ කියලා අතින් අල්ලලා පරීක්ෂා කරලත් බැලුවා. ගෙදර ඇවිල්ලා මුද්ද තැබූ තැන බැලුවම එතන නැති නිසා බිරිඳ ඇහුවා කෝ මේ මුද්ද කියලා. එවිට මහත්තයා කිව්වා මම දන්නේ කොහොමද ඒක ඔයාමනේ පරෙස්සම් කරලා තිබ්බෙ කියලා. බිරිඳ

කිව්වා මුද්ද තියෙන කෙනා කව්ද කියලා එයා දන්නවා කියාලා. එදා ඉඳලා ඒ ගෙදර ප්‍රශ්න.

15. විවාහක පුද්ගලයෙක් සැමදාම කෝච්චියට නගින්නේ අතේ තියෙන මුද්ද ගලවලා. මොකද මුද්ද තියෙනකොට ගර්ල්ස්ලා බලනවා අඩුලු.

16. ඔන්න මගේ යාලුවෙකුගේ විවාහ මංගල උත්සවයට මට සහ තවත් බොහෝ යාළුවන්ට ආරාධනා ලැබුනා. අපිත් හොඳට ටයි කෝට් දාගෙ එදින උත්සවයට සහභාගී වුනා. එය ඉතා අනර්ග ලෙස පැවති උත්සවයක්. අවසානයේදී මංගල යුවල මදුසමය සඳහා වෙන්කර තිබූ තරු තුනේ පන්තියේ හෝටලයකට ගිය මුත් කවුරුත් මේ හෝටලය තියෙන්නේ කොහෙද කියා දැන සිටියේ නැහැ. කෙසේ හෝ මද දුරක් අපි ඔහුගේ රිය පසු පස ගිය මුත් අප හට ඔවුන් මග හැරුනි. එම ප්‍රදේශයේ බොහෝ හෝටල් ඇති බැවින් කුමන එකට ගියාද අපි නොදත්තෙමු. කෙසේ හෝ අපි එක හෝටලයකට ගොස් පිලිගැනීමේ නිලධාරියෙකුගෙන් මනමාලයාගේ නම කියා මනමාල යුවල තවම ආවේ නැතිද කියලා ඇහුවා, අපේ පොඩි පිලිගැනීමක් තියනවා කියා. ඉන්පසු මෙයාලා නම් පරීක්ෂාවෙන් පසු ඔව් එයාලා දැන් තමා කාමරයට ගියේ කියලා පැවසුවා. පස්සේ දැනගන්න ලැබුනා එදා රෑ මේ හොටලේ ඉන්නේ මේ කපල් එක විතරයි කියලා. ඒ විතරක් නෙවෙයි හනිමූන් කපල් ඉන්න කාමරවල දොර හිලෙන් බලන වේටර්ලා ඉන්නා හෝටලයක් ලෙස ප්‍රකට වී තබුණා. රටින් ආ අක්කා අතින්

සල්ලි ගෙවා තරු පහේ හෝටලයකට මේ දෙන්නව මාරු කෙරෙව්වා.

17. සමහරක් පිරිමි විවාහ මංගල දිනයේදී විවාහ චාරිත්‍ර වාරිත්‍ර ඉටු කර මධු සමයට පැමිණි පසුව මනමාලිව හුදකලාව හෝටල් කාමරයේ තනිකර මිතුරන් පිරිස සමඟ මධු විත සප්පායම් වීමට සැරසෙති.  මම නම් ආසම නැති පිරිමින්ගේ ක්‍රියාව ඔන්න ඕක තමයි.

18. දීර්ඝ කාලින ප්‍රේම සම්බන්ධයක් කැඩුණු පසු පෙම්වතියගේ යෙහෙලියක් ඇගෙන් ඇසුවා එසේ වීමට හේතුව කුමක්ද කියා.  'මට එයාව එපා උනා. එයා ගැන මගේ හිතේ තිබුණු අදහස් කාලයක් ආශ්‍රය කරන කොට එපා උනා' කියා ඇය සිය යෙහෙළියට කිව්වා.  එහෙනම් ඇයි එයා දීපු වටිනා මුද්ද ඔයා තාම පලදින්නේ.  'ආ එක ගැන මගේ තිබු අදහස නම් තවම වෙනස් වෙලා නැහැ' කියා ඇය කිව්වා.

19. එක ස්වාමි පුරුෂයෙක් ඉන්නවලු හැම තිස්සෙම නෝනට බනින.  ඉතින් මේ මනුස්සයා දවසක් නෝනාගෙන් අහනවලු මම මෙච්චර බනිද්දීත් ඔයා මට කිසි දෙයක් නොකියා ඉවසගෙන ඉන්නේ කොහොමද කියලා.නෝනා ගානකට ගන්නැතුව කියනවලු ඔයා මට බනින හැමවිටම මම කරන්නේ බාත් රූම් එකට ගිහිල්ල ඔයාගේ බ්‍රෂ් එකෙන් කොමඩ් එක සුද්ද කරන එක කියලා ( අත්හදා බලන්න එපා).

20. එක් පෙම්වතෙක් පෙම්වතිය සොයා රෑ ඇගේ ගෙට ගොස් පෙම්වතියගේ ගෙදර මල් පඳුරකට මුවා වී සිටියා. පෙම්වතිය පැමිණි පසු දෙදෙනා පෙම්බස් දොඩමින් සිටින අතර ඇත පෙමවතියගේ ගෙදර ඔරලෝසුවේ රෑ වෙලාව **10, 11, 12** වශයෙන් වැදෙනු ඇසුනා. 'ඔයා මා ළඟ ඉන්න කොට වෙලාව යනවා දැනෙන්නේත් නැහැ, කියා පෙම්වතා කිවා. 'කෑ ගහන්න එපා අනේ, තාත්තා ගෙදර ඔරලෝසුවේ වෙලාව හරි ගස්සනවා' ඇය කීවා.

21. යාහළුවෙකෙගේ මඟුල් ගෙදර ඉවරවූ පසු ඔවුන් මධු සමයට ගියහ. ඉන් පසු එම හෝටලයේ කැරකි කැරකි සිටින අපේ වැඩපොළේ කොල්ලෝ දැක මා ඔවුන් බාර් එකට ගෙන ගොස් කිවේ 'මෙයාලා ඉල්ලන ඕන දෙයක් දෙන්න' කියාය. ඉන්පසු මේ අය පිටරට සැර පැන් වර්ගයක නමක් කියා ඉන් බෝතල, කෑම සහ තව සාමාන්‍ය බීම වර්ග ගත්හ. ඉන්පසු මම බිල ඉල්ලා එහි අත්සන් කර බලා සිටියත් මගෙන් මුදල් ගත්තේ නැත. අපි ,ස්තුතියි කියා යන්න ගියෙමු. මගෙන් මුදල් ගන්නවා වෙනුවට මනාලයාගේ නමට දමා ඔහුගෙන් ගන්න බව තේරුම් ගොස් මාද ලිස්සා මාරු වීමි. අද වන තුරු මනමාලයා අපෙන් ඒ පිලිබද ඇසුවේ නැත. ඔහු දන්නවාද නැතිනම් බිල පරික්ෂා කරේ නැතිදැයි නොදනිමි.

22. එක මිනිහෙක් එයගේ බිරිඳගේ දික්කසාද වෙලා තනියම ඉන්නේ. ඒ වුනාට මෙයට බිරිඳට හැම මාසෙකම රුපියල් **5000**ක් දෙන්න ඕනී. මොකද එයාට පුතෙක් ඉන්නවා.එයා ඉන්නේ බිරිඳ ලඟ.මේ මසේ අන්තිමට පුතාට වයස

18යි.ඒක නිසා මිනිහට තියෙන්නේ අන්තිම දීමනාව මේ මාසේ අන්තිමට දෙන්න. පුතා ආවා සල්ලි අරන් යන්න. මෙයා පුතාට කීවා 'පුතේ මේ මම උඹලාගේ අම්මට දෙන අන්තිම දීමනාව.උඹට හෙට ඉඳන් 18 ක් නිසා මට ආපහු ගෙවන්න ඕනී නෑ.උඹ මේක අම්මට කියලා, අම්මගේ මූන වෙනස් වෙන හැටි විගහට ඇවිල්ලා මට කියපන්'. පුතා ටික වේලාවකින් ආපහු ඇවිල්ලා කියනවා 'තාත්තේ අම්මා මට ලොකු රහසක් කීවා'. දැන් තාත්තා අහනවා මොකක්ද කියලා.පුතා පිළිතුරු දෙනවා 'මගේ නියම තාත්තා ඔයා නෙවෙයිලු'.

23. හමුවී මුල්ම දවසේ, යුවලක් පෙම්බස් දොඩමින් සිටියා. 'ඔයාගේ වයස කීයද' කියා තරුණයා ඇහුවා. වයස 45ක් පමණ වූ කාන්තාව කිවුවා 'ඔයා හිතන්නේ කියක් විතර ඇතිද' කියා. ඔයාට 24යි කියා තරුණයා කියා. 'ආනේ ඔයා කොහොමද කිවුවේ' කියා කාන්තාව ඇසුවා. ඔයාගේ මුහුණේ තියෙන රැලි ටික ගණන් කරලා කියා ඔහු කිවා. ඔවුන් දෙදෙනා නැවත මුණ ගැසුනේ නැහැ.

24. ඔන්න එක ගමක හිටියලු කපටි කපුවෙක්, දවසක් එම ගමේම හිටපු පාදයක් අහිමි තරුණයකුට තරුණියක් සොයන ලෙස තරුණයාගේ දෙමාපියන් දන්වා ඇත. පසුව කපුවා තරුණියකගේ පාර්ශවයට තරුණයාගේ වයාරූපයක් පෙන්වා ඒ අය කැමති කරවාගන හොඳ ගානක් කපා ගත්තා. තරුණිය බලන්න යන්න දිනයක් සහ වෙලාවක්

යොදාගෙන තරුණයාගේ පාර්ශවය තරුණියගේ නිවසට ගොස් ඇත, දැන් දෙපාර්ශයම සුහදව කතා බහ අවසානයේදී තරුණයාට පාදයක් අහිමි බව අවබෝධ කරගත්තා. කපුවාගෙන් මේ බව විමසුවිට කපුවා තරුණියගේ පාර්ශවයට කිවේ 'ඇයි මම කලින්ම ඕගොල්ලන්ට කීවේ 'තරුණයා එක පයින්ම කැමති බව' කියාලා එයාගේ කකුල් දෙකට වැඳ වැඳ දුවලා. ගත්තු සල්ලි දෙන්න වෙලා.

25. වාරය එනකන් ඉඳගෙන හිටපු හස්බන්ඩ්ට බිරිඳව මහා රෝහලේ 33 වාටුවේදී හමු උනා. එයා කාන්තා පැත්තේ ඉඳගෙන. ඔයා මොකද මෙහේ කරන්නේ? 'ලෙඩේ මටත් හැදිලා', 'කොහොමද'? 'මගෙන් මොකුත් අහගන්න එපා, ඔයා නිසා තමයි'.

26. පොළොන්නරුව පළාතේ,ගෙදරක කාන්තාව සොර සැමියාට සිග්නල් එක දීලා තියෙන්නේ ඉස්සරහ කාමරේ ජනේලය විවුර්ත කර තියලා; ජනේලය වහලා නම් විවාහක සැමියා ගෙදර ඉන්න බවයි එහි තේරුම.

27. හස්බන්ඩ් ලොකු මුද්දක් තෑගි කළා අපේ ඇනිවසරි එකට ලොකු දියමන්තියක් එහෙම තිබුනා. මම ඒක ගැන අහනකොට 'නෑ වටින්නේ නැහැ, ඕක දියමන්ති නොවෙයි ඉමිටේෂන්.වීදුරු කැල්ලක්' කිවුවා. දවසක් නිකමට වගේ වටිනාකම දැනගන්න රත්තරන් බඩු සාප්පුවකට ගියා. මුද්ද නියම දියමන්ති කියලා, ලක්ෂ 10 ට තක්සේරු කළා.

28.ඔන්න යුවලක් මධුසමය ගත කරන්න ඈත ප්‍රසිද්ධ තානායමකට ගියා. මේක ප්‍රසිද්ධ නිසා තව ජෝඩු කිහිපයක්ම ඇවිත් තිබුනා මධුසමයට. ජෝඩුව කාමරේ ඉන්දිද්දී මනමාලිට ඇහෙනවා අල්ලපු කාමරෙකින් වගේ කව්දෝ වේදනාවෙන් කෙදිරිගානවා වගේ. මනමාලි හොඳටම බයවුනා. 'අනේ මට බයයි ' බයවෙන්නේ මොකටද අනේ මම ඉන්නවනේ කියලා මනමාලයා කිව්වා. ‘ඒක තමා මට බය ඔය ඇහෙන්නේ නැද්ද අල්ලපු කාමරේ මනමාලි කෙදිරිගානවා’. මනමාලයා මේක ටිකක් විපරම් කළා. හොයලා බලනකොට ජනෙල් කවුළුවක ඉඳන් බකමූනෙක් ‘හුම් හුම්’ ගානවා. මනමාලිගේ බය නැති වුනා.

29.එක ගැනියෙක් විවාහ වන දවසේ කරලා තියෙන්නේ ඩිවෝස් එකට ලෑස්ති වෙන එක. මිනිහාගේ ඔක්කොම ඩොකුමන්ට්ස් රෑ තිස්සේ නිදිමරාගෙන ෆොටෝ කොපි කරගෙන.

30.මනමාලිට මඟුල් තුලා බලන්න ගියාම බලන්න ඒ ගෙදර ස්ථිරවම පදිංචි වෙලා ගෙදර ඉන්නේ කවුද කියලා. නැත්නම් මනමාලි අමාරුවේ. මගේ ඥාති අක්කා කෙනෙක් ට නුවරින් පැමිණි යෝජනාවක් ස්ථිර වුනා. මනාලයාගේ පවුලේ 10 දෙනෙක් වුනත් වැඩි විස්තර කතා කිරීමේදී කිව්වේ ඒ හැමෝම තමන්ගේ රැකියාවල්, ගෙවල් දොරවල් ඇතිව ඉන්නවා කියලා. අන්තිමේදී බලනකොට අර මනමාලයාගේ ගේ හදපු අලුත් නිවසේ අවිවාහක අක්කා

ඇතුළු පවුල් තුනක් පදිංචියි. අපේ අක්කාට යන්තම් කාමරේක ඇඳුම් ටික විතරක් තියාගෙන බෝඩිම් කාරී වගේ ඉන්න වුනේ. උදේට බාත් රූම් එකට යන්න පෝලිමේ ඉන්න ඕනලු. විශේෂයෙන් මනමාලයා නුවර පළාතේ නම් තනි භුක්තියට ඉන්න හිටින්න ගෙයක් තිබෙනවා කිව්වාට එකපාරට විශ්වාස කරන්න එපාලු . ඒවායේ පවුලේ පිටින්ලු ඉන්නේ.

31.මම විවාහ වුණේ යෝජනාවකින්. නෝනාගේ නිවුන් සහෝදරයා සහ නෝනාගේ අම්මගේ නංගි අපි කසාද බඳිනකන් වටේ කැරකුන තරමක්. කොටින්ම ආපි සාලේ කථා කරනකොටත් කවුරුහරි ඇතුලේ කාමරේක ඉන්න බව අඟවනවා. බඳිනකම්ම දුන්නා ෆුල් ගාඩ් එකක්.

32. දකුණේ මිනිස්සු විතරක් නෙමෙයි ඔය මැද මහනුවර කට්ටියත් මඟුල් යෝජනා වලදී සත පහකට විශ්වාස කරන්න බැහැ. නංගි පෙන්නලා අක්කා දෙන වැඩමයි කරන්නේ. අපේ මල්ලි මනමාලි බලන්න යනකොට ඒ ගෙදර ලස්සනට මල් වවලා ගෙදරත් බොහොම පිළිවෙලට කැමත් හොඳට, රහට තිබුනා. නැන්දම්මා පම්පෝරි ගැහුවේ මනමාලිගේ වැඩ කියලා. ගෙදරට කැන්දන් ආවට පසුවයි දන්නේ හරියට තේ එකක් හදා ගන්න බැහැ කියලා. බලනකොට අර ගෙදර පිළිවෙලට තියාගෙන ඔක්කොම වැඩ කරන්නේ මනමාලිගේ අයියාගේ නෝනා.

33. ගෙදරින් බල කරන නිසා අකමැත්තෙන් මට එයා එක්ක පෝරුවට නගින්න සිද්ධ වුනා.  ජයටම ගත්ත මගුල ඉවරවෙලා  අපි හනිමූන් ගියේ තලවකැලේ ටී එස්ටේට් හොටලේකට.  රෑ දෙන්නම වොෂ් එකක් දාලා කාමරේට ආවා. හස්බන්ඩ් විස්කි ෂොට් එකක් ගෙන්න ගත්තා.  මම උඩ බැල්කෙනියේ ඉඳලා කථා කරලා කිවුවා ' සුනිල්, ඔයාත් ඇවිදින් මේ කාමරයේ නිදාගන්ඩ' කියලා. සුනිල්, අපේ ඩ්‍රයිවර්, පොඩි කාලේ ඉඳන්ම අපි ළඟ හැදුනේ. හනිමූන් වාහනේ එලෙව්වේ එයා.  අකමැත්තෙන් මිනිහා කාමරේට ආවා.  මම කොට්ටයක් සහ ෂීට් එකක් දීලා කිවුවා 'ඔය කාපට් එක උඩ නිදා ගන්න සුනිල්' කියලා. හස්බන්ඩ් සද්දයක් නැහැ.  පහුවදා උදේ සුනිල් එක්ක මම අපේ ගෙදර ගියා, ඔක්කොටම හරි පුදුමයි.  මම  අම්මාට කිවුවා 'අම්මේ ඕගොල්ලන්ට ඕනා විදියට ඊයේ ජයටම මඟුල ගත්තනේ,  දැන් මට මගේ පාඩුවේ ඉන්න දෙන්න' කියලා.  මාස 3ට පස්සේ ඒ අය මට මගේ මහින්දව විවාහ කර දුන්නා. මම අද ආච්චි කෙනෙක්, මහින්ද දයාබර සියා කෙනෙක්.

34. සුළුදේටත් තරහවෙලා දින ගණන් කතානොකර සිටින සැමියයි බිරිඳයි ජීවත්වූ එකිනෙකා වචනයක්වත් නොදොඩා සිටියාලු.  අවශ්‍ය දේ, අවශ්‍ය වෙලාවට කොළ කෑල්ලක ලියා තබමින් කාලය ගෙවන විට දිනක් ස්වාමියාට උදේ පාන්දරින් ගමනක් යාම සඳහා අවදි වීමට වූ හෙයින් නින්දට පෙර පාන්දර 4 ට මට නැගිටින්න ඕනෑ කියා කොලේක

ලියා ඔහු නින්දට ගියාලු. පාන්දර 4 ට බිරිද නැගිට දැන් වෙලාව 4 යි නැගිටින්න කියා කොලේක ලියා මේසය මත තබා නැවත නින්දට වැටුනාලු.

35. දෙමාපියන්ගේ බලවත් පෙරැත්තයට පරණ පෙම්වතාට පිටුපා විවාහපත්වූ අලුත් මනාලිය, හොරෙක් හොරෙක් කියල මිනිහව එලියට ඇරලා පරණ පෙම්වතාව ඇදට ගත් කතාවක් වැලිමඩ පැත්තෙන් වාර්තා උනා.

36. මගේ යාළුවෙකු බලන්න ගිය මනමාලිගේ වයස මීටරේ කැරකිලා නැති බව පසුවයි දැනගත්තේ. කිව්වාට වැඩිය මනමාලි අවුරුදු 5 ක් වයස වැඩියි. හඳහනුත් අන්තිමට ගැලපෙන විදියට හදාගෙනලු.

37. මම බලන්න ගිය මනමාලිගේ අක්කාට අවුරුදු 4 ක විතර ළමයෙක් හිටියා.ඒ ළමයා අක්කගේලු. කසාදෙට ඔක්කොම කැමතිවෙලා ලෑස්තිවෙලා තියනකොට දවසක් මම එහෙ ගිහින් ඉන්නකොට අර ළමයාගේ උපත් විස්තර තියන ෆයිල් එක මේසය උඩ තිබුනා. මම නිකන් ඇරලා බලනකොට ළමයා හම්බවෙන්න කලින් ගත් රිපෝර්ට් වල තියෙන්නේ මනමාලිගේ නම. හැබැයි උප්පැන්නේ තියෙන්නේ අක්කගේ නම.

38. මම ගාල්ලේ බලන්න ගිය මනමාලිගේ ගෙදර පවුලේ මහ ගෙදර පෙන්නලා ඒක පවුලේ බාලයා වුණ මනමාලිට දැවද්දට දෙනවා කිව්වා. ඔය වෙලාවේ මනමාලිගේ ලොකු

අයියාගේ මූණ ටිකක් අමුතු වෙලා තියනවාත් මට පෙනුනා. මට ඔය දැවැදි ගැන වගතුවක් නැති වුණත් විස්තර කිව්වාට පසු මගේ කිට්ටු මිතුරෙකු යම් කිසි සැකයක් ඔස්සේ විපරම් කළා. බලනකොට ඒ පවුලේ මගුල් 5 ක් කරලා තියෙන්නේ අර ලොකු අයියාගේ නමට තියෙන ගෙදර පෙන්නලාලු.

39. මගේ යාළුවා මට හොරා බැන්දේ මම කැමැත්තෙන් හිටපු කෙනාව, හැබැයි මිනිහා තාම යාලුවා, හැබැයි දුරින්.

40. අපේ අයියා බලන්න ගියා මනමාලියක් මාතර. මනමාලියකගේ ලොකු අක්කා එයාට වැඩිය වයසින් අවුරුදු 20ක් විතර වැඩි අවිවාහක තැනැත්තියක්. පසුව එළි වුනේ මනමාලි කියන්නේ ඒ අක්කා හුඟක් තරුණ වයසේදී ප්‍රේම සම්බන්ධයක් නිසා අවිවාහකව ලැබූ දරුවා. ඒ පවුලේ උදවිය ඒක සැහෙන කාලයක් තිස්සේ වසන් කරලා තියෙන්නේ පවුල පිටින් මුල් ගමේ පදිංචියත් කාලයකට පෙර වෙනස් කරලා.

41. අපේ අයියා කෙනෙක් කන්ද උඩරටින් බැඳපු මනමාලි නම් හරි කම්මැලියි. එයා ගෙදර බාලයා නිසා ඔක්කොම එයාගේ අතට පයට වැඩ කරලා දීලා. දැන් එයාගේ අවිවාහක ලොකු අක්කා තමයි ඉවුම් පිහුම් සහ ළමයා බලාගැනිල්ල ඇතුළු ඔක්කොම ගෙදර වැඩ කරන්නේ. ඒ අතින් මන් ගෙනා මනමාලි ගොඩක් හොඳයි.

42. මගේ යාළුවන් දෙන්නෙක් උඩරට පළාතෙන් බැඳලා ඉගෙනගත්ත පාඩමට පස්සේ මම ඒ පළාතෙන් කටයුත්තක් කරගන්න බොහොම බයයි. ඒගොල්ලන්ගේ ගෙවල් වල ඔක්කොම පාලනය කරන්නේ නෝනාගේ පවුලේ බවලත්තු ටික, පිරිමින්ට කට අරින්නවත් බැරි තත්වයක් තියෙන්නේ.

43. පෙම්වතිය - 'මම ආසයි ඔයත් එක්ක කරදර බෙදා ගන්න'. පෙම්වතා - 'මට කරදර නැනේ'. පෙම්වතිය - 'නෑ, බැන්දට පස්සේ.'

44. හුඟක් වෙලාවට ලේලිලාව නැන්දම්මලට පෙන්නන්න බැරි එක හේතුවක් වෙන්නේ ඉහවහා ගිය කම්මැලිකම. අද ගැහැණු ළමයි බහුතරයක් සාමාන්‍ය තරමටවත් උයන්න පිහන්න දන්නේ නැහැ. ගෙදර අස්පස් කරන්න මහගෙදරින් අම්මලා අක්කලා එනතුරු බලාගෙන ඉන්න වයඹ පළාතේ ගැහැණු ළමයෙක් අපේ කාර්යාලයේ ඉන්නවා. බැරිම තැන දවසකට රුපියල් 750 ගානේ දෙන්න වැඩට ගැනු කෙනෙක්ව හස්බන්ඩ් ගත්තා.

45. අපේ ඇන්ටි දවසක් බාප්පාගේ ඇඳුම් ඔක්කොම පාරට දැම්මා. එදා මාව එයා ඒවා කරනවා දැක්කා. එතෙක් අපි වීරයෙක් වගේ සලකපු බාප්පා ලජාවෙන් ඇඹරුනා. මට ඇඩුම් ආවා. ඒ එම විවාහයේ අවාසාන දවස. තනියම බෝඩිමක ජීවත්වූ බාප්පා කාලයකට පසු මිය ගියා. ඇන්ටි මරුනේ නම් මේ ර්යේ පෙරේදා.

46. දුම් කෝච්චිය වගේ සිගරට් බීපු අංකල් කෙනෙක් ඉස්සරහ ගෙදර හිටියා. අන්තිම උඩඟු මිනිහා, හැබැයි සිගරට් නැති උනාම මම ලේන් එකේ ඇවිදගෙන යනවා දැක්කහම 'සන්' කියලා මට කථා කරලා ගෝල්ඩ් ලීෆ් පැකට් එකක් ගෙන්න ගන්නවා. පහු කාලෙකදී මම ගෙදරින් අයින් වෙලා විශ්ව විද්‍යාලයේ ගියා. නිවාඩුවකට ගෙදර ආපු වෙලාවක අම්මා කිවුවා 'අර ඇන්ටි ඒ අංකල්ව දික්කසාද කළා' කියලා. ඊට වැඩිය මුකුත් කිවේ නැහැ. පස්සේ මම දැනගත්තා ඉතා රූමත්, අන්කල්ට වඩා ගොඩාක් බාල ඒ ඇන්ටි ගෙදර රෙපයාර් කරන්න ආව තරුණ කොන්ත්‍රාත් ඉංජිනේරු සමග යාලු වෙලා, අංකල්ව ගහලා පන්නගෙන තියෙන්නේ. ඒ අංකල් කොළඹ බෝඩිමක තනියම ජීවත්වී, හර්දයාබාදයක් සැදී මිය ගියා. ඇන්ටි තවම ඉන්නවා, හැබැයි දැන් සිංගල්.

47. සුරාව, හා දුම්පානය මෙන්ම රේස් ඔට්ටු ඇල්ලීම, පරදාර සේවනයට තදින් ඇබ්බැහි වූ සැමියා තාවකාලිකව හෝ (ටික කලකට) මහන දිවියකට පත් වෙන්න යයි බිරිදක් විසින් නිතර ඇවිටිලි කිරීමෙන් පසු කෙසේ හෝ පොළඹවා ගත්තේය. ඔහුත් හොඳ චේතනාවෙන් හා කියා කැමති විය. (තාවකාලික) පැවිද්දට පත් වී දින කීපයකින් විතර බිරිද මහා සඟනට දාන පිළිගන්වා සමූහ ඡායා රූප කිහිපයක් ද ගෙන ලඟි ලඟියේ ලිපිලේඛන සමග සමූහ ඡායා රූප කිහිපයද අමුණා දික්කසාදය ඉල්ලා නඩුවක් උසාවිට ඉදිරිපත් කරමින් කියා ඇත්තේ ස්වාමියා තමා හැරදා පැවිදි වී ඇති බැවින් අදාළ තොරතුරු පිළිගන්නා ලෙසය.

48. අපේ බෝඩිමේ ඇන්ටි එක්කෙනෙක්ගේ බත් පිඟානට බිත්තරයක් යට දාල දෙනවා අනික් අයට හොරෙන්. අපි ඇන්ටිගෙන් නොවෙයි යාලුවගෙන් මේක ඇහුවා, මිනිහා මඟ හැරියා. අවුරුදු 2ට පස්සේ යාළුවා පාරේ යනවා වයිෆුයි අතදරුවෙකුයි එක්ක. මට වැඩි වෙලා ගියේ නැහැ අඳුන ගන්න මිනිහා බැඳලා තියෙන්නේ ඇන්ටිගේ දුව. මම බිත්තරේ ගැන ඇහුවේ නැහැ.

49. දියතලාවේ ඉඳන් බදුල්ලට යන බස් එක ලෝකේ අඩුම වේගයෙන් බස් යන බස් පාර වෙන්න ඕන. මේ පාරේ බස් යන්නේ 15km වේගෙන්. බදුල්ලට යන්න පැය 2 වත් යනවා. හැබැයි ඉතින් love කරන කොල්ලන්ට කෙල්ලන්ට කියපු පාර. මොකද ඉතින් බස් එකේ පිටිපස්ස වාඩි උනාම අඩු මුදලකට වැඩිම කාලයක් එකට ගත කරන්න පුළුවන් හින්ද.

50. වයිෆ් කතා කලාම දුරකථනයට පණ කඩාගෙන දුවගෙන යන මහත්තුරු ඉන්නවා. නමුත් සමහර වයිෆ්ලා එයාලාට එයාලගේ මහත්තයා දෙන කෝල්ස් ගණන් ගන්නෙවත් නැහැ කොහොම කිව්වත් නෝනා තමයි අන්තිමට දිනන්නේ.

51. අපේ කාමරයේ දොර අපි උදේ රැකියාවට යනවිට වසා දමා යාම ගැන නැන්දම්මා කැමති නැහැ. පස්සේ බලනකොට ගියාට පස්සේ එයා මගේ ඔක්කොම ලිපි ගොනු කියවනවා,

වය්ෆ් වත් නොකරපු වැඩක්. සමහර මගේ ඩොකුයුමන්ට් ෆොටෝ කොපි කරලා.

52. ගැහැණියකුට එක බැල්මෙන් පිරිමියෙක්ව වසඟයට ගන්න පුළුවන් කියනවා. ඒ වගේම තමයි පිරිමි; සල්ලි, සමාජ තත්වය ආදී දේවල් යොදා ගෙන ඒවා කරනවා.

53. නැන්දම්මා මගේ බාල නෑනාට කියනවා එයාට එන හොඳ විවාහ යෝජනා යෝජිත මනමාලයෝ එක්ක සාලේ නැතිව ඇතුලේ වහලා තියෙන කාමරයකට ගිහින් පිළිසඳරේ යෙදෙන්න කියලා. මාවත් අල්ලාගත්තේ එහෙමයි, මට දැන් පෙන්නන්න බැහැ ඒ කාමරේ.

54. අපේ අයියා කෙනෙකුට විවාහ වෙන්න ලොකු හදිස්සියක් තිබුනා. අම්ම කිවුවා ඉන්න වෙසක් මාසේ බඳින්න මොකද හදිස්සිය, ලොකුවට ගම්මු කියලා. අයියා කිවුවා නෑ ලබන මාසේම රෙජිස්ටර් කරන්න ඕන, කමලාට (එයාගේ පෙම්වතිය) හදිස්සියි කියලා. ඉතින් අගෝස්තු වල බැන්දා. අක්කාට ජනවාරි වලදී ළමයෙක් ලැබුනා.

55. අපේ පොඩි අයියාට දැන් හැට පැනලා, ඒත් අම්මට නම් එයා බබා. ඔය දෙන්නගේ මඟුල කඩන්නේ අම්මායි කියලා දවසක් මම මූණටම කිවුවා.

56. අපේ ප්‍රදේශයේ 13 හැවිරිදි බාල දැරියක් රවටාගත්තා පිට ගමකින් රැකියාවකට පැමිණි 26 හැවිරිදි විවාහක තරුණයෙක්. දැරියගේ මව්පියන් පොලිසියට පැමිණිලි කළා. පොලිසියේදී තරුණයාගේ අම්මා කියලා තියෙන්නේ 'මගේ අහිංසක කොල්ලාව මේ සක්කරවට්ටම රවටා ගත්තා' කියලා.

57. ගාලු පාර අයිනේ ඉඩමක මම පොල් ලෙලි තලමින් සිටින අතර පාරේ යන කළු, ලස්සන, බ්‍රීෆ් කේස් එකක් අතැති, විධායක නිලධාරි තරුණ මහතෙක් කොළඹට යන බස් එක ගැන විස්තර ඇහුවා. එදා විස්තර කථා කරලා දැන හඳුනාගත්තා. මම මගේ දුව ගැනත් කිවා. දිගු කතාවක් කෙටියෙන් කරනවානම්, එතුමා මගේ දුව බැඳලා අද දෙන්නම ඉන්නේ ඕස්ත්‍රේලියාවේ ඩාර්වින් නගරයේ. ලස්සන මුනුපුරෙකුගේ සහ මිනිපිරියකගේ ආච්චි කෙනෙක් මං. අහංගම ඉඩම්වල කුලියට පොල් ලෙලි තලපු මම දැනට 6 වතාවක් ඕස්ත්‍රේලියාවට ගිහින් ඇවිත් තියෙනවා. බැනා කිවුවා සිටිසන්ෂිප් හදලා දෙනවා කියලා.

58. ඉස්සර කාලේ හිටියා ගම් මුලාදැනියෙක් පුරුෂයා නැති වෙලාවට එයාගෙම වැයික්කියේ ගෙදරකට යන්න පුරුදු වෙලා සිටියා ලු. දවසක් එහෙම ඉන්න කොට හදිසියේම ගෙදර පුරුෂයා එනවා දුර තියා දැක්ක බිරිඳ ගම් මුලදැනියාව ඇඳ යටට රිංගවලා හිටියාලු . පුරුෂයා කොහොම හරි මේක දැකලා ඇඳ යටට එබිලා 'මොකද රාලහාමි ඇඳ යට'?

කියලා ඇහුවලු. එතකොට මුලාදනිය කිව්වලු හහ්! මගේ වැයික්කියේ ඕන තැනක මට ඉන්න පුළුවන්’ කිව්වලු.

59. අයෙක් තම බිරිඳත් සමග මෝටර් බයිසිකලයෙන් නගරයට ගියා. බිරිඳ ගෙදරට අවශ්‍ය බඩු ගනිද්දී සැමියා ගියා පොඩි ෂොට් එකක් දා ගන්න. එතැනදී යාලුවෙක් හමුවුනා. යාළුවා කිව්වා ‘මම මේ ඕගොල්ලන්ගේ ගෙදර යන ගමන් ඔයාට බෝතලයක් ගන්න ආවේ’ කියලා. මේ සතුටට හා හරි හරි එහෙනම් යමු කියල යාලුවත් දාගෙන ගෙදර ගියා. ගෙදර ගිහින් දෙන්න එක්ක බෝතලේ බාගයක් විතර ඉවර කරන කොට බිරිඳ ත්‍රී රෝද රථයක ගෙදර ආවා. ඇවිත් කියපුවා හිතා ගන්න පුළුවන්නේ.

60. මහත්තයාගේ නංගිලා ගෙවල් පැත්තේ එනවා නම් කනේ තිබෙන කරාබුවේ ඉඳල හංගන්න ඕන. කලකට ඉහත මගේ මහත්තයාගේ නංගි මගේ රත්‍රන් වළලු ආපසු දෙන පොරොන්දුව පිට උත්සවයකට ඉල්ලාගෙන අද වෙනකන් ආපසු දුන්නේ නැහැ. ඔය ‘නංගිලා’ කියන වර්ගයේ නෑදෑයන් ඕනොමමයි.

61. නෑදෑකම් තියා ගන්න නම් බැන්දට පස්සේ දෙපාර්ශවයේම නෑදෑයන් සමග ගණනට ආශ්‍රය කරන්න ඕන.

62. විවාහ වුණාට පසුව දෙපැත්තේම නෑදෑයන්ගෙන් KM 10ක් වත් දුරින් වාසය කිරීම හැම අතින්ම ගුණයි.

63.ගෙදර ආවහම, ගෙදර බත් මුට්ටියටත් එබිලා බලන නැදැයින් ඉන්නවා.

64.කලකට ඉහත මම හදිසියකට උගස්කළ මගේ රත්තරන් මාලය මගේ බාල නැගණිය හොරෙන් බේරාගෙන යනකොට මගේ අතටම අහුවුණා. ළඟම තිබෙන පොලිසියට යනවා කිවුවාහමයි මට බේරලා දුන්නේ.

65.නෑනා බලන්න මනමාලයෝ එනවා ඉවරයක් නැහැ. නෝනාගේ අම්මා දොර රෙදි විතරක් නෙමෙයි වහපු කාමරේටත් කණ තියාගෙන අහගෙන ඉන්නවා. ඒක පුරුද්දකට ගිහිල්ලා.

66. අපේ ගෙදර දරුවෝ තුන්දෙනා සහ ඔක්කම පස් දෙනෙකුගේ රෙදි හේදිල්ල රැකියාවට යන ගමන් මට දවස ගානේ කරන්න අමාරු නිසා මම මහත්තයට කිව්වා ගෙවන ක්‍රමයට හරි රෙදි සෝදන යන්ත්‍රයක් ගනිමු කියලා. සුපුරුදු පරිදි 'අපෝ බැහැ කරන්ට් යනවා', ඒ මදිවට ''සල්ලිත් නැහැ' කිව්වා. ඊට පස්සේ එක දවසක් රෙදි සෝදන්න කලින් සාක්කු වල හේදිලා යන්න දේවල් බැරි වෙලා තියේද කියල බලනකොට බිලක් අහු වුනා. එයාගේ නංගිට අළුත් වොෂින් මැෂින් එකක් අරන් දීලා. මම මොනවත් අහන්න ගියේ නැහැ.

67. හස්බන්ඩ් ගේ බාලම නංගිගේ අලුතින් ගෙට ගෙවදින උත්සවයට ගියා පන්නිපිටියේ. අලුත්ම රෙදි සෝදන

යන්ත්‍රය පෙන්නලා එයා ආඩම්බරයෙන් කියනව ‘අනේ අක්කේ මේකට සෑහෙන ගානක් ගියා, ඒත් ඉතින් හරි පහසුයි අක්කටත් තියෙන්නේ එකක් ගන්න කියල’. දෙවියනේ මේ අපේ ගෙදර මේ මනුස්සයා ගෙනත් දාලා තිබුණු, අළුත්ම සීල් කඩලාත් නොතිබුණු රෙදි සෝදන යන්ත්‍රයනේ. මම ඉතින් පවුලේ සමගිය තකා සද්ද නැතිව හිටියා.

68. සමහර පවුල්වල අක්කයි නංගියි දෙන්නම අය්යා එක්ක එක වහලේ යට දීග කන අවස්ථා අපේ සිංහල සාම්ප්‍රදායික ජන සමාජයේ තිබුනා. ඒ වගේම එක ගෙදර අය්යලා මල්ලිලා පිරිසකට එකම එක මනාලියක් කැන්දාගෙන ඇවිල්ලා (එක ගෙයි කෑම) සිරිතකුත් ඉස්සර සාම්ප්‍රදායික සිංහල ජන සමාජය තුළ, විශේෂයෙන්ම උඩරට සමාජය තුළ, තිබ්බා. මේවා දැන් සදාචාරාත්මක නැති බව ඇත්ත, නමුත් මේ තත්ත්වයන් එදා පැවතී සමාජ ව්‍යුවහය, වාතාවරණය තුලින් බැලීම වැදගත්; එතකොට තේරුම් ගන්න පුළුවන්.

69. මගේ නංගි හරි, වාම්, නිහතමානි, පිනට බර ඉතාම ඉහලින්ම උගත් තැනැත්තියක්. ‘පොෂ් මදි’, ‘සෝෂල් මදි’ කියා එන හැම යෝජනාවක් වගේම ප්‍රතික්ෂේප වෙනවා. නංගි ගොඩේ කියලත් එක්කෙනෙක් කපු අම්මාට කියලා තිබුනා. ඒ කපු අම්මා කිවුවා ‘මහත්තයෝ, හරි දුකයි, මේ සමාජය පිරිහිලා ඉවරයි. කොටට අඳින්නේ නැති , මේකප්

තලි පිටින් තවරන්නේ නැති, කෙල්ලෝ දැන් මාකට් වෙනවා අඩුයි. පහුගිය දවස්වල හතු පිපෙන්නා වගේ බිහිවුණු රූපලාවන්‍යාගාරත් ඒවාට අනුබල දිපු බලධාරිනුත් යම්තරමින්හෝ මේවට වග කියන්න ඕන'කියලා.

70. ආදරයෙන් කල් ගෙවන වියපත් අඹු සැමි යුවලක් හිටියා. පොඩි පොඩි ආරවුල් ඇති වෙන්නේ නැති ගෙවල් නැනේ, මේ දෙන්නා අතරත් එහෙමයි.

71. කසාඳ බඳින්න කලින් පුවත්පත්වල මංගල දැන්වීම් වලයි, කපු මහත්වරු ගේන මංගල යෝජනා වලදීයි මනාල මහත්වරු සියලු දෙනාම වාගේ අහිංසක, සීදේවී, සුරා සූදුවෙන් තොර, හතර පෝයට සිල් ගන්න උපාසක මහත්වරු. කසාද බැන්දට පසුව එක මාසෙන් දෙකෙන් බොහෝ අය බේබද්දෝ, සුරා සොඬුන්, සල්ලාලයෝ, සූදු අන්තයෝ බව පේනවා. ඇහුවහම කියන්නේ මනමාලියගේ වරද නිසා කවදාවත් ඒ දේවල් නොකළ පුතා දැන් ඒ දේ කරනවා කියාලා.

72. කෝච්චියේ මා ඉදිරියේ වාඩිවී සිටි තරුණ/මැදිවියේ පෙනුමැති මහත්තයාට ටෙලිෆෝන් කෝල් එකක් අවා, වයිෆ්ගෙන්. 'හරි හරි මම බෞද්ධ කොඩියක් ගන්නම් පිටකොටුවෙන්; ඔව්, ඔවු පුතාගේ කූඩු අලවන්න සව් කඩදාසිත් ගන්නවා, එයාටත් කියන්න. පන්සල් යන්න වෙන්නෙ හෙට හවස, උදේ නෙවෙයි' කියා ඔහු කෝල් එක

ඔෆ් කළා. එසේ කථා කරද්දී ඔහුගේ අත අල්ලාගෙන තරුණ 'පෙම්වතියක්' ඔහුට තුරල් වී වගේ සිටි බවත්, කෝල් එක විසන්ධි කල පසු ඔහු ඇය වෙතට තවත් නැඹුරු වූ බවත් විවාහක බිරිඳ නොදන්නවා වෙන්න ඇති.

# • නැට්ටුක්කාරියෝ

73. අද කාලයේ කවුරුහරි පිරිමි කෙනෙකුගේ ඇඟට හේත්තු වෙන්න හැම තිස්සෙම මාන බලාගෙන ඉන්න එක්තරා කාන්තා කොට්ඨාශයක් ඉන්නවා. කලකට පෙර හිතවතෙකුගේ ගෙට ගෙවදීමක් මැල්සිරිපුර තිබුනා. අපි එහි ගිය දවසේ අඟර දඟර දමාගෙන අප වෙත පැමිණි එක්තරා තරුණ 'නාලිකා කාරිනියක්' වාහන ණයක් සමබන්ධයෙන් කතා කරන්න කියලා. මගේ සැමියාගේ ජංගම දූරකථනය අංකය ඉල්ලුවා. ඔහු කාර්යාල අංකය දුන්නා. කොහොමහරි එතනින් සැමියාගේ ජංගම දූරකථනය සොයාගත් මේ කාන්තාව දිගට හරහට බොරුවට වාහන ණය ගැන කතාකරමින් මහා රැට පවා කතාකරන්න ගත්තා. 'ඔයා කැමති 'කැන්ඩියන්ද', 'ඉන්දියන්ද' කියලා අහලා තියෙනවා. අපේ මෝඩයාත් කැන්ඩියන් කියලා. අන්තිමට මම මැදිහත් වෙලා ඉතා තදින් කථාකර රාජකාරි මට්ටමෙන් කාර්යාලයේදී පමණක් තමන් අමතන ලෙස කියපු පසුවයි සෙල්ලම නැවැත්තුවේ. හැබැයි ඒ කෙනා ඉන් නැවතුනේ නැහැ. මගේ සැමියා නොනාව දාලා ඉතාම තදින්

ගනුදෙනුකාරයන්ට කතාකරනවා කියල ඉහළට පැමිණිලි කළා.

74. මගේ දූගේ ඩාන්සින් ක්ලාස් එකටවත් මම නම් එයාගේ තාත්තව යවන්නේ නැහැ තනියම. තරුණ තාත්තාලාට හුරතල් වෙන්න දඟලන අය වැඩි වැහැලා.

75. ඉස්සර කාලයේ බිරිඳ හෝ පෙම්වතිය ළඟ නැතිකොට විතරක් පිරිමින්ගේ ඇඟේ හැපෙන්න ආ මේ ලැජ්ජා නැති බවලතුන් ඊයේ පෙරේදා සිට නෝනලා ඉස්සරහා පිරිමින්ට උකුළු මුකුළු කරන රැල්ලක් ඇතිවෙලා. මගේ මිතුරියකට ඔය ටික වෙලා. එයා නිකන් ඉඳලා නැහැ. වයින් වීදුරුවක් අරගෙන වැරදීමකින් වගේ අර විලිලැජ්ජා නැති බවලතිගේ යන්තම් විලිවැසුන ඇඳුම තෙමෙන්න හලලා හැමෝටම ඇහෙන්න අනේ සොරි අනේ කියලා. මනමාලකම එතැනින්ම නතර උනා.

76. තරුණ වෙන්න ඕනෑ නැහැ, මැදිවියේ ඉන්න අපේ මහත්තයාටත් ඇහැගහපු නැට්ටුක්කාර අවුරුදු **20** ක බෝඩිම්කාරියෙක් අල්ලපු ගෙදර හිටියා. හොඳ වෙලාවට ඒ ගෙදර තරුණ පුතාටත් කෝකම් පාන්න ඇවිල්ලා අහුවෙලා ඒ නෝනා එයාව ගෙදරින් එළියට දැම්මා.

77. මම වැඩ කරපු කන්තෝරුවක හිටපු ටිකක් නැට්ටුක්කාර කාන්තාවක් ශිෂත්වයකට විදේශ ගතවෙන්න කටුනායක ගියහම රුපියල් අසූ අටදාහක් වැඩිපුර ගෙව්වලු. ඊට පස්සේ

කන්තෝරුවේ කට්ටිය කියන්න පටන් ගත්ත ඒ වැඩිපුර ගෙවිවේ වන්ගෙඩියටයි, මෝල් ගහටයි කියලා.

78. මගේ ඥාති පුතා රියැලිටි තරඟයකට ගිහින් මඟ වරද්දා ගත් කපටි මේක් ආපු දාපු තරුණියකට රැවටුනා. මව්පිය විරෝධය මැද බැන්දා. අන්න දැන් ඒ පුතාට වැඩිය සල්ලිකාරයෙක් සොයාගෙන ඒ කපටි කාන්තාව පැනලා ගිහින්. වහ බොන්න ගිය අපේ එකාව අපි හරිම අමාරුවෙන් බේරාගත්තේ.

79. තමන්ගේ මහත්තයා ගැන විශ්වාසයෙන් ඉන්න එක හුඟක් වැදගත්. ඒ මොකද මේ කෛරාටික ගැහැණු කොට්ඨාශය මුලින්ම කරන්නේ අඹු සැමියන් අතර විශ්වාසය පලුදු කිරීම. ඒක තමයි පළමු පියවර. ඉතින් ගෙදර නෝනා අනිවාර්තයේ තමන්ව සැකකරමින් රණ්ඩු කරනකොට සැමියාට නිකම්ම එයාව එපාවෙනවා. එතකොට අර 'තේ උඩ්ච්චිය' කරන්නේ අනේ ඔයාව ඇයි අනේ ඔහොම නෝනා සැකකරන්නේ' කියාගෙන යාලුවෙක් වගේ දුක සැප විමසන්න පටන් ගන්නවා. අපේ නෝනලා බොහොම ප්‍රවේශම් වෙන්න ඕනෑ. ඉවසීම තිබීම සහ නිකරුනේ සැමියාව සැක නොකිරීම හරිම වැදගත්.

80. ඉහල යාමට ඇති අසීමිත ආශාවන් නිසා දැන දැනම විවාහකයෙකුගේ වුණත් වාහනයට නැගලා සවාරි යන්න සූදානම් තරුණියන් ඉන්නවා. පිරිමියාගෙන් පුළුවන්තරම්

සල්ලි කඩාගන්නවා. හැබැයි වැඩ වැරදුනොත් හැමෝම බනින්නේ අර පිරිමියාට.

81. අද කාලයේ සමහර සටකපටි තරුණියන් පිරිමියා තමා වෙත බැඳ තබාගන්න සම්බන්ධය දුර දිග ගෙනියන්න, ඔහුව පොළඹවනවා. නොයෙක් සට කපට වැඩ කරනවා. හැබැයි වැඩ වැරදුනොත් බොහෝ දුරට හැමෝම බනින්නේ පිරිමියාට.

82. අද කාලේ සමහර කාන්තාවන්ට විශේෂයෙන්ම තරුණියන්ට එක පෙම්වතෙක් නෙවේ කීප දෙනෙක් ඉන්නවා - ෂොපින් යන්න එක පෙම්වතෙකුත්, යාලුවන්ගේ ගෙවල් යන්න පෙම්වතෙක්, විනෝද ගමන් යන්න තව පෙම්වතෙකුත්, බිල් ගෙවන්න පෙම්වතෙකුත් ආදී වශයෙන්. ඒ අය ඒක සලකන්නේ ලොකු ජයග්‍රහණයක් හැටියට.

83. දවසක් 'සිනමා බෝය්ෆ්‍රෙන්ඩ්' එක්ක චිත්‍රපට ශාලාවේ බොක්ස් එකක් ඇතුලේ ඉන්න කොට 'හිල්ටන් බෝය්ෆ්‍රෙන්ඩ්ව' හම්බවෙලා එක ජංජාලයයි. ආයි දවසක් ට්‍රිප් බෝය් ෆ්‍රෙන්ඩ් එක්ක කතරගම ගිහිල්ලා ඊට පස්සේ අලි බලන්න යාල යනකොට ෂොපින් බෝය් ෆ්‍රෙන්ඩ්ව එහෙ සෆාරි ජීප් එකක හම්බවෙලා.

84. සමහර තරුණ නැට්ටුක්කාරියන් ජීවත්වෙන්නෙම විවාහක පිරිමින්ගේ පොකට්ටුවේ පිහිටෙන්. බහුතරයක් උත්සාහ කරන්නේ නෝනලා දරුවන්ගේ කටයුතු වලට හිරවුණ, මැදිවියේ විවාහක පිරිමින්ව දැලේ දාගන්න. එම නිසා විවාහක කාන්තාවන් තමන්ගේ විවාහක යුතුකම් අතර සැමියාට අවධානය සැළකිල්ල දැක්වීමත් කරන්න ඕනෑ.

85. එක්තරා නැට්ටුක්කාරියන් විශේෂයක් ඉන්නවා (ධනවත්) මිනිසුන් ආශ්‍රය කරන්නේ ඒ අයගෙන් කොහොමහරි ළමයෙක් හදා ගන්න. ළමයා පිළිසිඳ ගත්  පසු මේ අය අන්තර්ධාන වෙනවා. මේ ගොල්ලන්ගෙන් සමහරෙක් ළමයා හම්බඋනාට ආයි මතුවෙනවා - උසාවියක් තුලින්; ඒ ළමයාගේ පියාගෙන් නඩත්තු ඉල්ලලා.

86.'ෂුගර් ඩැඩි' යන ආදර නමින් හඳුන්වන ධනවත් සියාලා හොයාගෙන යන තවත් නැට්ටුක්කාරියෝ විශේෂයක් ඉන්නවා.  සියාලාව නැත්තටම නැති කරලයි ඒ අය නම් යන්නේ.

87. කොළඹ 7 වැදගත් ඉස්කෝලයක පාසැල අරුණු පසු දූවව ගැනීමට ඉතා මිල අධික වාහනයකින් එන එක් මැදිවියේ සමාගම් අධ්‍යක්ෂක වරයෙක්ව බිලි බා ගන්න නැට්ටුක්කාර අම්මන්ඩිලා 3දෙනෙක් වලි කාලා තියෙනවා.

88. ගොඩාක් සල්ලි තිබෙන වයසක පිරිමියෙකුගේ ඇඟේ එල්ලෙන්න බලාපු  20 ගණන්වල කෙනෙක් හිටියා.

**ඇන්ටිට අහුවෙලා දිගට තිබ්බ හොඳ කොන්ඩේ කොටට කපාගෙන ආපසු ගෙදර ගියා.**

# • රස ආහාර පාන

89. හොඳම කෑම තමයි අල තෙල් දාලා, පරිප්පු, සැමන් ගොඩාක් ලියලපු බොම්බයි ළූණුයි තක්කාලියි එක්ක; එක දවසක් කාලා බලන්න.

90. අම්මා හදන කැවුම් මිශ්‍රණය අමුවෙන් කන තරම් රසක් කැවුම් බැඳපුවහම නැහැ.

91. පිනි ජම්බු, වෙරළු ගිනියම් පළතුරු නිසා අපේ ආතා අපට වැඩිය කන්න දුන්නේ නැහැ. අරළු බුළු නෙල්ලි තමා දුන්නේ, හොඳට විරේක වෙනවා.

92. දවසක් දඹදෙනියේ නයිට් කඩයකින් කොත්තු දෙකක් අරන්ගියා ..රාත්‍රී ගමන් විඩාවට නිවසට ගිහින් කෑම පිළියෙළ කිරීමට අපහසු නිසා. රාත්‍රියේ ඒ කෑම එක කන්න හැමෝම පිඟන් අරන් ලෑස්ති වෙලා බලද්දී .මගේ පාර්සලේ සම්පූර්ණ කැරපොත්තෙක්. රෝස්ට්වෙලා බඩගින්නේ හිටිය අය අනේ ඕකගේ ඇටකටු හැපෙන්නේ නැහැ කියල කැරපොත්තව විසික්කරලා කොත්තු දෙකම කෑවා..මම විතරයි එදා බඩගින්නේ හිටියේ. කඩේ හොඳ වෙලාවට ලඟක නොතිබුනේ නැතිනම් මම ගිහින් ඒ අයගේ ඔලුවේ හලන්නේ කැරපොතු කොත්තු.

93. මම අහල තියනවා කනකොට බත් පතේ කෙස් ගහක් තිබිලා අහුවුනොත් ගෙදර ගෘහණියට කියනවලු අද ඔයාට කොහෙන් හරි සල්ලි හම්බුවෙයි කියලා

94.80 දශකයේ පාර්ලිමේන්තුවේ වැඩ කරන කාලේ විධායක ශ්‍රේණියේ අපිට වෙනම කන්න දානවා බුෆේ. කියලා වැඩක් නැහැ, වයිනිසි, ශ්‍රී ලන්කන්, සි ෆුඩ්, කෝල්ඩ් මීට්, හැම්, බේකන්, චීස්, ඇපල්, මුද්දරප්පලම්. ඒත් සමහර දවස්වලට මම ගිහිල්ලා ක්ලාක්/පියන් මහත්වරුන්ගේ කැන්ටින් එකෙන් කනවා ඒ අයත් සමඟ ඉඳගෙන. ඒවාත් රසයි, හැබැයි අපේ තරම් නැහැ.

95. කතුරු මුරුංගායි තෙබු කොළයි එකට මලවලා බලන්න, නියමයි.

96. මම ගිය මගුල් ගෙදරක පලතුරු බීම එකේ දිග කෙස් රොත්තක් තිබුනා. ඒක ගෙදරක තිබුන උත්සවක් නිසා කවුරු හරි බවලතෙක් පිලියල කළ පානයක් වෙන්න ඇති. මමත් හෙමිහිට වීදුරුව පැත්තකින් ගෙනිහින් තිබ්බා මිසක් ඒ ගැන කියන්න ගියේ නැහැ. සමහරවිට දවසේ කුලියට උයන්න ආපු දුප්පත් කාන්තාවකගේ අතපසු වීමක් කියල හිතුන නිසා.

97.මත්පැන් පානයට නම් මම ප්‍රතිපත්තිමය වශයෙන් විරුද්ධයි, මොකද මිනිස්සු සීමාවක් නැතිව බිලා නොමිනිස්සු වෙනවා.

ඒ වගේමයි මත්පැන් වලට ඇබ්බැහි වීම. ඉඳලා හිටලා 'සෝෂල් ඩ්‍රින්ක්' එකකට බියර් එකක්, හොඳ රා කට්ටක් ගත්තට වරදක් නැහැ, තමන්ගේ ලිමිට් එක දැනගෙන.

98. මම හරිම ආසයි ඉදි ආප්ප කන්න. මට ඒ නම ඇහෙනකොටත් ඉන්න බැහැ. වෙන මොනවා නැතත් ඉදිආප්ප තියෙනවා නම් මට ඒ ඇති. මම නිතරම මගේ නෝනටත් කියන්නේ මට ඉවසන්න බැරි ආසාවක් තියෙනවා ඉදිආප්ප කන්න කියලා. මම හැම මාසෙකම පඩි ගත්ත දාට හෝටලයකට ගිහින් බඩ පිරෙන්න ඉදිආප්ප කනවා

99. හැමෝම මේසෙට ගන්න වැඩක් - කහබිලියා වැඩියෙන් ලියලා හොදට පොල් ටිකක් ගාල දාලා රසට මලවලා, ගල් බාගයක් එක්ක එන්න කියන්න.

100. නියම නෙළුම් කොළයේ කැමට නම් හීනටි හාලේ බත, කිරි හොද්ද, කොස් ඇට බැදුමක්, කරවල කැල්ල, පලාකොළ තියෙන්නම ඕන.

101. කටු ඇන ගෙන වුනත් දූරියන් කන්න ලැබුනොත් මම අත් අරින්නේ නැහැ.

102. ගලේ අඹරලා හැදූ පොල් සම්බෝලෙකුයි, මිරිසට හදපු අල හොද්දකුයි තියෙනවා නම් ඉදි ආප්ප **50** ක් **60** ක්

නිකම්ම කන්න පුලුවන් මට. මගේ ඉදි ආප්ප ආසාව නැති වෙන්නේ මම නැති වුණදාට තමයි ඉතින්.

103. මම පොල් හොයනවා. සම්බෝලෙකට ලුණු ඇඹුල්, සුදු ලූනු, රතුළූණු, උම්බලකඩ, මිරිස්, ගම්මිරිස් දාල පොල්ටික පදම් කරමුකෝ. ඊට පස්සේ පාන් කැල්ලක් ගිලල දානවා කට්ටිය එක්ක එකතුවෙලා. පුළුවන්නම් පරිප්පු, අල බැදුමක් හදා ගන්නවා. පස්සේ බොන කහට කෝප්පේ නම් පංකාදුයි.

104. හොදට කට සැරට කාලා දැවිල්ල පිටම ඉඟුරු තේ එකක් බොන්න ඕනෑ. එවිට තමයි තේ එකේ රස වැඩියෙන් කටට දැනෙන්නේ.

105. කිතුල් රා සමඟ මඤ්ඤොක්කා, දවල්ට නියමයි.

106. නිවාඩු දවසක වැව් මාලු, කොච්චි සම්බල්, මඤ්ඤොක්කා එක්ක හොඳම යාළුවා එක්ක ගඟ අද්දර ඉඳගෙන රා ටිකක් බොනවා. ඊට වඩා සතුටක් තවත් තියෙනවද!

107. කහබිලියා කොළ අමුවෙන් කන්න එපා; වමනේ එන්න ගත්තොත් පොල් කිරි පොවන්න.

108. ඉස්කෝලේ බාලදක්ෂ කරන කාලේ කැකිරාව පැත්තේ කැලේක දවස් 4ක් කඳවරු ගහගෙන හිටියා. දිවුල්, පලු, වීර, ගල්සියඹලා වැනි රසවත් පලතුරු ගස් වලින්ම, නැගලා, කඩාගෙන කෑවා.

109. ඉඳල හිටලා ගෙදර එන යාලුවෙක් ඉන්නවා. එන්න ඉස්සෙල්ලම මිනිහ මගේ බිරිඳට කෝල් කරලා කියන්නේ කැකුළු හාලේ බතුයි, හාල්මැස්සොයි (මිරිසට උයලා), පරිප්පුයි, පොල් සම්බලුයි ඕනා කියලා. මිනිහගේ ඔය 'මෙනියු' එක කවදාවත් වෙනස් වෙන්නේ නැහැ.

110. කහට කෝප්පයක් කිතුල් හකුරු කෑල්ලක් එක්ක බිවුවහම පාළුව කොහෙන් බැහැල යනවද දන්නේ නැහැ

111. මඩු පල්ලි ගිහිල්ලා තල් ගහේ ලපටි බඩ (කොට්ටකිලන්ගු), එවෙලේම ගහෙන් කපූ මී පැණි එක්ක කන්න එක දෙමළ මිනිහෙක් දුන්නා. නියම මී පැණි කෑවේ එදා.

112. ඒ දෙමල මිනිහම කියනවා 'මාතියා අලුතින් මරපු වල් ඌරු මස්, මුව මස්, ගෝන මස් තියෙනවා, ඕනද කියලා. එපා කිවා.

113. ඔටු කිරි බීලා රටඉදිත් කෑවත් මටනම් අරාබි රටවල කෑම අල්ලන්නේ නැහැ.

114. ලංකාවේ කොහිල හොද්දට ඔය ඔක්කොම රට කෑම පරාදයි.

115. උදේට උණු ආප්ප මේසයක් දැක්කොත් මගේ කටට කෙල පෙරන එක නවත්වන්න බැහැ.

116. කිරිබත් කොච්චර රස උනත් අපේ ගෙදර කිරිබත් හදන්නේ විශේෂ සුභ දවසකට පමණයි. කොච්චර කිව්වත් අම්මගේ ප්‍රතිපත්තිය වෙනස් වෙන්නේ නැහැ.

117. කැකුළු හාලේ කිරිබත් මාමයිට් එක්ක කාලා බලන්න හරි රහයි.

118. පොල් සම්බෝලෙකට තව එලවලුවකුත් එකතු කරගෙන බත් ටිකක් කෑවා නම් ආයි මස් මාළු ඕන නැහැ.

119. පාන්දර නැගිටලා රණවරා කෝප්පයක් උණු උණුවේ බීලා හකුරු කෑල්ලක් හප හපා මිදුලට ආවා කාලේ අද මේ සීතල විදෙස් රටේ ඉඳගෙන මතක් වෙනවා.

120. තම්බපු කොසුයි පොලුයි දාගත්තමා වෙන මොනවත් ඕනේ නැහැ.

121. ‘කොස් විකුනන්නේ කොහොමද?මැනලාද? කිරලාද? කොස් විකුණන්නේ කපලා පළු වලින්’.

122. අපේ ගෙදරට ඇත පළාතකින් ආවා හැම ඉරිදටම අන්කල් කෙනෙක් ෆනැන්ඩෝ කියලා . ඔහු වැඩියෙන්ම කැමති රොස්ට් කරපු කොස් ඇට වලට

123. වරායේ කෑම එක කියනවනේ හොඳම කෑම එක

124. තාත්තා ඉරිදට ට්‍රිපොලි මාකට් ගිහිල්ලා 'මුළු මාකට් එකම' ගෙදර ගෙනවා. ඉරිදා දවල්ට පිඟනේ මදි තියන්න තියෙන කෑම ජාති බෙදා ගන්න.

125. කාලයක් තිබුනා හැමදාම ගෙදර ඉරිදා දවල්ට තනිකරම සී ෆුඩ් ජාති හදනවා. මගේ ප්‍රියතම කෑම මුරුංග කොළ දාපු කකුළුවෝ හොද්ද.

126. මාළු පාට්ස් කියලා ලොකු මාළුන්ගේ බඩ ඇතුලේ තියෙන කොටස් ඉතා ගුණයි ලු, විටමින් වැඩි හින්දා.

127. අද ගොඩක් ගමේ කඩේ කියලා කියන තැන්වල, දේශීය බුෆේ තැන්වල මැටි වලන් ඇරලා බලපුවහම තියෙන්නේ රතු හාලේ බතට පැහෙන ගෝවා, බීට් රූට්, ලීක්ස්, කැරට්, කුකුළු මස්, පපඩම්, කට්ට සම්බෝල, පරිප්පු සහ වට්ටිනි. මේවා බටහිර කෑමට වැඩිය කොපමණ රසද. මිරිස්, තුන පහ වගේ ජාති හින්දා අපේ කෑම රහයි.

128. මුන්නේසරම් ගිහිල්ලා තල් කොලේ දැවටු කිතුල් හකුරු මගේ දරුවන්ට අරං දෙනවා.

129. ළාවට රොස් කරපු මුන් කිරිබත් කාලා තියෙනවද, නියමයි.

130. කැකුළු හාලේ බතුයි, කොච්චි මිරිස් දමලා හදන පොල් සම්බෝලයි තියෙනවනම් මට වෙන මොනවත් ඕනේ නැහැ

131. දූප්පත් කමට පොල් ගන්න සල්ලි නැතුව කිරි හොද්දක් නොහදා වට්ටක්කා ඇට තලලා දාල කොච්චි හොද්ද එක්ක බත් කාපු දවස් මතක් වෙනවා.

132. හාල් ගන්න සල්ලි නැතිව බත් වෙනුවට මුරුංගා තම්බලා කාලා තියෙනවා. මගේ ළමයි ඒවා කනකොට නම් බලන්න ඉන්න බැහැ.

133. නෙලුම් අල සහ කොහිල අල එකට පුලුවන්නම් කාලා බලන්න; හරිම ගුණයි.

134. රස කෑමකි; කුරහන් රොටී සහ කොච්චි සම්බල්.

135. මාතර ගියොත් මම කිරි පැණි නොකා නම් එන්නේ නැහැ.

136. මාතර රිවර්ඩ් එකේ නියම මී කිරි තිබ්බා.

137. කතරගම යන කොට අම්බලන්තොට, හම්බන්තොට පැත්තේ හදන මී කිරි මඩුවටම ගිහිල්ලා ගන්නවා, ඒවා හදනවා බලන් ඉන්නත් පුළුවන්.

138. කතරගම බස් ස්ටෑන්ඩ් එක ළඟ කඩේකින් උදේට උණු උණු ආප්ප කෑවා ලුණු මිරිස් සහ කිතුල් හකුරු එක්ක. කවදාවත් අමතක වෙන්නේ නැහැ.

139. පීටර් කුරුවිට මහත්තයාගේ TV වැඩසටහනකට කතරගම ඉන්න හොඳම කලු දොදොල් නිෂ්පාදකයෝ එකතු කරලා වැඩසටහනක් රූපගත කළා, මහා පුදුම වැඩසටහනක්, අද ලෝකේ පුරාම වගේ cable TV වල ඒක පෙන්වනවා. පානම මහා මුකලන් කැලේ කිරි අල ගලවලා නෙලුම් කොලේ උඩ තියලා ලුණු මිරිස් සහ පොල් සමඟ කන හැටි පෙන්වන වැඩසටහනකුත් හදා එතුමා මුළු ලොවටම පෙන්වූවා.

140. ශ්‍රී ලංකාවට අපමණ කීර්තියක් අත් කර දී ඇති කුරුවිට මහත්තයා මහනුවර ක්වීන්ස් හෝටලේ ඉඳලා ජාත්‍යාන්තර රූපවාහිනියට උයලා පෙන්නුවා 'ශ්‍රී ලංකන් බරමන්ඩි' ඩිෂ් එකක් හදන හැටි. පසුබිම් සංගීතයට ගියේ 'සුරාංගනී... සුරාංගනී....' බයිලා වාදනය. මුළු බටහිර ලෝකයම වගේ දැක්කා අපේ ශ්‍රී ලන්කන් ඉවුම් පිහුම්.

141. රා කට්ටක් ගහල ගඟේ නාන්න යනවා වගේ නෑ; ඊට පස්සේ ගෙදර ඇවිල්ලා පොල් සම්බල්, ලුණුමිරිස් එක්ක තම්බපු කොස්.

142. බල කරවල කෑල්ලක් පුච්චලා දෙහි දාලා බත් දෙනවා යාළුවො 50ක් විතර එක පාරට නොකියා බස් එකෙන් ඇවිල්ලා බහින දවස්වලට. එක දවසක් දුන්නේ කුනිස්සෝ දාපු තෙම්පරාදු සම්බෝලයයි, මිල්වාට් හාලේ බතුයි. රස කර කර යාළුවෝ සහ ඔවුන්ගේ පවුල් කෑවා.

143. දවසක් දෙනියායේ  ගිහිල්ල කාපු ඇඹුල් තියල් මාළුයි කැකුළු හාලේ බතුයි මතක් වෙනකොට තාමත් කෙළ උනනවා.

144. වැව් මාළු බාලා හවස් වෙන්න ඇරලා තම්බපු මයියොක්කා එක්කා කාලා බලන්න, හැබැයි බීම ජාතියකුත් තියෙන්න ඕන.

145. පොලේ කරපිංචා මිටියක් රුපියල් 25යි. ඒකම මෙල්බෝර්න් වෙජී මාකට් එකේ රුපියල් 150යි.

146. අම්මා කේක් හදනකොට දාන්න ගේන මුද්දරප්පලම් අරන් හොරෙන් කනවා, ටින්කිරි එක්ක කලවම් කරලා, පුදුම රසක්.  හොරෙන් කන නිසාද?

147. අම්මාගේ කේක් එකේ ඇඟිලි දෙකෙන් තවරලා කනකොට හරිම රසයි, කේක් එකට වැඩිය.

148. කිතුල් රාවලට මඤ්ඤොක්කා කටගැස්ම වගේ එකක් නෑ.

149. මම ඉරිදට රසට උම්බලකඩ කෑලියි, බීලූනුයි, දෙහි,අමු මිරිසුයි දාලා හදන කටගැස්ම හොඳම කටගැස්ම කියලා හස්බන්ඩ් කියනවා.

150. කෑදර කමට වැට මායිමේ තිබූ ජාපාල ගසේ අතුරිකිල්ලක් කඩා ගෙන කාලා ඒ දිනය පුරා පොල් කිරි පානය කරමින් බඩ අල්ලං හිටපු කෙනෙක් හිටියා.

151. පිට රට සිට (යුරෝපයේ) සෑම වසරකම ලංකාවට එන මගේ අක්කා හැමදාම ඉල්ලන්නේ ගෙදරින් රසට හදන කෑමයි. එයා කියනවා හෝටල කෑම පිටින් ලස්සන වෙන්න පුලුවන්නු, ඒත් රසගුණ සහ පිරිසිදු අතින් ගෙදර කෑමට ගහන්න කෑම නැතිලු. ඉතා නුවණැති මගේ අක්කා කවදත් හරි බව මා දන්නවා.

152. පොලෙන් ඉදුණු බෙලි ගෙඩියක් අරං පිරිසිදු කිතුල් පැණි එක්ක ගෙඩිය ඇතුලෙම තියාගෙන තේ හැන්දෙන් කනකොට හිතෙනවා අනේ අපේ රට කොච්චර වාසනාවන්ද කියලා.

153. ඉදුණු දෙළුම්, මස් ගැලවෙන රඹුටන්, මැන්ගුස්ටින් මොන තරම් රහද?

154. රා බිලා පොලොස් ඇඹුල කාලා බලන්න.

155. සම්බෝලයි බතුයි එක්ක කුකුල් මස් කරි.

156. බැදපු කජු, ලුණු මිරිස් කුඩු ඉහලා ගත්තාම තියෙන හොඳම බයිට් එක.

157. කටු අනොදා රසයි  වැලි අනෝදා වලට වැඩිය.

158. අපි පොඩිකාලේ (1969) ඉදිච්ච ගල්සියඹලා ගොට්ටක්ම සත 5යි.

159. ඒ දවස්වල තිබුනා පාට කරපු කොන්ඩ කඩල, ගොට්ටක් සත 10යි. පැණි රසයි ඒවා.

160. කඩලේ කියලා මිනිහෙක් එයාගේ පෙට්ටියේ ඉස්සෝ වඩේ හදාගෙන එනවා, පුදුම රසක්. බිග් මැච් එක දවසේ බීලා කෑ ගහනවා, කඩල විකුනන්නේ නැහැ.

161. මෙල්බර්න් කඩේ ශ්‍රී ලංකා වෙජිටේරියන් කෑම මෙනු එක. සුද්දා කියනවා එයා කෑවේ -. රායිස් ෆ්රායිඩ්ස්, වට්ට

- කොක්, කාර් - වීල්, ගෝට් - කෝල්, බේබි ජ් ඇක්, සැම් - බෝල් කියලා.

162. බඩේ අමාරු හැදුනම ආච්චි හොඳ වෙන්න දුන්නේ සුදු බත් එක්ක ලුනුමිරිස් (උම්බලකඩ නැතුව).

163. මාළු ඩෙවල්, චිකන් ඩෙවල් රස වෙන්නනම් ලොකු බොම්බයි ලූනු කැලි, මාලු මිරිස් සහ තක්කාලි කැලි ගම්මිරිස් වැඩියෙන් දාලා තියෙන්න ඕනා.

164. අම්මාට හොරෙන් කුස්සියට ගිහින් සීනි හැන්දක් එක්ක ෆ්‍රිජ් එකේ තියෙන නෝනා මාර්ක් මිල්ක්මේඩ් ටින්කිරි හැන්දක් කලවම් කරලා රස බැලුවේ නැති කෙනෙක් වේ නම් එයා ලංකාවේ ඉපදුන කෙනෙක් නෙවෙයි.

165. හොඳට තුනපහ සමඟ සුදු ලුණු දාලා තැම්බුම් හොද්දක් හදා ගත්තොත් බත් කන්න ඒ ඇති.

166. යහළුවෙකුගේ උපන් දින සාදයකදී කිරි සහ මී පැණි සමග අයිස් ක්‍රීම් දාගෙන කෑවා, පස්සේ බලනකොට හැමෝම ඒ දේ කරනවා.

167. ලොකු අක්කා ඇමරිකාවෙන් ඉඳන් එනකොට පී නට් බටර් ලොකු බෝතලයක් ගෙනල්ලා කඩලා පාවිච්චි කරලා ෆ්‍රිජ් එකේ දාලා තිබ්බා. කවදාවත් මේවගේ රස කෑමක් කා

නැති මම දවස් දෙකෙන් පී නට් බටර් බෝතලයෙන් ¾ විතර ඇඟිල්ලේ තවර තවර කාලා ඉවර කළා. මට බනින්නේ නැතුව අක්කා දුකින් වගේ කිව්වා 'මල්ලි මම ආපහු ගිය ගමන්ම ඔයාට පීනට් බටර් බෝතල් 2ක් තැපැලට දාන්නම් කියලා'.

168. පිරිමි රා බොන වෙලාවට අපි ගැණු මොනවද බොන්නේ? රණවරා තම්බපුවා හකුරුත් එක්ක.

169. හවස් කාලෙට කොළඹ රස්නේ කපා ගන්න චීස් කැල්ලක් එක්ක හොඳ කූල් ස්ටවුට් බෝතලයක් බොන්නම ඕනා.

170. මී පැණි වල ගිල්වපු සුදු ලූනු රසයි, ගුණයි.

171. කොළඹ උසස් සිනමා හලක පිල්ම් 2ක් එක දවසේ බැලුවා පොප් කෝන් කකා. යාලුවා කිව්වා මම පැකට් 6ක් කැවාලු.

172. මගේ යාලුවා බ්ලැක් ලේබල් එකක් අරගෙනමයි එන්නේ. මම ලැස්ති කරලා තියනවා කොක්ටේල් සොසේජස්, ස්පැනිෂ් ඔම්ලට් සහ ෆ්‍රෙන්ච් ෆ්‍රයිස්.

173. කුරහන් පිටි තලප අපි පොඩි කාලේ කැවේ කිතුල් හකුරු සහ ලුණු මිරිස් එක්ක. රසයි ගුණයි දෙකම තිබුනා.

174. ඕස්ත්‍රේලියාවේ අපි කැඩ්බරි ෆ්රුට් චොක්ලට්, ක්‍රාෆ්ට් චීස් අඩු නැතුවාට කනවා. ෆූජි ඇපල්, ස්ට්‍රෝබෙරිස් , කිවි ෆ්රුට් බහුලව තියෙනවා. ටැස්මෙනියන් ගාලා ඇපල්, ජෝන් වෙස්ට් ටූනා වගේ කෑම කාලා දැන් ඇති වෙලා. කිසි වැඩක් නැහැ, කටට පුරුදු හෙරලි/ පොල් රස නැති නිසා.

175. ඕස්ත්‍රේලියාවේ ඉදලා එවපු බඩු කන්ටේනරයේ සීල් කඩලා වාප්පු ලිපිකරු හොඳ බඩු සේරම කොල්ලා කෑවා. මිනිහාගේ හොරකම අල්ලන්න බැරි වුනා. නැතිවූ බඩු අතර හොඳම ස්කොච් විස්කි බෝතල 2ක් සහ අවුරුදු 25ක් පරණ ‘බරෝසා වැළි’ වයින් බෝතලයක්. ආයි නම් ‘personal effects’ කන්ටේනර් එවන්නේ නැතැයි මම මටම ශපත කර ගත්තා.

176. මං ජපානයේ ඉගෙන ගන්න ශිෂ්‍යයෙක්. සම්බෝලයි බතුයි, පරිප්පුයි කරවලයි මතක්වෙනවා හැමදාම.

177. බි ලූනුවලට ඉස්සර කිවුවේ බොම්බයි ලූනු, ඉන්දියාවෙන් ගෙන්වන්නේ. සමහරු බිග් අනියනස් කියනවා. සීනි සම්බල් හදන්න නියම බඩු.

178. නියම පොල් රා තියෙනවා. ගහේ බඩු; බයිට් එකට සැමන් සැලඩ්.

179. කළුටි පොල් සම්බෝලය මෝරපු පොල් සම්බෝලයට වඩා හොඳ වෙන්නේ එහි කිරි ගතිය වැඩි නිසාද?

180. බොරැල්ලේ මැගසින් සිරගෙදර සුභ සාධක වෙළඳ සැලේ හැමදාම දවල්ට බත් එකක් දෙනවා කුකුල් මස් හෝ මාළු ඇතුළුව, මිල රුපියල් 60යි. හරිම සාධාරණ මිල. කොච්චර හොඳද කියනවානම ජේලර් මහත්වරුත් දැන් දවල් කෑම පැකට් ගන්නෙත් එතනින්ලු.

181. රට ඉඳන් එන මගේ යාලුවන්ට මම දෙන්නේ කොස්, පොලොස්, දෙල්, කිරිබත්, අච්චාරු. ගොටුකොල, ඇඹුල් තියල්, හැලප, කොහිල, කතුරුමුරුංගා, තම්පලා, හුරුල්ලෝ බැදලා, වටලප්පන් වගේ ඒවා. ඒ ගොල්ලොත් එන්නේ ඒවා කන්න, ගඟේ නාලා, ඔරු පැදලා.

182. මහවිලච්චියේ මගේ කඩේ ඉස්සරහින්ම ගහලා තියෙනවා ලොකු  බෝඩ් එකක් 'රා තියෙනවා; බයිට් එකට - කොච්චි වඩේ'.

183. දවල් අව්ව පායන,වතුර තිබහ වෙලාවට, කූල් ෆැන්ටා 2ක් බිව්වත් මදි.

184. ලංකාවට ආවාහම හැමදාම ගුවන් තොටුපලේ සිට මීගමු පාරේ ගෙදර යන අතර මගදී තැඹිලි එකක් බිලා

තමයි ගෙදර යන්නේ, කප්පවලා ලොදත් ඉල්ලගෙන කනවා.

185. ඇඹිලිපිටියේ කඩේකින් බත් කන්න ගියාහම මුදලාලි මගේ කනට කරලා අහනවා වල් ඌරු මස් සහ ගෝන මස් තියෙනවා, ගේන්නද කියලා; මම එපා කිවුවා.

186. කෑම කාලා අනිත් අය අයිස් ක්‍රීම් ඉල්ලනකොට මම සාරවිටක් කාලා ලබන සතුට අපමණයි.

187. අයිස් ක්‍රීම් කොම්පැනියක් අයිති ළමයෙක් අපේ පන්තියේ හිටියා. හැම අවුරුද්දෙම මිනිහාගේ බර්ත් ඩේ එකට අපට නාන්න අයිස් ක්‍රීම්- අපේ පන්ති පේලියටම වගේ බෙදනවා. සර්ලා මිස්ලාත් රස කර කර අයිස් ක්‍රීම් කෝන් කනවා.

188. අපේ කාර්යාලයේ අපි ටික දෙනා දවල් කෑම එකට කන්නේ. එක එක්කෙනාගේ කෑම එකෙන් මාළු ජාති හුවමාරු කරගන්නවා. පියන්ගේ කෑම එකේ නිතරම තියෙන්නේ බැදපු බොම්බිලි කරවල, කවුරුවත් හුවමාරු කරගන්න කැමති නැහැ. සමහරු නහය වහ ගන්නවා. අපි මිනිහාගේ කෑම එක හැඳින්වුවූ වේ දූප්පතාගේ බත් පත කියලා. දවසක් බොසුත් අප සමඟ එකතු උනා කෑම කන්න. මිනිහගේ කෑම එකෙත් මාළු වලට තිබුනේ බැදපු බොම්බිලි කරවල. මෙන්න බොලේ වෙනදට ඒවා කන්නේ කන්නේ නැති අය හරි රසයි කියා කියා හුවමාරු කරගන්නවා.

කවුරුවත් එදා කිවේ නැහැ දුප්පතාගේ බත් පත කියලා. මම මගේ අසුනට ආවහම 'අනේ වාසේ' කියලා කියවුනා.

189. හැලප කන්න හරිම කැමති අපේ අයියාට අම්මා දවසක් පිටි ටික කොටන්න කියලා ලඟට ගෙන්න ගත්තා. පස්සේ කිවා පිටි හලන්න කිවා. ඊට පස්සේ කිවා අනා දෙන්න කියලා. ආයි කිවා  පූතේ පොලුයි, පැණියි මිශ්‍ර කරලා හැලපේ හෙම්හිට හැඳි ගාන්න කියලා.  අන්තිමට කිවුවා මයේ සුදු පුතානේ අද හැලප හැදුවේ කියලා. එතකොටයි අයියාටත් තේරිලා තියෙන්නේ.  අයියා අද අප පවුලේ  හැලප එක්ස්පර්ට් වෙලා,  අපි එයාට කියන්නේ 'හැලප මැෂිම'.

190. ඉදි අප්පන් 70ක් කිරි හොදි, කොළ පාට සම්බෝලේ සහ තෙම්පරාදු කුනිස්සෝ මැල්ලුම් එක්ක  කාලා මම හොස්ටල් එකේ තියපු වාර්තාව තාම කඩලා නැහැල්ලු.

# • බීමතුන්

191. බීලා වැඩි උනාම වෙච්චදේ අමතක වෙන එක ඇත්ත. දවසක් මම පාටි එකකට ගිහින් බීලා මම දන්නේ නැහැ වැඩි වෙලා. පමණ ඉක්මවා නටලා මල් පෝච්චි බිදලා. යාළුවො එකතුවෙලා මාව අල්ලලා බාත් රූම් එකේ ඉන්දවලා ඇඳුම් පිටින් නාවලා ෂවර් එක ඇරලා තියල ගිහින්. මට පියවි සිහිය එනකොට වහිනවා. වටපිට බැලුවම තමයි තේරුනේ ඉන්නේ බාත් රූම් එකේ බව. පාටියත් ඉවර වෙලා. පස්සේ ඒ ගෙදර යාලුවා ඇවිත් 'දැන් ඉතින් මේ ඇඳුම් ඇඳගෙන කාල යන්න' කියලා කිව්වා. පස්සේ රෑ 1 ට විතර බෝඩිමට ආවා. හැබැවටම උන දේවල් මට මතක නැහැ. මමත් කලින් හිතුවේ බිව්වම මතක නැහැ කියල මිනිස්සු කියන්නේ බොරුවක් කියලා. මේක දැනට අවුරුදු 25 කට විතර ඉස්සර උන දෙයක්.

192. මාතර, පදමට සූර් වෙච්ච කෙනෙක් සිය නෝනා ඇත බස් එකෙන් බැහැලා එනවා දැකලා, නෝනා බනියි කියලා බයවෙලා ඉක්මනට වෙරි හින්දෙන්න, නිවෙස ඉදිරිපිට තියෙන තැඹිලි ගසට නැග්ගා දඩ බඩ ගාලා. තැඹිලි ගෙඩිය කඩා බොනවා කෙසේ වෙතත් බීමතින් නැග්ග මිනිහා බිමවැටිලා, අතපය කඩා ගන බිම ඉන්නවා නෝනා ගෙදරට එනකොට. මහත්තයව එවලේම ත්‍රී විල් එකක දාගෙන

නෝනා රෝහලට ගෙනිච්චා. හැබැයි ඒ යන ගමන් කියපුවා අහ ගන්න පුළුවන් ත්‍රී විල් අන්කල්ගෙන්.

193. අපේ ගමේ සුදුවට තදින් ඇබ්බැහි වූ සුදු අන්තුවෙක් හිටියා. මිනිහා දිනූ දාට ගමටම බොන්න අරන් දෙන ජාතියේ කෙනෙක්. මේ ගෙදර නිතරම අගහිගකම් පිරිලා. දවසක් ගෙදර උයන්න කිසිම දෙයක් නැහැ. මිනිහා රෑ බීලා ගෙදර ඇවිල්ලා බඩගිනි වෙලා කෑම මේසේ ඇරලා බැලුහම පිගානක කෑම බෙදලා වහලා තිබෙනවා දැකලා, කන්න හිතාගෙන ඇරලා බැලුවම ඒකේ තිබුනේ බූරු කොළ කුට්ටමක්. බිරිඳ කේන්තියට කරපු වැඩක්.

194. මිනිහෙක් ඇවිල්ලා කිච්චලු මරුවා සමග වාසේ අම්මා බුදුවේවා කියලා පච්චයක් කොටන්න කියලා.පච්ච කොටන හාදයා බීලා ඉදලා තියෙන්නේ. මිනිහ කෙටුවලු අම්මා සමග වාසේ මරුවා බුදුවේවා කියලා.

195. මම දන්නා වැදගත් පහේ පිරිමි කෙනෙක් ඉන්නවා, මාතලේ. කන සාක්කුවට වැටෙන්න බොන්න ඕන , නෝනා ආගමට දහමට බොහොම ලැදියි, කොයිතරම්ද කියනවා නම් මස් මාංස තියා උම්බලකඩවත් කටේ තියන්නේ නැහැ. නිවාඩුවක් ලැබුණද පන්සලේ එක්කෝ ධර්ම සාකච්ඡාවක් නැත්නම් භාවනා වැඩසටහනක්, බොහොම ශ්‍රධාවන්ත කාටවත් කරදරයක් නැති උතුම්ම කාන්තා රත්නයක්. කරුමේ කියන්නේ පන්සල් ගිහින් හිත සන්සුන් කරගෙන ගෙදර එනකොට මහත්තයා සිහිසුන්

වෙන්න බීලා, ඉතින් හැමදාම දෙන්නා රණ්ඩු. ගමේ මේ ගොල්ලන්ගේ තත්ත්වය අනුව දැන් දික් කසාද වෙන්නත් බැහැ ලොකු මහත් වෙච්චි දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා, දැන් ඒ අය ගෙදරින් පිටවෙලා. රණ්ඩු මැද්දේ වුණත් දෙන්නා පවුල් කනවා වෙන කරන්න දෙයක් නැති නිසාම. මහත්තයාගෙන් අහපුවහම කියනවා 'එයා හැම තිස්සෙම පන්සලේ, මෙහෙ, මට කන්න වෙලා තියෙන්නේ කඩෙන්, අඩු ගානේ උයලා තියලවත් පන්සල් යනවා නම් '.

196. මහත්වරුනේ, බොනකොට වැඩි වෙන්න බොන්න එපා.

197. මීට කලකට පෙර උරගස්මන්හන්දියෙන් අම්බලන්ගොඩ දක්වා හවසට පිටත්වන බසයක රියදුරා අරක්කු බී මත්වී බසයේ එළියේ බැටරි පෙට්ටිය උඩ ඉඳගෙන ඉඳලා. කොන්දොස්තර මඟීන් පටවා (කට කැපෙන්න පැටවූ බව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැනේ) අවසානයේ බෙල් එක ගැසුවාම රියදුරා නැති බව මඟීන් කිවුවාලු. මඟීන් පිටුපස දොරෙන් නග්ගවන විට රියදුරා ඉදිරියෙන් බසයට නැග්ග බව දන්නා කොන්දොස්තර ඉදිරියට පැමිණ බලන විට රියැදුරාව දැක්කා. මොළය කල්පනාකාර නොදැක්කා වගේ බසයෙන් බැස ගියාලු. වෙනත් කෙනෙක් ලවා පණිවිඩයක් යවා රියැදුරාව ටයිම් කීපර් කූඩුවට ගෙන්වාගෙන, මිනිභාව විවේකාගාරයේ නවත්තලා, වෙන රිලීෆ් ඩ්‍රයිවර් කෙනෙක්ව ඩියුටියට

දාගෙන බසය පන ගන්වගෙන ගියාලු. (මෙවැනි කොන්දොස්තරලාට දෙන්න විශේෂ සම්මාන ප්‍රධානයක් හදන්න ඕන).

198. අපේ පැත්තේ ගල්කඩන බාස් කෙනෙක් හිටියා. මේ මිනිහ තමුන්ගේ අවුරුදු 16 ක විතර පුතාට කියලා කසිප්පු ගෙන්න ගත්තා. ටික කාලයක් යනකොට කොල්ලත් බොන්න පුරුදු උනා. ගමේ අය කොල්ලට සුදු පරෙවියා කියලා නමකුත් දැම්මා. දවසක් පුතාට සල්ලි නැතුව තාත්තාට ගෙනෙන ඒවායින් ටිකක් මගදීම බීලා, මදි හරියට වෙලෙන් වතුර ටිකක් දමාගෙන ආවා. තාත්ත කසිප්පු ටිකක් බීලා ‘ඈ බන් අද බඩු හොද නැහැ නේ’ කිවුවා. ‘ඔව් බන් මාත් බීල බැලුවා’ කියල කොල්ලා කිව්වා. දැන් තාත්තයි පුතයි දෙන්නම් පරලොව.

199. නොබී ඉන්න පුලුවන්නම් හොඳයි. ඒත් බෝතලේ දැක්කම ඔක්කොම අමතකනේ. මම නම් බොන කොට බයිට් එකට කන්නේ දත් මිටි නිසා නෝනා ජාපාල දාල දුන්නත් ප්‍රශ්නයක් නැහැ.

200. බාර් එකකට ගොස් බොන මිනිහෙක් අලුතින් මත්පැන් වීදුරුවක් අණ කිරීමට ප්‍රථම සෑම විටම තම කමිස සාක්කුව තුල බලයි. බැරිම තැන බාර් කීපර් මොහුගෙන් ඒ ගැන විමසුවා. ‘ඔබ මොකක්ද ඔබේ කමිස සාක්කුවේ ඔය තරම් බලන්නේ කියා’. ඔහු කියනවා ‘මගේ කමිස

සාක්කුවේ මගේ නෝනාගේ පින්තූරේ තියෙනවා, එකේ එයා හිනා වෙනකම් ඉන්නවා බීම නවත්තලා ගෙදර යන්න.'

201. කොටුව කෝච්චි ස්ටේෂමේ හිස් බෝතලයකුත් කිහිල්ලේ ගසාගෙන වැලපෙන මිනිසෙකු දුටු ආරක්ෂක නිලධාරියෙකු ඔහු වෙත ගොස් කාරණය විමසීය. මගේ බඩු ටික ඔක්කොම නැති වෙලානේ . ඇයි මොකද උනේ කවුරු හරි හොරකම් කරලද ?නෑ නෑ මම දන්නෙම නැතුව මූඩිය ඇරිලා තිබිලා.

202. දවසක් (2001 නොවැම්බර්) කෝච්චියේ පෙට්ටිය ඇතුලේ මෑන් කෙනෙක් හීනියට වක්කර වක්කර බොනවා. මිනිහා පේරාදෙණියෙන් නැග්ගේ (අපි නැග්ගේ කොටුවෙන්). හැටන් වලට එනකොට මෑන්ට හොඳ ගණන්. ගල් බෝතලයක් නීට් පිටම මිනිහා වැඩේ දීලා. හැබැයි වෙරි නැති පූසා වගේ ඉන්නවා. වඬේ එහෙමත් අරගන කෑවා. තවත් ගල් බෝතලයක් හොරෙන් ගත්තා බෑග් එකෙන්. මගේ පුතාලා දූලාත් හිටපු හින්දා මම හොඳින් කිවුවා වෙන පෙට්ටියකට යන්න කියලා. මිනිහා ෆූට් බෝඩ් එක ළඟ ස්ටේෂන් 3-4 විතර පහුවෙනකම් හිටගෙන ගිහිල්ලා හපුතලෙන් බැහැලා ගියා සිගරේට් එකක් දල්වා ගෙන. අපි බයේ හිටියේ යෝදයා දුම්රියෙන් වැටිලා මැරෙයිදා කියලා. එතකොට රෑ 6ට විතර ඇති. මාව දැක්කහම ප්ලැට්ෆෝම් එකේ ඉඳං වේව් කළා. තනිකඩ රජයේ සේවකයෙක් වෙන්න ඕනේ කියලා වයිෆ් කිවා.

මුද්දක්වත් තිබ්බෙ නැහැ අතේ. එතකොට අවුරුදු 50ක් විතර ඇති. මිනිහා දැන් කොහි ඇතිද?

203. දවසක් යාලුවෙක් එක්ක හොඳටම දාලා (බෝතල් 3/4 විතර) මගේ මල්ලි වටපුළුව බස් එකෙන් බහින තැන වමනේ දාලා වැටිලා. ඒ පැත්තේ කොල්ලෝ වගයක් කවුද කියලා දැනගෙන මල්ලිගේ පර්ස් එකෙන් නොම්මරේ හොයාගෙන අපේ ගෙදරට කෝල් එකක් දුන්නා. මමත් අම්මාත් එක්ක කාර් එකෙන් ගිහිල්ලා මල්ලිව ගෙනාවා. අම්මා සැර නැති හින්දා හොඳයි, තාත්තාට කිවුවේ නැහැ. දවස් 3ට පස්සේ යොදයා ආයෙම ඒ වැඩේ කරලානේ - මාවිල්මඩ නර්සින් හෝම් එක ළඟ වැටිලා ඉන්නවා කියලා ආරංචි උනා. අපි ආයි කාර් එකෙන් ගිහිල්ලා අරගෙන ගෙනාවා. උඹට ලැජ්ජා නැද්ද බං කියලා කවදාවත් බනින්නේ නැති, ගහන්නේ නැති අම්මා එදා ඇහුවා. මල්ලිව පොඩි කාලේම පවුලෙන් කොන් කළා. ඒකයි එයා හුදකලා වුනේ. දැන් මිනිහා බොන්නේ කලාතුරකින්.

204. සියදෝරිස් කංකානම රා බොන්නට උගුඩුවෙක්. උදේ පාන්දරම පාන් කියන්නට බැරි තරමට රා බිලා වෙරි විලා, උදේ පාන්දර නැගිට කුඹුරේ හැම නියරයක් ගානෙම වාගේ ඇවිදිනවා ස්තෝත්‍ර වගේ මොනවද මුමුණ මුමුණ. උදේ 10ට විතර ගෙදර ඇවිත් 12 විතර වෙනකම් නිදා ගන්නවා. ඊට පස්සේ ගිහිල්ලා පොකුණ වගේ ගේ පහල තියෙන ලිඳෙන් අතින්ම සිතල වතුර ඇදන් නාලා 1ට විතර දවල්ට හොඳට කනවා. ඔන්න දැන් තමයි මිනිහට හොඳ

සිහිය තියෙන්නේ. ඊට පස්සේ උඩ පෙරාදෙනිය හන්දියේ තියෙන පලතුරු කඩේ ආතා එක්ක ටිකක් වෙලා කාලය ගත කරලා, කළු සුරුට්ටුවක් එහෙමත් බීලා පත්තරෙත් බලලා , හන්දීයේ රේස් පොලෙන් අශ්ව රේස් ඔට්ටුවකුත් දාලා නගිනවා මුරුතලාවේ කන්ද පයයින්ම ආපසු ගෙදරට. ආයි, හවසට 5ට විතර රා සෙල්ලම පටන් ගන්නවා. ගොඩාක් වෙලාවට එයාම හවස මැද ගන්න කිතුල් රා. දවසටම ගෙදර අය එක්ක කතා කලොත් (පොලිසියේ වැඩ කරන්නේ පොඩි පුතා) ඒ වචනයයි දෙකයි. නෝනාගේ මුනවත් බලන්නේ නැහැ. හැබැයි කාටවත් මිනිහගෙන් කිසි හිරිහැරයක් නැහැ. හවස 8 වෙනකොට රෑට කාලා, පන්සිල් කියලා, පිරිත් කැසට් එක දාගෙන මිනිහා මර නින්දේ. හාමිනේ ඇවිල්ලා පිරිත් කැසට් එක ඕෆ් කරනවා.

205. දන්නා කෙනෙක් ඉන්නවා දුකටත් පාටි දානවා, සන්තොසයටත් පාටි දානවා. පුදුම ආශාවක් තියෙන්නේ මත්පැන් වලට.

206. බොන්න පුරුදු උන මනුස්සයෙක් වැරදිලා ගමේ වෙන ගෙදරක පිලේ වැටිලා නිදාගෙන . මේ මනුස්සයාගේ බිරිඳ හැම වෙලේම මේ මනුස්සයා ගැන සැකෙන් ඉදල තියෙන්නේ, ඔය කියන ගෙදර බවලතාත් එක්ක නොමන සමබන්ධයක් තියෙනවා කියලා. කොහොමින් කොහොම හරි ගෙදර නෝනා සැකේට හොයා ගෙන යනකොට මේ මනුස්සය අර බවලතාගේ ගෙදර පිලේ නිදිලු; අනේ අර

අහිංසක කාන්තාවට නොසරුප් වදනින් බැනලා, බලු කුක්කෙක් වගේ තම ස්වාමියාව ගෙදර එක්කරගෙන ගිහිං.

207. හොඳටම බොන මුදලාලි කෙනෙක් කෝකියෙක් ඉල්ලා තම හෝටලේ ඉස්සරහ පල කර තිබුණු දැන්වීමක්: 'පළපුරුදු වයසක කෝකියෙක් රසට තැම්බීමට ඉඳි ආප්ප/ආප්ප ඕනෑ කර තිබේ. රාත්‍රී දිවා සේවය. සියලුම විමසීම් හවස 6ට හෝ උදේ 10ට පෙර'.

208. බර්ත් ඩේ පාටි එකක අපේ ගොඩාක් වැඩිවුණු යාලුවෙක් ගෙදර ගිහින් එයාගේ අම්මට පේන්න වෙරි නැහැ කියලා පෙන්නන්න ඩෙටෝල් බෝතලෙන් කට හෝදලා අම්මට කට ඉඹලා බලන්න කියලා. අම්මා නැවතුනේ අවුරුදු 17ක් වූ ඒ කොල්ලව කොළඹ 'නෝනා ඉස්පිරිතාලේ' නවත්තලා.

209. තම බේබදු සැමියා ඉන් මුදවා ගැනීමට කල්පනා කළ බිරිඳක් තම සැමියා රාත්‍රී බීමතින් නිවසට ඒමට පෙර නිවසේ සියලු කටයුතු නිමාකර ගෙදර වතුර පයිප්පයේ ප්‍රධාන කරාමය තදින් වසා තැබුවා. දැන් එළියේ සඟවා තැබූ වතුර බාල්දිය හැර මුළු ගෙදර පුරාවට වතුර බිඳක්වත් නැහැ. ඊට පසු බීමතින් වැනි වැනී ගෙදර ආ සැමියාට හරිම සතුටුයි. හේතුව ඔහුගේ ප්‍රියතම කෑම වන රසවත් කරෝල බැදුම කෑම මේසය උඩ තිබුන නිසා. එය සාදා තිබුනේ සැරම සැර කොච්චි මිරිස් සමග බව නොදැන ඔලුව වනවනා රස කරකර හොඳට බත් කැවලු. ටික වෙලාවක් ගිහින් ඇස්

රතුකරගෙන වතුර ඉල්ලනවලු. එවිට බිරිඳ කිවුවලු අද උදේ ඉදලා වතුර නැහැ කියලා. මේක දඩුවමක් කියලා තේරුණ නිසා මිනිහා දැන් බීලා ගෙදර එන්නේ කලාතුරකින්ලු.

210. ඔන්න දවසක් මිනිහෙක් හොඳටම බීලා රෑ ගෙදර එන ගමන් උඩ ලයිට් එකක් දාල තියෙන ලයිට් කණුවකට ගෙදර කියලා හිතන් යතුර දාන්න ට්‍රයි කරනවලු. කණුවට පයින් ගහනවලු. කෑ ගහනවලු; 'ඒයි දොර ඇරපන්, දොර ඇරපන්' කියලා. ඒක දැකපු කොල්ලෙක් විහිලුවට ඇහුවලු 'අන්කල් ගෙදර කවුරුත් නෑ වගේ නේද' කියලා. මිනිහා කියනවලු 'වෙන්න බෑ මල්ලි උඩ තට්ටුවේ උන් ලයිට් දාගානනේ ඉන්නේ' කියලා, 'මුන් අරින්නේ නැහැ' කියලා' මිනිහා අයෙත් ට්‍රයිලු.

211. බීපු මිනිහෙක් ගෙදර දොර යතුර දාලා ඇරගන්න බැරිව වෙහෙසෙනවලු. එතනට ආපු මල්ලියෙකුට මිනිහා කියලා තියෙනවා පොඩ්ඩක් මේ ගේ අල්ලගන්න, මම මේ දොර ඇරගන්න කම් කියලා.

212. හොඳටම හෝටලේකින් බීපු මිනිහෙක් බිල නොගෙවා ගිහින් පසුවදා ඒ බව සිහිවී දවල් කෑම විවේකයේ එම හෝටලයට ගියේ සමාව ඉල්ලලා බිල ගෙවා දමන්න. වේටර්ලා මිනිහව දැක්ක ගමන් බදලා අල්ලලා කාර්යාලය ඇතුලට ගෙනිච්චා. තල්ලු කරලා ගහන්න හැදුවා. මිනිහා කොච්චර කිවුවත් 'මම ආවේ ඊයේ බිල ගෙවන්න' කියලා ඒ

අය විශ්වාස කලේ නැහැ. පසුව පොලිසිය ගෙන්වූ පසු ඔවුන්ට ඇත්ත තේරුනා. මොකද රජයේ සේවකෙයක් වෙන ඒ මිනිසා හෝටලයට එදා මිස කවදාවත් දවල්ට ගිහින් නැහැ, සවස මිස.

213. අපේ මාමා කෙනෙක් මගුල් ගෙදරකදී ඉංග්‍රීසියෙන් කතාවක් කරනවා කියලා කිව්වා. අපි හිතුවා නිකමට කිව්වාය  කියලා. මෙන්න මේ හාදයා හොදටම බීලා (රතු ටයි එකක් එහෙම දාලා), කතා කරන්න නැගිට්ටා. මනමාල ජෝඩුව දිහා බලලා ඒ,බි කිව්වා. මනමාලිගෙයි මනමාලයාගෙයි අම්මා තාත්තා දිහා බලලා සි ,ඩී,ඊ , එෆ් කිව්වා. අයි ජේ කේ එල් එම් එන් ඕ කියලා ඉස්සරහා හිටි අමුත්තන්ව ඔලුවෙන් පෙන්නුවා. පි, කිවූ, ආර් කියලා වම්පැත්තේ අයව හිසින් පෙන්නුවා. එස්, ටි, යු, වී කියලා දකුණු පැත්තේ අයව හිසින් පෙන්නුවා. ඩබ්ලිව්, එක්ස්, වයි, ඉසෙඩ් කියලා පිටිපස්සෙ කට්ටියට අත දික්කරලා, තැන්ක් යූ කියලා ඉදගත්තා.

214. හොඳට බොන මිනිහෙක් සෙන්ට් ජෝන් මාකට් එකෙන් මාළුත් අරගෙන අසල තියෙන බාර් එකට ගොඩ වැදුනා. රෑ වී ගෙදර ගිය ඔහු ගෙදර අය ලයිට් නිවා නිදි බව අවබෝධ කරගත්තා. හොඳටම වෙරිවී සිටි ඔහු, වෙරි වැඩිවීම නිසා කෑමත් නොකා මල්ල පැත්තකට විසි කර ඇඳ සිටි ඇඳුමෙන්ම ඇඳට වැටි නිදා ගත්තා. පහුවදා පරක්කු වී ඇහැරුණු ඔහු ඒ ඇඳුම් පිටින්ම මල්ලත් අරං දුවලා ගිහින්

බස් එකකට එල්ලුනේ දැනටත් වැඩට ප්‍රමාද වැඩියි බව දන්නා හින්දා. බස් රිය තුල කුණු ගදක් ඇවිත් කොන්දොස්තර හොඳට විපරම් කරලා බලලා අහනවා 'ඔයාගේ මල්ලේ මොනවද?' කියලා. කලින් දවසේ ගත්, දැන් කුණුවී ඇති මාළු තාම මල්ලේ බව මිනිහා වටහා ගත්තේ එවිටයි.බෙල් එක ගහලා මිනිහා බැස්සා.

215. මහළු වගේ මිනිහෙක් පාරේ ඇවිදගෙන යන කොට සිහිසන්ව ඇද ගෙන වැටුනා. විශාල පිරිසක් ඔහු වටා රොක් වුනා. එක් නාකි නෝනා කෙනෙක් කිවා 'බ්‍රැන්ඩි' ටිකක් ඔහුට පොවන්න කියා. තව කෙනෙක් ඇම්බියුලන්ස් එකක් ගෙන්වන්න කි අතර තව කෙනෙක් වතුර ටිකක් මුහුණට ඉසින මෙන් ඉල්වා සිටියා. අර වයසක නෝනා, නැවතත්, '[මං කියන එක අහලා කරුණාකර බ්‍රැන්ඩි ටිකක් පොවන්න' කියා කිවා. අර මිනිහා දැස් ඇරලා කියනවා 'අර වයසක නෝනා කියන දේට ඕගොල්ලෝ ඇහුම්කන් නොදෙන්නේ ඇයි' කියා.

216. අපේ ගෙදරට නිතර ආවා ගියා වැඩිහිටි අය්යා කෙනෙක්. හරිම තැන්පත්. කතා කරන්නෙත් බොහෝම ශබ්ධ අඩුවෙන්. එතකොට අවිවාහකයෙක්. ගෙදරට ඇවිල්ලා පැය ගණන් ඉඳගෙන ඉඳලා යනවා, බැලුවහම කවුරුවත් කතා කරලත් නැහැ. අම්මා දෙන තේකක් බිලා එයත් එක්ක පොඩ්ඩක් කතා කරලා යනවා. දවසක් ඥාති මඟුල් ගෙදරක ගියාම මෙයාත් ඇවිල්ලා, අම්මා අපේ මේසෙන්ම වාඩි කරගත්තා. පස්සේ සමහර පිරිමින්ව

ඇතුලේ කාමරයකට කැඳවලා ගෙනිච්චා. මොකටද කියලා අපි දැන ගත්තා. අපි දන්නෙම නැතුව අපේ යාලුවවත් ඇතුලට අර ගෙන. කෑම ඉවරවෙලා ඩාන්සින්. මෙන්න පොරත් ඩාන්ස් කරනවා හරියට වයින් කරලා තිබ්බ පුසා වගේ. කවදාවත් මගේ මූණ වත් බලන්නේ නැති මෑන් මටත් කථා කරනවා එයාත් එක්ක ඩාන්ස් කරන්න, අම්මා යන්න කිවා, මම ගියේ නැහැ. හැබැයි මිනිහාගේ ඩාන්ස් ශාලාවේ හැමෝම ආශාවෙන් බලන් හිටියා. විස්කිවල තරම කියලා අම්මා ගෙදර ඇවිල්ලා ඇඳුම් ගලවන ගමන් කිවා. දිග කථාවක් කෙටි කරනවානම්, එයා අද මගේ හස්බන්ඩ්.

217. බීගෙන ඇවිල්ලා බිරිඳ හදාදෙන බත් පිඟාන නිතරම පොළේ ගහන පිරිමියෙක් හිටියා ගන්නොරුව, පේරාදෙණියේ. දවසක් සුපුරුදු ලෙස බත් පිඟාන පොලවේ ගහලා, පේරාදෙණිය හන්දියට ගියා මොනවහරි කන්න. එතන රෑ බත් කඩේදී පරණ යාලුවෙක් හම්බුවෙලා දෙන්නාම ගියා රෙස්ට් හවුස් එකට (තව) බිලා කන්න. එතැනදී වේටර් එක්ක රණ්ඩුවෙලා මිනිහා ගැහුවා ඉස්සෝ බයිට් පිඟානම පොලවේ, තව ලාගර් බෝතලයකුත් පොලවේ ගහන්න හැදුවා. වාසනාවකට පොලිසියෙන් නතර වුනේ නැත්තේ යාලුවා අලාභය ගෙව්වා හින්දා. හැබැයි එයාට දැන් රෙස්ට් හවුස් එක තහනම්.

218. ඉතා ‘මහළු’ තිදෙනෙක් උද්‍යානයේ බැංකුවක් මතට වී කථා කරමින් සිටියා. 1 වැන්නා කිවා, මගේ වයස දැන් 88.’ මම අඩි ගැහුවා නම්, සිගරට් බිවුවා නම්, වෙනත් නරක

දේ කළා නම් මම අද මෙතන නැහැ’ කියා. දෙවැන්නා කිවා ‘මම කවදාවත් මත් පැන් බීවේ නැහැ, මත් කුඩු ගත්තෙත් නැහැ, පාන්දර ඇහැරිලා වේලාසන නිදා ගත්තා කියා කිවා. මගේ වයස දැන් 90යි කියා ඔහු කිවා. 3 වැන්නා කිවා ‘මම වයස අවුරුදු 18 ඉඳලා හැමදාම මත් පැන් බෝතලයක් බොනවා, දුම්වැටි එහෙමත් බොනවා; කවදාවත් පාන්දර ඇහැරුනේවත්, වේලාසන නිදා ගත්තේවත් නැහැ කියා. අනිත් වයසක දෙන්නා කිවුවා මහා පුදුම කතාවක්නේ, ඔබ අප දෙදෙනාටම වැඩිය වයස බවත් පේනවා, මෙච්චර දේවල් කරලත් ඔබට කිසිම ලෙඩකුත් නැති පාටයි කියා. එවිට ඔහු කියනවා නෑ මට තවම 32යි කියා.

219. නුපුරුදු මත් බිම බිව්වම මොලේ ඔල්මාද වෙනවලු සමහරුන්ට.

220. ඔන්න අපේ ගෙවල් ගාව හිටියා බොනපාට් කියලා මාමා කෙනෙක්. රෑ පාරේ ලයිට් එළියෙන් මොනවදෝ හොයනවා. අපි ඇහුවා මාමේ මොනවද හොයන්නේ කියලා. මගේ යතුර නැහැනේ. ඉතින් කොහේද වැටුනේ? මේ ගේ ගාව. ඉතින් ඇයි මෙතන හොයන්නේ. ගේ ගාව එළිය නැති නිසා පෙනෙන්නේ නැහැ, ඒත් මෙතන ලයිට් එළියට හොඳට පේනවා. ඒකයි මෙතන හොයන්නේ.

221. හොඳටම බීපු මිනිහෙක් පාරේ වැටී ඉන්නකොට රාලහාමි කෙනෙක් පොලිසියට උස්සගෙන ගිහින් මිනිහට විරුද්ධව පැමිණිල්ලක් දාලා මිනිහට අත්සන් කර

ඉක්මනින් යන්න කිවා, තව වැඩ තියෙනවා කියා. අත්සන ගහන්න බොහෝ වෙලාවක් ගන්න බව පේන නිසා 'ඕක ටකස් ගාලා අත්සන් කරලා යනවකෝ' කියලා ගෝරි නාද කළා. මිනිහාත් බය වෙලා එහෙම කරලා ඉක්මනට ගියා. මිනිහා  ගියාට පස්සේ අත්සන පරික්ෂා කරන කොට දැක්කේ මිනිහා අත්සන ගහලා තියෙන්නේ 'ටකස්' කියලා.

222.	සීතලේ ගැහි ගැහි දියතලාව බාර් එකකට ගොඩ වැදුනා. ජම්පර් ඇඳ ගත්තු අයගෙන් බාර් එක පිරිලා ඉතිරිලා.  හොඳ වේටර් ඇහැක් පොඩි කරලා උඩ තට්ටුව පෙන්නුවා. උඩ කාමර තියෙනවා සෙනග අඩු. සිගරට් බොන්නත් දෙනවා. හොඳ ටිප් එකක් දීලා එලියට ආවා.

223.	කාටවත් නොතේරෙන්න, සැන්ඩියි කිය කියා මඳුවිතම  වක් කර වක් කර බොන මිනිහෙක් හිටියා.

224.	මේ ළඟදි මහියංගනයට ආසන්න ගමක වෙළෙඳසලකින් රාත්‍රී කෑමට පාන් ගෙඩියක් හා මාජරින් පැකට්ටුවක් මිළට ගත් බීමත් අයෙක් සබන් කැටයක්ද මිලට ගත්තේය, ඔහු නිවසට ගොස් පාන් පෙතිවල මාජරින් ගාන්න උත්සහ කළත් එය අසාර්ථක විය, වෙරිමතින් සිටි ඔහු නැවත එම වෙළෙඳසල වෙත ගොස් මුදලාලිට බැන වැදුනේය, බලනවා මුදලාලි මේ මාජරින් පැකට්ටුව හයියයි මේක හොඳයි ඔලුවේ ගාන්න යනුවෙනි.  එවිට මුදලාලි

පැවසුවේ බීමත් පුද්ගලයාට මේ මාජරින් පැකට්ටුවක් නොවෙයි සබන් කැටයක් යනුවෙනි.

225. කැම්පස් රැග් එකේම කොටසක් හැටියට හිල්ඩා එකේ ඉඳලා අක්බාර් නෙල් එකට බඩ ගාගෙන යන්න ඕන. රැග් පාටිය තිබුනේ එදා රෑ, වලේ . ඌරෙක් එහෙම රෝස්ට් කරලා එතනම දුන්නා. බොන්න තිබුනා නාන්න. ගොඩාක් කපල්ස් එදාම සෙට් උනා. කෙල්ලෝ ගැන ඉන්ටරස්ට් නැති අපි ඇතිවෙන්න බීවා. හොඳට සින්දු කිව්වා, ගොඩාක් පරණ සින්දු - සී ටී ගේ බරබාගේ වගේ. රැග් පාටිය ඉවරවෙලා ජයතිලක එකට ගියෙත් බඩ ගාගෙන, හොඳටම බිලා වැඩි වෙලා. පේරාදෙණියේ සීතල රෑ පාරේ බඩ ගාපු එකේ රහේ දැනගත්තේ, කූඩැල්ලෝ එහෙම කාලා තියෙන බව පසුවදා උදේ කලිසමේ තිබුන ලේ පල්ලම් වලින්.

226. දවසක් පේරාදෙණියේ ‘වළට’ මනමේ නාටකය ගෙනාවා. ‘වළ’ ඇතුලේ මත්පැන් බීම සම්පූර්ණයෙන්ම තහනම්. සිඩ්නි කියලා කොළඹ ගෙවල් තියෙන ඊ ෆැක් එකේ යාලුවෙක් පොල් බෝතලයක් බෑග් එකක් ඇතුලේ දාගෙන ඇවිත් නාට්‍යය යන ගමන් හොඳටම ගැහුවා. අපිටත් දෙන්න හැදුවා. මනමේ කුමරාට වැඩිය හයියෙන් මිනිහා සින්දු කියන්න පටන් ගත්තා. පස්සේ කැම්පස් සික්යුරිටි එකෙන් ඇවිත් මිනිහාව අයින් කළා.

227. එක්තරා බූරුවා ගහන සුදු අන්තුවෙක් රෑ වෙලා බීලා ගෙදර ආවා. ගෙදර එනකොට බිරිඳයි දරුවොයි නිදි.

මොනවහරි කාල නිදාගන්න හිතාගෙන කෑම මෙසේ වට්ටිය ඇරලා බැලුවා. වෙනද වගේම පිඟානට  බෙදල වහලා තිබුනා. පිඟාන ඇරියමයි තරු පෙනුනේ. ඒකේ තිබුනේ ගෙදර තිබුණු බුරු කාඩ් කුට්ටමක්. එදා ගෙදර කිසිම දෙයක් නැති නිසා දරුවෝ බඩගින්නෙම නිදාගෙන.

228. රෑ වෙනකම් සේල්ස් වැඩ කරලා එදා නවාතැන් ගත්තේ මහියංගනයේ රෙස්ට් හවුස් එකේ. කෑම ඕඩර් කරලා එදා දවසේ පත්තරේ බලන්න ගත්තා ඉස්සරහා සාලේ හිඳගෙන. හනිමූන් කපල් එකක් ඇවිල්ලා කොනේම තිබ්බ  පුටු දෙකක ඉඳගෙන කුටු කුටු ගා ගා මුමුණනවා. ඒ දෙන්නාගේ  මැද තිබු කනප්පුවේ විස්කි බාගයයි, ස්ටවුට් බෝතලයයි; ඩෙවල් චිකන් එකයි, රටකජු පිරිසියයි. බොන්න අකමැති නෝනාට මහත්තයා බල කර කර ස්ටවුට් පොවනවා මම බලා හිටියේ පත්තරේ යටින්. මිනිහා මම බලනවා දැකලා, නොනාව දක්කාගෙන ගියා කාමරේ ඇතුලට. මත්පැන් සහ කෑම කාමරයට ගෙන ගියා වේටර් කෙනෙක් ඇවිත්.

229. ඔන්න ලොකු සම්මන්ත්‍රනයක් තිබුනාලු.  පටන් අරන් පැය බාගෙට පස්සේ මිනිස්සු පිරිලා . අරාධිතයා කතාව ඉවර කරන අන්තිම මොහෙත් මෙහෙම කිව්වා. අපේ හතුරා අඳුනා  ගන්න, අතන මෙතන හැංගිලා ඉන්න දෙන්න එපා. උන්ගේ වර්ධනය මර්දනය කරන්න. දුටු තැන පහර දෙන්න. මේකෙන් ගොඩ එන්න සැමදෙනාම තමන්ට පුළුවන් තරමින් සතුරා විනාස කරන්න. ඔන්න දැනුත්

ඔහෙලා ළඟ කැරකෙනවා එහා පැත්තේ මෙහා පැත්තේ කියලා. පොඩ්ඩක් දාලා හිටිය, බාර් එක කියල හිතලා ඒ සභාවට ගිහින් හිටපු මිනිසා, දඩ බඩ ගාල නැගිටලා ගහන්න පටන් ගත්තා ළඟ ඉන්න මිනිසුන්ට. සංවිධායකයෝ අන්දුන් කුන්දුන් උනා. පුටු කැරකුනා. කොකා කොලා බෝතල් උඩ විසි උනා. කුඩා ළමයෙක්ලු කිව්වේ 'සතුරා කියලා කිව්වේ ඩෙංගු මදුරුවා ගැන අංකල් කියලා'. හැබැයි ඇත්ත හෙලිවෙනකොට වන්න ඕන හානිය වෙලා හමාරයි.

230. මෙක 1990 ගණන් වල වූ දෙයක්. අරක්කු මුඩියක් පැගුනත් වෙරිවෙන සහෝදර වේටර් කෙනෙක් හිටියා මම වැඩ කරපු බාර් එකේ (මොණරාගල දිස්ත්‍රික්කයේ). දවසක් මැනේජර් මිනිහාට බාර දුන්නා එදා දවසේ හිස් බියර් බෝතල් වල අඩියේ ඉතිරිවූ බියර් පුනීලයක් මඟින් තව හිස් බියර් බෝතලයකට පිරෙන සේ පහළට හරවා තබන ලෙස (අපේ බාර් එකේ හැමදාම කරන දෙයක් - ඒ බෝතලය පසුව විකුණනවා). වැඩේ කරන ගමන් බෝතල්වල අඩියේ තිබූ මත්පැන් බිංදු එකතුකොට ඒවා පානය කලා සහෝදර වේටර්. මිනිහා හොඳටම බීමත් වුනා. මැනේජර් පැමිණියාම මිනිහාටත් අසභ්‍ය ලෙස බැන්නා. මැනේජර් එවලේම මිනිහට දොර පෙන්නුවා. අපි ඊට පස්සේ මිනිහාව ආයි කවදාවත් දුටුවේ නැහැ.

231. බිග් මැච් එක දවසේ සල්ලි නැතුව වනාතමුල්ලේ ඕවල් එක ගාව ටකරන් පොට් එකකින් හොඳට කටුකම්බි

ගැහුවා. පස්සේ ඇතුලට ගිහින් බෑන්ඩ් සංගීතයට හොඳටම නැටුවා. ආයි බොන්න සල්ලි නැහැ. බෑන්ඩ් එකකට කියාලා හැට් කලෙක්ෂන් කරලා ඒ සල්ලි වලින් පොල් අරක්කු අරන් බිවුවා යාළුවො එක්ක. ජීවිතයේ ඉස්සෙල්ලම අරක්කු බීවේ එදා. අද, එදායින් අවුරුදු 70ට පසු, මේ ජීවිතයේ මොනතරම් මම අරක්කු බොන්න ඇතිද?

232. අපෙත් මගුලක් තිබුනා. මම මත්පැන් ඕන නැති බව කියන කොට බහුතරයගේ අදහස් උනේ ඕන කියන එක.නැතිනම් ඒකේ ගතියක් නැතිලු. 'ආතල්' එකක්කුත් නැතිලු .ඉතින් ඉහලම ජාති වලින් දුන්න .අන්තිමට හිස් බෝතල් ගණන් කරලා බලනකොට බේබද්දෝ බීලා ,ගෙදර යන කොට හිස් රට විස්කි බෝතලුත් ඉනේ ගහ ගෙන ගිහින් තියෙන්නේ.

233. තරුණ කාන්තාවක් පදවාගෙන පැමිණි රථය, තවත් වයසක මිනිසෙකු පදවාගෙන පැමිණි මෝටර් රථයක් හා ගැටුණි. වරද තරුණියගෙනි. වාහන දෙකටම විශාල හානි සිදුවී තිබුනත් දෙදෙනාටම කිසිදු හානියක් සිදුවී නොතිබුණි. තරුණිය වයසක මිනිසා හා කතාවට වැටුණි ''අපි අදහන ආගමේ නාමයෙන් අපි බේරුනා නේද'. ''ඒක නම් ඇත්ත' වයසක මිනිසා පැවසීය 'අපි දැන් හොඳ මිතුරන්. ඩිකියේ ඉස්තරම් වයින් බෝතලයක් තිබුණා නොබිඳි තියේ නම් වාසනාව'. වයින් බෝතලය නිරුපද්‍රිතව තිබුණි. ඇය ඔහුට එය පිළිගැන් විය. බෝතලය හිස්කළ වයසක මිනිසා තවත්

වයින් ඇතිදැයි විමසීය. ගැහැණිය ජයග්‍රාහී ලීලාවෙන් මෙසේ පැවසීය.' වයින් නම් නැහැ. ඇල්කොහොල් සඳහා වන පරීක්ෂණය පොලිසියෙන් තව ටිකකින් කරාවි; ඒ අ ය මග එනවා'.

234. නුවර කාසල් හොටෙල් එකෙන් හොඳටම බිලා **(1969)** රෑ **730**ට විතර උඩ-හේවාහැට අපේ ගෙදර යන්න බස් ස්ටේෂන් එකෙන් වැරදිලා මම නැගලා තියෙන්නේ තෙල්දෙණියේ යන බස් එකකට. පස්සේ පහේ කනුවට ගිහින්, එහෙන් (කුණ්ඩසාලේන්), 'වන් ෆෝ ද රෝඩ්' කියාලා මටම කියාගෙන ළඟ තිබුණු කාලේ බෝතලේ හිස් කලා. ආයිත් නුවර ඇවිත්, ලාස්ටම ලාස්ට් ෂොට් එක කියලා මටම කියාගෙන වික්ටරි බාර් එකෙන් ඩ්‍රැම් දෙකක් දාගත්තා. බස් එකෙන් ගෙදර එනකොට රෑ **11.30** ට විතර ඇති. වෙනදා වගේම අම්මා මඟ බලන් ඉන්නවා මම එනකම්. නොකාම නිදිය ගත්තා. පහුවෙනිදා නැගිට්ටාහම 'ආයි නම් බොන්නේ නැහැ' කියලා හිතුනා. ඒත් ඉතින්.....

235. අකාලයේ කැඩී බිඳී ගිය විවාහය නිසා සෑම බලාපොරොත්තුවක්ම සුන්කරගත් මිනිසෙක් දිනපතා මධුවිත තොලගාමින් තම වේදනාව තුනී කරගන්න උත්සහා ගත්තා. දවසක් හොඳටම බිලා බාර් එක ඇතුලේ වැටී සිටි ඔහුගේ ඔරලෝසුවයි, පර්ස් එකයි, මොබයිල් ෆෝන් එකයි හොරකම් කරගත්තේ හෝටලයේම වැඩ කරන වේටර් කෙනෙක්. පියවි සිහිය ආපසු සියල්ල නැතිවී තිබෙනු දුටු ඔහු පයින් යන්න හදනකොට ඒ වේටර් ත්‍රී වීලරයක් ගෙන්වා එයට සල්ලි ගෙවා මිනිහාව ගෙදරට ඇරලවන්න කියලා

කියලා. හොඳම වේටර් කෙනෙක් කියා කියා පින්දෙදි ගෙදර ගියා.

236. මැදිවියේ මිනිසෙකු බීර බෝතලයක් තොල ගාමින් සිටී මැදිවියේ කාන්තාවකගෙන් මෙසේ ඇසීය. ඔබ දිනකට බීර බෝතල කීයක් බොනවද? තුනක් පමණ ගැහැණිය පිළිතුරු දුනි. ඔබ බීර බීමට පටන් ගෙන කොපමණ කල් ද? අවුරුදු 25ක් පමණ හැණිනිසා කීය. අවුරුදු 25 කට බීර සඳහා ගිය වියදම ගණනය කල මිනිසා මෙසේ කීය .ඔබ ඔය මුදල් ඉතිරි කලා නම් ඔබට කැඩිලක් රථයක් මිලදී ගත හැකිව තිබුණා. ගැහැණිය පෙරලා මිනිසාගේ මෙසේ ඇසීය. ඔබ බීර බොනවද? නැහැ මිනිසා කීය. එහෙනම් කෝ ඔයාගේ කැඩිලක් කාරෙක?

237. අපේ ගෙදර මත්පැන් වලට තහනම් තැනක්. පසුගිය අහුරුද්දේ මගේ ඥාති පුතෙක්ගේ මගුල් ගෙදර අපේ ගෙදර ගන්න ඕනේ කිව්වා. එයාලගේ ගෙදර ඉඩ කඩ මදි නිසා. මගේ මුල්ම කොන්දේසිය මත්පැන් බැහැ කියලයි. බොහොම සාර්ථකව මගුල්ගේ තිබුණා. බේබද්දෝ කිහිප දෙනෙක් පිටදී චුරු චුරු ගැවාලු. අති බහුතරය සතුටු උනා. අපි බය නැතිව මෙහෙම කරනවා නම් අනිත් අයත් මේවා ආදර්ශයට ගන්නවා. එතකොට සමාජය යහ මගට ගන්න පුළුවන්.

238. ඉස්කෝලෙන් අස් වෙලා ගෙදර නිකන් ඉන්න කාලේ බෙන්ජා කියලා මත්පැනට ඉතා ගිජු යාලුවෙක්ව

ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කළා. මිනිහට හැමදාම හවසට බොන්න ඕන. දවසක් හිස් අරක්කු බෝතලයක් මට දීලා කිව්වුවා ඒක දීලා අලුත් එකක් වයින් ස්ටෝර්ස් එකෙන් අරන් එන්න කියලා (හිස් බෝතලේට රුපිය 15ක් මිල අඩු වෙනවා). මම පුෂ්ස් බයික් එකෙන් ගෙදර එනකොට තාත්තට අහු උනා හිස් බෝතලෙත් එක්ක. බෝතලේ වියලි නිසා මැන් බැන්නා විතරයි, නැත්නම් ගෙදරිනුත් එළවලා දාන්න තිබුනා. මොකද අපේ තාත්තා උඩඟු, සැර මිනිහෙක්, තරහ ගියාම යාළුවන්ට කියනවා මම එයාගේ නෙවෙයිලු.

239. ඉස්සර අපි හීනියට පාවිච්චි කරලා පයින්ම ගෙදර එනවා අනුරාධපුර ඉඳලා පුලියන්කුලමට. මගදී දන්නා කියන වහනයක් නතර කලා. වෙනදට හොඳට කතා කරන එදා යාළුවා වචන දෙකයි කතා කලේ, හැබැයි ගෙදර ලගින් බස්සලා ගියා. (ඇතුලත වායු සමීකරණය කරලා නිසා ටිකක් ගද වැඩියෙන් දැනෙන්න ඇති). පස්සේ ඒ වාහනය නම් මට කවදාවත් නතර කලේ නැහැ. ඒකෙන් තේරුණා කොයි තරම් නොබොන කෙනා බොන අයව පිළිකුල් කරනවද කියලා.

240. පොඩි ෂොට් එකක් දාගත්ත නම් ලියන්න/කියන්න දෙයක් හිතට එනවනේ.

241. දෙකක් දා ගන්නම ඕනේ වැඩ පෙන්වන්න.

242. ඕනෑම සද්දන්තයෙක් වට්ටන්න පුළුවන් එකම වෙලාවනේ දෙකක් දාගන්ත් වෙලාව.

243. පදමට වෙරි වුණ යාලුවෝ දෙන්නෙක් මස්කෙලියේ බස් එක වැරදිලා, කේන්තියට බාර් එකට ගිහින් තව බිව්වලු. පස්සේ 'අපේ මුත්තලා මස්කෙලි ගියේ බස් වලින් නෙවෙයි. මොන බස්ද බන්, යමු පයින්' කියලා අත් දෙකත් අල්ලගෙන පාරට බැහැලා සීතලේම ඇවිදගෙන ගීයාලු. ටික තැනක් ගිහින් එක්කෙනෙක් වමනේ දාන්න පටන් අරන් කානුවක වැටුනලු. පස්සේ අනිකත් වමනේ දාන්න පටන් ගත්තලු. දෙන්නට එතනම නින්ද ගිහිල්ලා. බල්ලෝ වගයක් (කකුල් හතරේ උන්) ඇවිල්ලා වමනේ කනවලු, මූනුත් එක්ක ලෙව කා කා. එක යාලුවෙක් කියනවලු 'බාබර් කපාපන් මගේ උඩු රැවුලේ අනික් පැත්තත්'. කියලා. එක ඇහිලා අනිත් යාළුවා කියනවලු 'බාබරයෝ, කපාපිය මගේ රැවුල ඔක්කොම' කියලා.

244. ඔන්න ඉස්සර කාලේ දවසක් ගම්මුලාදෑනී කෙනෙක් ගියා එක දූප්පත් රා මදින්නේක්ගේ ගෙදරට බොන්න. මදින්නා බොහොම ගරු සරු ඇතිව ගහෙන් බාපු ගමන් මුට්ටිය පිටින්ම ගම්මුලාදෑනී උන්නාන්සේට රා ටික පූජා කරා. ඒත් බොන්න දුන්නේ පොල්කට්ටක. මට මේ හැම එකාම කට තියපු පොල් කට්ටේ බොන්ඩ බෑ බොළ, ගෙනපිය අලුත් එකක් කියලා ආරච්චිල කිව්වා. ගේ හැමතැනම හෙව්වත් අලුත් පොල් කට්ටක් හමු වුනේ

නෑ.බැරිම තැන ගම්මුලාදෑනී ටිකක් සැරෙන් කිව්වා බලාපිය ඔය ගෙයි තියෙන අලුත් භාජනයක් මොකවත් නැද්ද කියලා. මදින්නා ගෙයි තිබුණු අලුතෙන්ම ගෙනාපු පිත්තල පඩික්කමක් හෝදලා අරන් ආවා. අනේ හාමුදුරුවනේ මේක ගිය සුමානේ පැණි විකුණලා පොලෙන් ගෙනාවේ තවම කවුරුවත් පාවිච්චි කරලම නෑ කිව්වා. තෝ කියන කතාව නම් හැබැව තමා බොළ ඒත් ඕකේ නම පඩික්කම නොවැ. ඕක රටට ආරංචි වෙන්නේ අහවල් ගම්මුලාදෑනී පඩික්කමේ රා බිව්වා කියලනේ කියලා. අර පොල් කට්ටේම්ම රා බීලා ගියාලු.

245. පිටකෝට්ටේ අපේ ගෙවල් ගාව, රජමහාවිහාර පාරේ පාරේ කෙලවරේ හිටියා හොඳට බොන පුද්ගලයෙක්. හැම සිකුරාදාම වගේ හොඳටම බිලා රෑ වෙලා මේ පාරෙන් යනවා, මහා හයියෙන් සින්දුවක් කිය කියා. නැත්නම් කාට හරි හයියෙන් බැන බැන . එක දවසක් පෝය දවසක මහා රෑ මිනිහා අපේ ගෙදර ලඟින් යනකොට අපේ බල්ලා බිරුවා, මිනිහා සින්දුවක් පටන්ගත්ත ‘බල්ලා බුරයි හඳ පායයි හඳේ හාවා බය නෑ....’ කියලා. ඊට පස්සේ බල්ලාට බනින්න පටන්ගත්තා, ‘වරෙන් බල්ලෝ මමත් උඹටබය නෑ...’ කියලා. හැබැයි අපිට නම් බැන්නේ නැහැ . පස්සේ වැටහුනේ මිනිහා කෑ ගහල තියෙන්නේ බල්ලා කයි කියාලා බයට. ලඟදි හොයලා බලනකොට දැන ගන්න ලැබුනා ඒ හිත හොඳ අංකල් දැන් මැරිලා කියලා.

246. හැමදාම රෑ බීලා පාරදිගේ බල්ලන්ට බැන, බැන,ගෙදර යන මනුස්සයෙක් හිටියා. කවුරුත් දන්නවා බල්ලෝ බුරන කොට ඒ මනුස්සයා එන බව. දවසක් බිලා එනකොට ගෙදර කට්ටියම නින්දට ගිහින්ලු. මිනිහා වැනි වැනි කෑම මේසේ ලගට ගිහින් රෑට කන්න තියන රොටියයි කට්ට සම්බෝලෙයි අරන් හිට ගෙනම කලා පිඟාන පිඟන් රාක්කේ නමලා නිදා ගත්තලු. උදේ ගෑණු කෙනා ඇහැරිලා කෑම මෙසේ ලඟට ගිහින් මිනිහට බයිනවලු බොන්න නම් දන්නවා, කාලා පිඟානවත් හෝදන්න බෑ කියලා.ඊට පස්සේ මිනිහා ඇවිත් ගෑණු කෙනාට කිව්වලු, මං කාපු පිඟාන හෝදලා පිඟන් රාක්කේ නැමුවා තමුසේ බොරුවට කෑගහනවා. ගෑණු කෙනා ගිහින් බලද්දී රොටියක්ලු තිබුනේ. මිනිහා කට්ට සම්බෝලේ කාලා රොටිය හෝදලා තියලා. මිනිහාත් කිසිවක් නොකිය ආපසු හැරුනලු.

247. එක කරනවෑමියෙක් හිටියලු හොඳ බේබද්දෙක්. දවසක් මිනිහා වැඩ ඇරිලා යනකොට මළ ගෙයක් දැක්කලු. ලංකාවේ මළගෙවල් වල සුරාවෙනුත් සංග්‍රහ කරනවනේ. ඉතින් මිනිහ ගේ ඇතුලට ගිහිල්ල දේහයට ආචාර කරලා ඇවිල්ල වාඩි උනාලු. දැන් වාඩිවෙලා ඉන්නවලු අර වැඩේට කිසිකෙනෙකුගෙන් ආරධානාවක් නැහැල්ලු. බැරිම තැන කරනවෑමියා ගෙදර කෙනෙකුගෙන් ඇහුවලු තේ ,කෝපි මොකවත් නැද්ද කියලා. ගෙදර කෙනා කිව්වලු අනේ මෙ දැන් තමයි සීනි තේකොල ටිකක් ගේන්න යන්න හදන්නේ කියලා. ඒ පාර ඇහුවලු බුලත් විටක් වත් නැද්ද කියලා. ගෙදර කෙනා කිව්වලු අනේ තාම මුකුත්ම සුදානම්

කරගන්න බැරි උනා කියලා. ඉතින් මේ කරනවැමියාත් ටිකක් වෙලා ඉදලා ගෙදර යන්ඩ ගත්තලු. දැන් ඔහොම යනකොට ඊට ටිකක් දුරින් තියනවාලු තව මළගෙයක් ,අපේ මනුස්සයා ඒ මරණෙටත් ආචාර කරලා එලියට එනකොටම කෙනෙක් අතින් අල්ලලා කතාකළලු මොනවා හරි කරනවද කියලා. මිනිහත් ඉතින් හොදට ගැහුවලු, ඊටපස්සේ කෑම කන්න කතාකළලු. කාලා ඉවරවෙනකොට ඇම්බුන් ඇවරිය ඇල්ලුවලු, ඊටපස්සේ බුලත් හෙප්පුව අරන් විටකුත් ඒද ගත්ත ලු. දැන් මිනිහ ගෙදර යන්ඩ එලි බැස්සලු. ඔන්න එතකොට මතක් උනාලු කලින් මළගේ. දැන් මිනිහ ඒ පැත්තට හැරිලා මළගේ ගාවට ආවලු. මෙන්න පාරේ ඉදන් කෑ ගහනවලු ‘ඕවා මලගෙවල්ද ඕයි, අන්න මළගෙවල් ,මළගෙවල් ගන්ඩ දන්නේ නැත්නම් නිකා ඉන්නවා' කියලා.

248. බීපු මිනිහෙක් පතලකට වැටිලා මහා රෑක. හොද වෙලාවට හරහට දාලා තියෙන බාල්ක පොල්ලක එල්ලිලා පසුදා පාන්දර වෙනතුරු වෙරි හිදෙනකම් ඉදලා; මැණික් සංස්ථාවට, පතල් හාරන්නන්ට, මැණික් මුතු මාල පළදින්නන්ටත් සම සමව බැණ, බැණ. එළිය වැටීගෙන එනකොට අඩිය බැලින්නම් අගල් පහක් හයක් නැතිලු. යසට අඩිය ගහලා ඉන්න පුළුවන්ලු.

249. අපි ටෙක්නිකල් කොලේජ් එකේ ඉන්දැද්දී විනෝද චාරිකාවක් සුදානම් කරන්න කතා උනා. ගුරුවරු එකඟතාවය පලකලත් තරයේ කියා සිටියේ මත්පැන්

පානය, ගෙනයාම සහ මගදී මිලදී ගැනීම නොකළයුතු බවයි. අපිත් 'හා' කියල ගමන පිටත් උනා. නිට්ටඹුව හරියේදී අපේ නඩේ කොල්ලෙක් හොද විස්කි බෝතලයක් අරන් සර් ගාවට ගිහිල්ල 'සර් මේන් එකෙක් බෝතලයක් ගෙනල්ලනේ, මොකද කරන්නේ කියලා'. 'හා හා වැඩිය වෙරි වෙන්නේ නැති වෙන්න බීපල්ලා' කිව්වා.දැන් කොල්ලොන්ටත් ටිකක් වෙරි. මෙන්න එකෙක් ආයිත් බෝතලයක් අරන් සර් ගාවට යනවා 'සර් මේ තව එකක් තියනවා සර්ලට' කියල. 'හා හා තියල පලයන්' කිව්වා. මෙන්න දඹුල්ල පහුවෙනකොට සර් අහනවා 'පුතේ ගෙනාපුවා ඉවරද'?

250. රත්මලානේ ස්ටේෂම කිට්ටුව බෝඩිමක ඉන්න කාලේ බොන එකේ සුවය දැන ගන්න, දවසේ වෙහෙස සුවසේ නිවා ගන්න, ඉඳලා, හිටලා අපිත් හීනියට අඩියක් ගහනවා. උම්බලකඩ කෑල්ලක්, රතු ලූණු ටිකක් ලියලා, ගම්මිරිස් කුඩු ටිකක් ඉහලා, දෙහි ඇඹුල් ටිකකුත් කලවම් කරගෙන එහෙම. කාටවත් කරදරයක් නම් නැහැ. වෙරි වැඩි වුනහම යහළුවෙක් දෙන්නෙක් ඔය ප්‍රියා සූරියසේන, පුන්සිරි සොයිසා, CT ෆර්නැන්ඩො, මිල්ටන් මල්ලවාරච්චිගේ වැනි සින්දුවක් ලයාන්විතව කියනවා ගිටාර් එක වයමින්. සුළඟත් එක්ක සින්දු හඩ ඈත දුරට පාවී යන්නේ නිසල රැයට අමුතු, චමත්කාරජනක වගේම පාළු, දුක්මුසු වගේ හැඟීමක් මුසු කරමින්. දෝංකාර දෙන ඒ චමත්කාර

සංගීතයෙන් අහල ගෙවල් වල කී දෙනෙක් සතුටට/අමන්දානනදයට පත් වෙන්න ඇද්ද?

251. බීමටම ඇබ්බැහි උන පුද්ගලයෙක් ලෙඩ වුණා.වයස අවුරුදු 90ත් පැනලා.ඔන්න පණ ගියා මෙන්න පණ ගියා කියලා ගෙදර අය හිතන්නෙ. පාංශකූලය දෙන්නත් කථාව, සූදානම. ඒත් මිනිහා ඇස් ඇරලා බලනවා.ගෙදර අයට වස කරදරයක්. සති ගණනාවක් ගිහිල්ලා, තාම මැරිලා නැහැ. තවත් බේබද්දෙක් කිට්ටු වෙලා බැලුවලු. ලෙඩා ඇඟිලි දෙකක් එකතු කරලා 'ටිකක්' කියලා සංඥාවක් දුන්නලු. මේස හැන්දකට අරක්කු ටිකක් දමලා තොල් අතරින් තිබ්බලු. තලු මරලා පුංචි හිනාවක් දීලා මිනිහා මලාලු.

252. මම දවසක් හොඳටම බීලා එළවලු මල්ල කාරෙකේ තියලා කුකුල් මස් ටික ඩිකියේ දැම්මා. දවස් 2ට පස්සේ ඉවසන්න බැරි ගඳක් ආවට පස්සෙයි මතක් වුනේ.

# • සොඳුරු පාසැල් දිවිය

253. විදුහල්පති මට තරවටු කලා එල හරකයි මී හරකයි වගේ ඉස්කෝලේ එන්නේ කියා. මන් ඉස්කෝලේ ගියේ දිග කලිසමට සෙරෙප්පු දාල, මට සපත්තු අරං දෙන්න කවුරුවත් ඉදිරිපත් වුනේ නැහැ.

254. අපේ අක්කට සපත්තු අරන් දුන්නේ ඉස්කෝලෙ මැඩම් කෙනෙක්. අනේ වාසනාවන් එවන් 'දෙවිවරු'.

255. මම රුවන්වැල්ලේ රාජසිංහේ පාසැල් යන කාලේ දවසක් ස්කුල් කට් කරලා තවත් යාලුවෝ දෙන්නෙක් එක්කර ගෙන ගියා හොර කුරුම්බා කඩන්නට (කරවනැල්ලේ, සීතාවක ගඟ අසල). මම ගහට නැග්ග විතරයි දැක්කා වත්තේ අයිතිකාරයා දුවගෙන එනවා, ඇවිත් ගහන්න පොල්ලක් උස්සනවා. මම ගැහෙනවා. මට කිව්වා, 'උඹ ගහෙන් එක කුරුම්බයක් එහෙම කඩන්න එපා, කඩපිය පොල්' කියලා. ඉතින් මම පොල් ගෙඩි දහයක්, දොළහක් විතර කැඩුවා. දැන් බැහැපිය කිව්වා. ආයි ඒ පැත්තේ පස් පාගලා තිබ්බොත් කකුල් කැඩෙන්න ගහනවා කියලා ඒ තඩි පොල්ල පෙන්නුවා. කුරුම්බා/පොල් කඩන්න කිව්වහම අදත් කකුල් දෙක වෙව්ලනවා.

256. මා උසස්පෙල ඉගෙනුම් කරන අවදියේ දිනක් පන්තියේ මිතුරන් කිහිපදෙනෙකු ක්‍රිකට් පෙවිලියන් එක පිටි පස්සේ අරක්කු බී හසුවුනා. විනය පාලක ගුරුතුමාගෙන් පිළිවෙලින් ගුටි කන විට සිදුවීම මුලසිට අගටම හෙලිවුනා. පාසැලට අරක්කු බෝතලය රැගෙන පැමිනි සිසුවා කිවේ 'සර්, තාත්තා රෑට අරක්කු බිලා අම්මට ගහන නිසා ඒක මම බෑගයට දමාගෙන ආවේ මගදී විසි කරන්නයි. යාළුවො තමයි කිවේ කඩලා බොමු කියා'. 'හොඳ පුතා'කියලා සර් පිටට තට්ටුවක් දාලා සිසුවාව ඇරියා.

257. පුංචිම කාලේ ඉස්කෝලේ ඉඳලා ඇවිල්ල කාලා ඇඳුම් ගලොලා, සුදු කලිසම් කොටයක් ගහගෙන තව යාලු කෙල්ලෝ එක්ක කැළණි ගඟේ ශාඛාවක් වන වී ඔයාට පැනලා ගඟේ එක පළල පැත්තක් සිට අනිත් පැත්තට නොනැවතී පිනනවා පැය 2ක 3 එක දිගට. වයසේ 7 ඉඳන් ඉස්කෝලෙන් අස් වෙනතුරුම මෙහෙම එගොඩ මෙගොඩ පිනුවා. අපිට තිබුන ලොකුම සතුට ඒකයි. ඒ දවස්වල ගඟේ වතුර දැන් වගේ බොර නෑ. නිල් මැණික් කැටයක් වගේ පිරිසිඳු, සීතල වතුර. වැස්සෙන් අඩි 40ට වැඩිය ඇති ජඹුර විතරක්. ගෙදරින් මුකුත් කියන්නේ නැහැ, මොකද ගඟ ගැලුවේ ගේ පිටිපස්සෙන්. ඒත් සමහර දාට අම්මා එනවා මහා දිග කොටුවක් අරගෙන. මහා වැස්සෙන් පස්සේ ගඟේ වතුර පිරිලා හරියට 'ස්විමින් පූල්' එකක් වගේ, ජඹුරට වතුර. ඇත්තටම මාව පුහුණු කළා නම් ඔලිම්පික් ගිහින් මෙඩ්ල්ස් ගහන්න තිබුනා පිහිනීම් අංශයෙන්, ඒ තරමටම

පිහිනීමට දක්ෂයි අපි කෙල්ලෝ කට්ටිය. අද, අවුරුදු 50ට පස්සේ වී ඔය දෙකට බෙදිලා, පිනනවා තියා මිනිස්සුන්ට ගිලිලා නාන්න තරම්වත් වතුර නැහැ.

258. නිතරම අඩලා කරදර කරන ළමයෙක් හොඳට ප්‍රතිසංස්කරණය වුනාම් එයාගේ අම්මා මෙහෙම කිවුවා - ‘මඩ ගොඩේ පිපුණු සුපිපි නෙළුම පෙන්නේ ටික දෙනාටයි බොහෝ දෙනාට පෙන්නේ මඩ ගොඩ පමණයි‘.

259. මගේ නව වැනි උපන්දිනය දා මගේ අම්මා ඉස්කෝලෙට ඇවිත් මගේ සමරු පොතේ ලියපු මේ වැකිය මට තාම මතකයි. මගේ ජීවිතය වෙනස් කල සන්ධිස්ථානයක් එය: ‘කකුල් දෙකම නැති 9 හැවිරිදි පිරිමි ළමයා දුටු පසු මම අම්මගෙන් අළුත් සපත්තු ඉල්ලා කරන නොනවතින හැඩිම නතර කලෙමි’. ඇත්තමයි, එදායින් පස්සේ මම අම්මට කරදර කලේ නැහැ දේවල් ඉල්ලලා.

260. වැස්සහාම ගේ පිටිපස්සේ කැළණි ගඟ පිරිලා වෙනදා ඇවිදගෙන යන මිනිස්සු මිනිස්සු ගඟ තරණය කරන්නේ තාවකාලික පාලමෙන්. අපි හිටපු කිතුල්ගල පැත්තේ ගඟේ වතුර නිල් මැණික් කැටයක් ගානයි. හරිම පිරිසිඳුයි, කැඩපත වගේ ගඟේ පතුල පේනවා. ඒ දවස්වල. අපි දවසෙම ඉන්නේ වතුරේ. වතුර යටින් ගින් දිය බුං ගහනවා. ලොකු තිරිවාන, ග්‍රැනයිට් වාගේ ලස්සණ ගල් ගඟ අඩියේ හංගලා, දිය යටින් පිනාලා ගිහිල්ලා හොයනවා.

වතුර පැහැදිලි නිසා ගඟ පත්ල හොඳට පේනවා. ලොකු මාමා වේවැලක් අරගෙන එන කොට තමා නවත්වන්නේ. මොන තරම් සුන්දරද ඒ ළමා විය?

261. ජාත්‍යාන්තර පාසලේ මිස් - ‘දුප්පත් කම ගැන රචනාවක් ලියන්න පුලුවන්ද’? එකමත් එක රටක දුප්පත් පවුලක් සිටියාය. ඒ පවුලේ පියාද, මවද, දරුවෝද දුප්පත්ය. තවද රියදුරාද, කොකියාද, දැසි දැස්සෝදැ දුප්පතුන් විය. මේ, ඉංග්‍රීසි භාෂාව කථා කරන රටකින් පැමිණි තානාපතිවරයාගේ දියණිය අපේ රටේ දුප්පත්කම ගැන ලියූ සැටියි.

262. දවසක් අම්මා කෙනෙක් පුතාවත් අරන් ඉස්කෝලේ යන්න බස් එකට නැගලා පුතාට බාග ටිකට් එකක් ඉල්ලලා.කොන්දොස්තර පුතාගේ වයස ඇහුවම පුතා කියලා තියෙනවා ‘මට කියලා තියෙන්නේ බස් එකට නගින්න ඉස්සෙල්ලා 12 යි, බස් එක ඇතුලේදී 6 යි’ කියලා.

263. මං මතුගම ඩොන් බොස්කෝ එකේ ඉගෙන ගන්න කාලේ, අපි කොළඹ ගියා පාසලේ අධ්‍යාපන චාරිකාවකට. ග්‍රහලෝකාගාරය බලද්දී ආර්ය සිංහල ඇඳුමෙන් ලස්සනට සැරසුණු මහත්මයෙක් තනිවම ප්‍රදර්ශන නරඹමින් යනවා. අපි කොල්ලෝ තුන්දෙනෙක් එකට ගියේ. අපිට හිතුනා මේ මහත්තයත් එක්ක ඉංග්‍රීසියෙන් කතා කරලා බලන්න. ඒ කාලේ ඉංග්‍රීසි කථා කරන්න ආසයි බයයි. අපේ ගුරුතුමා

කියලා තිබුන කොල්ලනේ බය නැතිව කතාකරපල්ලා, මම හොඳට උගන්නල තියෙන්නේ කියල. ඒත් කලිසම් අඳින ටයි කෝට් දාන අයට අපි බයයි, 'කඩුවට' කැපිලාම යයි කියලා. ඒ නිසා අහිංසකයෙක් අල්ල ගත්තා. අපොයි දෙයියනේ එතුමා දක්ෂ ලෙස ඉංග්‍රීසි කතා කළා. අපි යන්තම් ගොත ගහ ගහ කියන කොට එතුමා බොහොම සතුටු වෙලා ඉංග්‍රීසියෙන් කිවා මේ ළමයින්ගේ ඉංග්‍රීසි උච්චාරණය ඉතා හොඳයි. බොහොම හොඳයි එහෙම තමයි බය ඇරෙන්න කතා කරන්න ඕනේ කියලා. අපි ස්තුති කරලා ඉක්මනින් මාරු වුනා.

264. මම ගමේ පාසලේ හැමදම පළවෙනියා. ඉතින් මෙකේ කිසිම තරගයක් නැති නිසා මම ගියා නගරයේ ජනප්‍රිය පාසලකට. ඒ සමඟම මට එහි ක්‍රිකට් කණ්ඩායමට සම්බන්ධ වෙන්න ලැබුනා. පළමු වාර විභාගයෙන් ළමයි 45ක ගෙන් මම 25 වෙනියා; ලැජ්ජාවේ බැහැ.ගෙදර කට්ටිය බලාගෙන ඉන්නේ මගේ අලුත් වැඩ කොහොමද කියලා බලන්න. මම 25 මාරු කරලා 5 කරා; 2 තියෙන තැන ටිකක් තදේට බ්ලේඩ් එකෙන් පීවා. ඒත් වෙනසක් පේනවා. මම අනිත් පැත්තේ ලිව්වා 'ඉහත වැරදීමක් මේ ළමයා 25 නොව 5' කියලා.අපේ ගෙදර ඉන්නෙත් මං ජාතියේම අය, වැඩේ අතේ මාට්ටු. අන්තිමට තාත්තා අම්මාව ඇරියා ඇත්ත නැත්ත දැනගන්න. දැන් මම ලොකු මිනිහෙක්, අපේ අක්කා සමහර දාට මේක මතක් කරලා තාම හිනා වෙනවා.

265. දවසක් අපි කෙල්ලෝ, දවස පුරාම ඉස්කෝලේ ක්‍රිකට් ගැහුවා. මහන්සිය වැඩිම වෙලා ගිහින් බිත්තියක් දැතින්ම අල්ලා ගත්තා, ඇස් පියාගෙන. ටීචර් කෙනෙක් දැකලා බයවෙලා, මාව ළමයි ලවා උස්සලා ගෙනිච්චා ලයිබ්‍රරි එකට. එතනදී පවන් ගහලා, වතුර පොවලා, ගෙදරට කෝල් කලාම තාත්තා ආවා රූං ගාලා ඔෆිස් එකේ සේවිකාවක් එක්ක. මම එපා කියද්දී ඒ අය මාව ඇක්සිඩන්ට් සර්විස් එකට ගියා. එතනින් එක්ස්රේ අරං නිදහස් කළා. ගෙදර ගියාම අම්මාට වැඩියෙන්ම දැන ගන්න ඕන කලේ තාත්තා මොන සේවිකාව එක්කද ආවේ, එයා ඉඳගෙන හිටියේ කාර් එකේ ඉස්සරහද, පස්සේ සීට් එකේද කියලා. ඇය හිටියේ පස්සේ සීට් එකේ කියලා ඇත්ත කිව්වා.

266. අපි කන්තලේ ඉන්න කාලේ තාත්තා ලොරියක් එලෙව්වා, එත් හැමදාම වැඩ නැහැ. මම උසස් පෙළ කෙරුවේ උදේට ඉස්කෝලේ ගිහිල්ලා හැන්දෑවට ටව්මේ හෝටලේක වලන් පිගන් හෝදන රස්සාවක් කරන ගමන්. ගොඩක් දවස් ඉස්කෝලේ ගියේ පයින් බස් එකට සල්ලි නැතුව. වැඩ ඇරිලා සමහර දවසට km 10 ඇව්දලා තියෙනවා, අලි ඉන්න පාරේ. තාත්තායි අම්මායි දන්නේ නැහැ මම පයින් ගාටන බව. අද මම ශීත කාමරේක ඉංග්‍රීසියෙන් කථා කර සෙක්‍රටරිස්ලාට ලියුම් ඩික්ටෙට් කරනවා. හවසට කාමරේ වැකුම් කරන්න එන වයසක මිනිහා මට කථා කරන්නේ සර් කියලා. මිනිහා කොළඹ සෙන්ට් තෝමස් කොලිජියේලු ඉගනගෙන තියෙන්නේ.

267. මම ගියේ කොළඹ 7 උසස්ම පිරිමි විද්‍යාලයකට. හැම සඳුදාම උදේ වැඩ පටන් ගන්නේ ස්කූල් ඇසෙම්බ්ලි එකෙන්. මුළු ඉස්කෝලෙම සහභාගී වෙනවා ඒකට. 'දවසේ සිතුවිලි කතාව' කරන්නේ ටීචර් කෙනෙක්, ඉංග්‍රීසියෙන්. ඉස්කෝලේ ගොඩක්ම හිටියේ ටයි කෝට් දාන සර්ලා සහ ජැන්දියට අඳින මිස්ලා. ගුණපාල කියලා සිංහල උගන්වන සර් කෙනෙක් හිටියා. බස් එකෙන් එන්නේ. එයා ඇන්දේ ආර්ය සිංහල ඇඳුම. හොඳට විට එහෙම කාලා දත් රතු වෙලා හිටියේ. ඒ සර්ට ඉස්කෝලේ වෙන යාලු සර්ලා නොහිටපු ගානයි. ඉන්ටර්වල් එකට ස්ටාෆ් රූම් එකේ කොනකට වෙලා ඉංගිසි පත්තරයක් බල බල ඔහේ ඉන්නවා. ළමයි, අනෙක් ගුරුවරු ඔය සර්ව අල්ලාගෙන නිතරම සරදම් පාඨ කතා කරනවා – ඉංග්‍රීසි නොදන්නා සර් බොරුවට ඉංග්‍රීසි පත්තරයකින් මුහුණ වහගෙන ඉන්නවා කියලාත් කියනවා. ඔන්න එදා එයාගේ නම කියවුනා 'දවසේ සිතුවිලි කතාව'ට. කන් පැලෙන්න අත් පුඩි පාරක් ආවා. 'උසස් පවුල්වල' උඩඟු ළමයින් එදා අත්පුඩි ගැහුවේ සරදමට, මොකද මෙතෙක් කිසි ගුරුවරයෙක් සිංහලෙන් 'දවසේ සිතුවිලි කතාව' කරලා නැහැ. මෙතුමා සිංහලෙන් මුල් ගුරුතුමාගෙන් අවසර ඉල්ලනකොට මුළු සභාවම මහා හයියෙන් හිනා උනා, සෙසු ගුරු මණ්ඩලයත් එක්ක, මුල් ගුරුතුමාටත් හිනා ගියා. ගුණපාල සර් අද නම් හොඳටම පල් වෙනවා කියලා මට දුකක් ඇති උනා. 'අනේ සර් ගිහිල්ලා ඉඳගන්න' කියලා පුංචි සිතින් මටම කියා ගත්තා. මෙන්න විනාඩි 2ක් විතර ගියාට පස්සේ මේ මනුස්සයා ඉංග්‍රීසියෙන්

දේශනය  කරන්න පටන් ගත්තා; ඉතා චතුර සහ විචක්ෂණ ලෙස - තල් අත්තට බොරළු වැටෙනවා වගේ තඩි, විශාල, ලස්සණ, ඉංග්‍රීසි වාග් මාළාව හරියට ගලා යන නදියක් වගේ. මම හිතන්නේ ගොඩාක් ගුරුවරුන්ටත් තේරුනේ නැහැ, ඒ තරමට අධ්‍යාත්මික බවින් උසස්, ඉහලම මට්ටමේ ඉංග්‍රීසි වලින් කරන ලද කථාව. එයාගේ දේශනය තිබුනේ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේ වැදගත්කම පිළිබඳවයි. මට එහා පැත්තේ හිටපු උගත්, මිතුරා මට  හොරෙන් මිමිනුවා 'මේ මනුස්සයා කථා කරන්නේ නියම කේම්බ්‍රිජ් ඉංග්ලිෂ්' කියලා.  හරියට පැයකින් කතාව ඉවරවුනා.  මීයට නිශ්ශබ්ධව තිබුණු සභාවේ හැමෝම විනාඩි 2ක් පුරා අත්පුඩි ගැහුවේ වාඩිවී සිටි අසුන් වලින් නැගිට, හිටගෙන. එදායින් පස්සේ කිසි කෙනෙක් (ගුරුවරු ඇතුළු) ගුණපාල සර්ට හිනාවෙන්න ගියේ නැහැ.

268.	වැස්ස දවසට පාසල් යන්න හරිම කම්මැලියි.උදෙන්ම අම්මාට මොකක් හරි නැති ලෙඩක් කියලා දවල් වෙනකන් නිදා ගත්ත කාලය මතක් වෙනවා. දවල්ට වත්ත පහල පොකුණේ ලස්සන ලස්සණ මල් පිපිලා; ලස්සණ පාසි උඩ පාවෙනවා. ඒවා බලන්න යනවා වැස්සේම.  කලින් හිටපු ඉස්ගෙඩියෝ දැන්ගෙම්බෝ වෙලා කොහේදෝ හැංගිලා ඉඳන් බක බක ගානවා.

269.	අම්මා කෙනෙක් සමග ඇයගේ පුංචි පුතා ලඟින් වාඩිවෙලා ඉන්නවා, අලුත් ඉස්කෝල්ලේක සම්මුඛ

පරීක්ෂණයකට මුහුණ දෙන්න. පුතා අම්මට කියනවා 'අම්මා ඔයා තමයි මේ ලෝකේ දෙවෙනියටම ලස්සනම කෙනා'. 'කවුද එතකොට ලස්සනම කෙනා' අම්මා ඇසනවා. 'ඒත් ඔයාම තමයි,හැබැයි ඒ ඔයා හිනාවෙනකොට'.

270. ඉස්කෝලේ යන කාලේ එක කකුලක තුවාලයක් නිසා එකකට සෙරෙප්පුවකුයි අනිකට සපත්තුවකුයි දාගෙන යනවා. උප විදුහල්පති වරයෙක් හිටියා බොරුවට වැරදි හොයන. දවසක් ඩිටෙන්ෂන් කියලා ඉස්කෝලෙන් පස්සේ මාව තියා ගත්තා. හවස අම්මා තාත්තාට විස්තරේ කීවාම තාත්තා කිවා 'මෝඩ මිනිහෙක් කියලා'. මට නේද හරි සැටිස්. මොකද ලේසියෙන් තාත්තා මගේ පැත්ත ගන්නේ නැහැ.

271. මාත් දවසක් ගංජා සුරුට්ටුවක් බීලා කුරුම්බා ගහකට නැග්ගා. මම ගහෙන් බහිනවා බහිනවා ඉවරයක් නැහැ. ඒ තරම් ගහ උසකුත් නැහැ. පැයක් විතර බැහැලා බිම බලනකොට තව ගොඩක් බහින්න ඕනෑ. පස්සේ මගේ යාලුවෙක් ඇවිත් මාව ගෙදර අරන් ගියා. මට පොලව දුරින් වගේ පෙනුනට මම ඉදලා තියෙන්නේ බිම ඉදගෙන ගහ බදාගෙනලු. ඒ මගේ ප්‍රථම සහ අන්තිම ගංජා සුරුට්ටුව. අත්හදා බලන්නවත් නොබොන්න.

272. මම ගියේ ජෝය්ස් ගුණසේකරගේ මොන්ටිසෝරි එකට කොළඹ 5හේ. හරිම කරුණාවන්ත නෝනා

කෙනෙක්, ඒ වගේමයි එතන උගන්නපු 'ඇන්ටිලා'- සීතා ඇන්ටි, සෝමා ඇන්ටි වගේ. ජෝයිස් නෝනා අවුරුදු 100ක් සම්පූර්ණ කරලා මැරුනේ මේ මෑතකදි. මොන්ටිසෝරිය ඉවර වෙලා සමහර දවස්වල අම්මාත් එක්ක ගෙදර එන්නේ තිරික්කලේන්. අම්මා දෙන්නේ රුපියලයි. නාකි දෙමල මිනිහෙක් ගොඩාක් වෙලාවට තිරික්කලේ පැද්දේ. 1963 විතර එවකට රජය තිරික්කල් තහනම් කළා.

273. දවසක් සර් ඇවිල්ලා කිව්වා. ළමයි විභාගෙට සති දෙකයි තියෙන්නේ. ප්‍රශ්න පත්තර අච්චු ගහන්න දීලත් ඉවරයි. ඔය ළමයින්ට මොකුත් ප්‍රශ්නයක් එහෙම තියනවද කියලා? එකෙක් ඇහුවා අච්චු කන්තෝරුවේ නම සහ ලිපිනය මොකද්ද කියලා.

274. හොස්ටල් එකේ හිටපු බයලොජි සර් නොවරදවාම හොස්ටල් කෑම කාමරේට එනවා විභාග දවසට ඉස්සරින්දා රෑට. ප්‍රශ්න පත්තරෙන් භාගයක් විතර නොකියා කියනවා. හොස්ටල් ළමයි හැමදාම බයලොජි වලින් වැඩි ලකුණු ගන්නවා.

275. අපි ඉස්කෝලේ යන කාලේ දැන් වාගේ ඔය කියන මෝදක වගේ ජරාවල් තිබුනෙත් නැහැ,අපි දන්නෙත් නැහැ. හැබැයි මායිම් වැටට එහායින් අඹ අච්චාරු ආච්චි අම්මා නම් හිටියා හිනාවෙවී. අම්මාට දාහක් වැඳුම් වැඳලා

ඉල්ලගන්න සල්ලි අරගෙන දුවලා ගිහින් නැවතෙන්නේ අඹ අච්චාරු ගන්න ඒ ආච්චි ගෙන්.

276. මට අවුරුදු 14 විතර කාලේදී ඉස්කෝලේ ගිහින් ආපු මට අම්මා කිව්වා 'මාර්කට් එකට ගිහිල්ලා වම්බටු 500 කුයි අමුමිරිස් 100 කුයි ගෙනෙන්න' කියලා. මම අම්මාව කේන්ති ගස්සන්න හිතාගෙන 'මොනවද අම්මේ කිව්වේ බටු 100යි, මිරිස් 500යි නේද?' කියා. මේක මම පස් හය සැරයක්ම ඇහුවා. අම්මට වස කේන්තියි. මාර්කට් එකට ගිහිල්ලත් වැරදිලා මුදලාලිගෙන් අමුමිරිස් 500 අරගෙන, වම්බටු 100 ඉල්ලනකොට, 'ළමයා මොකටද හත්මාලුවකටද' කියලා මුදලාලි අහනකොට තමා මට අවුල තේරුනේ. මම සද්ද නැතුව 'ඔව්' කියලා එන්න හදන කොට මුදලාලි කිරන්නෙම නැතුව මල්ලට දැම්මා වමබටු කරල් දෙකක්. ගෙදර අරන් ඇවිල්ලා අම්මගෙන් ලුණු ඇඹුල් ඇතුව අහ ගත්තා විතරක් නොවෙයි පාරකුත් කෑවා.

277. කොළඹ තියෙන ලොකු ඉස්කෝලෙක වැඩ කරපු කෙනෙක්, 2001 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ පිරිමි පාසැලක විදුහල්පති කෙනෙක් වෙලා ආවා. විනය කියලා ඉස්කෝලේ කෑවා. කැඩෙටින් කරන, හමුදාවේ වැඩකරන්න බලා හිඳපු ළමයින්ගේ කටේ හුණු කැලි දමපු මනුස්සයෙක්ව විනය බාර ආචාර්යවරයා ලෙස පත් කළා. ඊට පස්සේ හොඳම ගුරුවරු නිකන් ප්‍රශ්න ඇති කරගෙන ඉස්කෝලෙන් යන තැනට ගෙනාවා. ඉස්සර ලංකාවේ රෑන්ක්ස් ගත්ත මම

උගන්නපු ඒ ඉස්කෝලේ කාලාම දැම්මා. ළඟදි ඉස්කෝලෙට ළමයෙක් ගන්න අල්ලස් අරගෙන වැඩ තහනම් උනා කියලා පත්තරෙන් දැක්කා. එත් ඉතින් ඊට පස්සේ අමාත්‍යංශයේ ලොකු තනතුරක් හම්බුවෙලා හොඳට වැඩ ටික කරගෙන යනවාලු. මෙහෙම අය ඉන්නකන් ලංකාවේ ඉස්කෝල ටිකට දෙයියන්ගේ පිහිට තමා.

278. ඉස්සර අපේ ගෙට අල්ලපු වත්තේ ඇන්ටි කෙනෙකුගේ පැණි දොඩම් ගහේ ගෙඩි ඉදිලා අතු බිමට බරවෙලා තිබුනේ. මේක දුටුවිට නංගියි මමයි ඉස්කෝලේ ඇරිලා ඇවිල්ලා අල්ලපු වත්තට පැනල ගෙඩි කඩනවා. මේක දැක්ක ගමන් ඇන්ටි කෑ ගහලා එලෝගෙන එනවා. එතකොට අපි දුවන්නේ නැතිව හයියෙන් කියනවා ’මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබේ. නංගිටයි මටයි ගෙඩි දෙකක් ඇතියි, වැඩිය කඩන නරක ළමයි නොවේ අපි' කියල, එතකොට ඇන්ටි කියනවා ‘හා එහෙනම් ගෙඩි දෙකක් විතරක් කඩාගෙන යන්න’ කියලා.

279. මම පොඩි කාලේ අමාරුවෙන් සියල් පෑනක් සල්ලිවලට ගත්තා ළඟ තිබ්බ දෙමළ කඩයකින්. තීන්ත දාන්න ගිහින් හැමදාම යුනිෆෝම් එකේ තීන්ත ගාගන්නවා. ඒ දෙමළ කඩෙන් රට බඩු ගන්න ඇතුලට ගියවිට විහිදුනු සුන්දර, මිහිරි සුවඳ තාම මතකයි.

280. මම 4 ශ්‍රේණියේ පන්තියේදී පන්තියේ 1 වැනියා උනා. තාත්තා සතුට වැඩිකමට මහරගම සමන් පොත්

හලෙන් 'පාකර් 51' පෑනක් මට ගෙනත් දුන්නා. ඒ දවස්වල තිබුන හොඳම පෑන ඒකයි.

281. ඉස්කොලේ ටර්ම් එක පටන් ගන්න දවසට ඉස්සෙල්ලා තාත්තා අපට හෝම් රන් පැස් පාට චෝක් ගෙනත් දෙනවා, පිටකොටුවේ මැකලම් පොත් හලෙන්. හරි සුවඳ චෝක්. ඉස්කෝලේ යන්න ඉස්සෙල්ල නංගියි මමයි චෝක් ටික ඉවර කරගන්නවා, තාත්තා ගෙනත් දීපු ලොකු ඩ්රෝයින් පොත් වල ඇඳලා.

282. මම පාසල් යන කාලයේ 1950 -1965 මගේ දෙමව්පියන් මට දිනකට දෙන ශත 10 ත් සමහරවිට ඉතුරු කරගෙන ඒවායින් වසර අවසානයට සපත්තු කුට්ටමක් ගැනීමට යොදාගන්නවා.

283. ඉස්කෝලේ යන කාලේ ගෙදර එකතුවෙන පරණ පත්තර එකතුකරලා විකුනලා රුපියල් 400ක් සොයා ගත්තා මං. ඒකෙන් ගත්තා ගැසල් බයිසිකලය ඒ දවස්වල තිබ්බේ හොඳම බයිසිකල් තමයි හම්බර්, රෝඩ් මාස්ටර්, රීගල් සහ ගැසල්. ඔය බයික් එකෙන් මම ගාල්ලේ/මාතර නොගිය තැනක් නැහැ.

284. ඉස්කෝලේ ඉන්ටර්වල් එකට යෙහෙලියක් එක්ක දුවනවා ලඟු කැලේ මැදින් අපේ ගෙදරට, මොනවා හරි කාලා එන්න. දවසක් යනකොට ගෙදර කවුරුවත් නැහැ,

වහලා. අපි වහලා තිබුණු ජනේලයක් ඇරලා ඇතුලට පැනලා, කාලා ආපහු ඉස්කෝලෙට දිවුවා. යනකොට ඉන්ටර්වල් එක පහු වෙලා විනාඩි 15ක් ගිහිල්ලා. ටීචර්ට බොරු කිවා, එත් අපිව පන්තියෙන් එලියට දැම්මා. අම්මා දවල් වෙලා ගෙදර ඇවිල්ලා ජනේලයක් ඇරලා තියෙනවා දැකලා හොඳටම බයවෙලා. කවුද පාන් එහෙම කාලා ගිහිල්ලා තියෙනවා දැක්කහම දැනගෙන තියෙනවා මගේ (ලොකු දුගේ) වැඩක් කියලා.

285. කහබිලියා කෝටුවෙන් ගුටි කාලා තියෙනවද? අපේ ලොකු තාත්තාව ආදරයෙන් මතක් වෙනවා.

286. මගේ දුව මොන්ටිසෝරි යන කාලේ (අවුරුදු 30ට විතර ඉස්සර) හැම දාම එක්කෝ පැන්සල නැහැ. එක්කෝ මකනය නැහැ. ඇහුවම කියන්නේ ළමයෙක් ගත්තා කියලා. මම ඕක ටීචර් ගෙන් අහන්න හදන කොට දුවගේ තාත්තා කියනවා ඔය නැති බැරි ළමයෙක් ගන්න ඇති මොකටද ඕවා අහන්න යන්නේ ටීචර්ලාගෙන් කියලා. ඔය විදිහට හැමදාම මොකක් හරි අපේ දුවගේ බෑග් එකෙන් අඩුයි. අන්තිමට බලන කොට හැමදාම එකම ළමයා තමයි මේ වැඩේ කරලා තියෙන්නේ. දැන් ඒ ළමයා මොනවා කරනවා ඇද්ද?

287. 2කේ ශිෂ්‍යයත්වයෙන් පාස් වෙලා, ගාලු දිස්ත්‍රික්කයෙන් පළවෙනියා වෙලා, ‘වැලන්ෂියා රූපසිංහ’ ශිෂ්‍යයත්වය මට හිමිවුණා, කොළඹ ආනන්ද කොලීජියට

ඇතුල් වෙන්න. ඉස් ඉස්සෙල්ලම කොළඹ ආපු දිනය, හොඳ මාමා එක්ක. පරනවාඩිය කිට්ටු කරද්දී මාර වු බරක් අවා. මාමා කිවා අර කොනට ගිහිල්ලා ඉක්මනට කරලා එන්න පුතා කියලා; සුද්දගේ කාලේ නීති තද හින්ද මාමත් බයෙන් කිවුවේ. පරණ ඇට්ලස් හෝල් බිල්ඩිම (අද තක්සේරු මන්දීරය) දැන් තියෙන තැනට එහා පැත්තේ එතකොට තිබුනේ පරණ වලව්වක් වගේ තට්ටු දෙකේ බංගලාවක්. එතන මුල්ලේ, කරනකොට, ගෙදර උඩු මහලේ කාමරයක සිට නෝනා කෙනෙක් දත් විලිස්සමින් මා දෙස ඉතා තරහින් බලා සිටියා දුටුවා. ඉක්මනට මගේ වැඩේ කර, මාමාට මුකුත් නොකියා ඔහු වෙත ගියා. ඒ, ඉන්පසු අවුරුදු **80**ක් මා ජීවිතය ගතකල, මා ප්‍රියතම කොළඹ නගරය, එදා මා පිළිගත් හැටියි ඒ.

288. කුළරත්න මහත්තයා මුල් පුටුව හෙබවූ අන්නන්දයේ මා ශිල්ප හැදෑරුවේ ලක්දිව ගුරු පඬිවරුන් සේ සලකන බලන්ගොඩ ආනන්ද මෛත්‍රී ස්වාමින් වහන්සේ, LH මෙත්තානන්ද, කේයස් (පසුව හිමි) ගුරුභවතුන් යටතේයි. ආනන්දයේ 'බෝසත් ළමා සමාජයේ' සභාපති දූරන්ධරයට මා පත් කර ගත්තා. සෙසු සාමාජිකයන් අතර ආනන්ද තිස්ස ද අල්විස්, රණපාල බෝධිනාගොඩ, LDH පීරිස්, PL බර්ටි සිල්වා ආදීන් සිටියා.

289. **1968** දී විතර, මට අවුරුදු **4** දි විතර, කොළඹ හැව්ලොක් පාරේ, පොලිස් පාර්ක් එක ඉස්සරහ අපේ ගෙදර

ඉස්සරහ පැරපට් වෝල් එක උඩට වෙලා පාරේ යන වාහන වර්ග අඳුනන තරගයක් කළා පොඩි අයියාත් එක්ක. කාර් එක එන කොට හරියට කියන්න ඕන වර්ගය මොකද්ද කියලා. ඒ දවස්වල ඔය ජපන්/කොරියන් වාහන තිබුනේ නැහැ - තිබුනේ මොරිස් මයිනර්, වොක්ස්වැගන්, කොන්සල්, හම්බර්, කැඩිලැක්, ප්ලිමත්, පර්ජෝ, හෝල්ඩන්, රෝල්ස් රෝයිස්, රෙනෝල්ට්, සන්බීම්, කේම්බ්‍රිජ්, ඕපල් (රෙකෝඩ්, කපිටාන්), ෆියට්, 'තල්ලු' ෆෝඩ්, බේබි ඔස්ටින් වගේ යුරෝපිය වාහන. හැප්පුනත් තැලෙන්නේ නැහැ ලේසියෙන් ඒවා.

290. දවසක් මම තනියෙම පැරපට් වෝල් එක උඩට වෙලා ඉන්න කොට රිය අනතුරක් වෙලා බයිසිකල් කාරයෙක් මැරුණා. එයා මෙඩිකල් ස්ටුඩන්ට් කෙනෙක්, බයිසිකලේ ඉස්සර කරන්න ආපු වාහනය එයාගේ ඔලුවේ හැපිලා මරුනේ. තව දවසක් තඩි ආමි ලොරියකට පොඩි අළු පාට බේබි ඔස්ටින් එකක් හැප්පිලා චප්ප වෙලා ගියා.

291. දවසක් හවස මහා ට්‍රැෆික් මැද්දේ, හැව්ලොක් පාර දිගේ අශ්වයෙක් වේගයෙන් දුවගෙන යනවා, කාර් එක්ක, එක පෙළට. අශ්වයාව ආර්මි එකෙන් අල්ලාගෙන තියෙන්නේ (වෙඩිතියලා), කිරුලපොන පාක් එකත් පහු කරලා නුගේගොඩ හන්දියට කිට්ටුව. කොහෙන් ආව අශ්වයෙක්ද කියලා අපිට දැනගන්න ලැබුනේ නැහැ. සතියකට වගේ පස්සේ තාත්තා වැඩ ඇරිලා ඇවිත් කිව්වා

'රේස් කෝස්' එකෙන් පැනලා ආපු අශ්වයෙක්ලු. ආර්මි එකෙන් වෙඩි තියලා මරලා නවත්තලා තියෙන්නේ.

292. **1965** විතර, දවසක් මම උදේ ගෙදර ඉන්නකොට (මම ඇතකොට දවල් ඉස්කෝලේ ගියේ) අබේනයාක ඇන්ටි ඉස්සරහ බෙල් එක ගහල 'අම්මා කෝ බබා' කියලා මගෙන් අහනවා. මම හොයන්න ඇතුලට යනකොට 'අබේනායක ඉස්කෝලේ මහත්තයට හොඳටම අමාරුයි බබා' කියලා ඇන්ටි දුකින් මට කිවුවා. එයා අඬනවා වගේ. මුකුත් නොතේරුන මම අම්මා හොයාගෙන ඉස්සරහට ආවා. වාහනයක් ඇතුලේ අපේ ගෙදරට නිතරම ආව ගිය අබේනායක ඉස්කෝලේ මහත්තයා ඉන්නවා පපුව අල්ලාගෙන, හුල්ල හුල්ල . අම්මත් ලැස්ති වෙලා ඒ කාර් එකෙන්ම ඇක්සිඩන්ට් වෝඩ් එකට ගියා. අබේනායක ඉස්කෝලේ මහත්තයාට එදා හර්දයාබාදයක් හැදිලා මම දන ගත්තේ පසු කාලෙකදී. එයා නැතිවුනේ නම් මේ ලඟකදී.

293. **1966,** අපි කොළඹ **7** ස්පැතෝඩියා ගාර්ඩන්ස් හී ඉන්න කාලේ මම උදේට ඉස්කෝලේ ගියේ ස්කූල් වෑන් එකෙන්. ඒක මොරිස් **J2** සැහැල්ලු බස් රථය. ළමයි **12**ට යන්න පුළුවන්. ආනන්ද කොලේජ් එකේ දම් පාට සහ තැඹිලි පාටට වෑන් එක ලස්සනට පේන්ට් කරලා තිබුනා.

294. මම ගෙදර ගිහින් කියන්නේ ලකුණු **100** කියලා. නමුත් ඇතටම වැඩ හතරකටම තමයි **100.** ගණන් **20** , සිංහල **35**, ආගම**35**, ඉංග්‍රිසි **10.**

295. **10** වසරේ ඉන්න කොට අවසානේ වාර විභාගේ ප්‍රතිපල දුන්නේ පාසලේ නිවාඩු දෙන දවසේ. රිපෝට් එකේ සිංහලයි බුද්ධාගමයි සමාජ අධ්‍යනයයි හැරෙන්න අනිත් ඔක්කොම විෂයන් වලට ලකුණු **35** ට අඩුයි. අම්මා තාත්තාට මීට පෙර කියල තිබුණා 'දැන් කොල්ලගේ නැටිල්ල වැඩියි' කියලා. තාත්තා අනතුරු අඟවල තිබුනේ. අම්මා කිව්වා ලකුණු අඩුවෙන් අරගෙන එහෙම ගෙදර එන්න එපා කියලා. දැන් මොකද කරන්නේ. ගත්තා මකනේ මැකුවා ඉලක්කන් ටිකම. **65** යි **80** අතර ලකුණු දා ගත්තා හිටියේ **26** වෙනියා වෙලා. ඒකත් **6** වෙනියා කරගත්තා. ගියා ගෙදර. අම්මා රිපෝට් එක ඉල්ලුවා, මමත් පැනල දුන්නා. දෙපාරක් අම්මා ඔලුව හෙල්ලුවා. හිනා වුනා. තාත්තාට හොරෙන් කෝල් කලා. මැන් දුවගෙන ආවා කඟවේනා වගේ, ආවේ, 'වංක වැඩ' කියලා ගුණසේන එකෙන් ගහපු පුංචි පොතකුත් අර ගෙන. දෙන්නම මට ගැහුවේ නැහැ. ඊළඟ ටර්ම් එකේ ඉඳලා මාව හොස්ටල් එකේ බෝඩ් කළා. මේගොල්ල මට කියන්නේ නැතුව ප්‍රින්සිපලුත් හම්බ වෙලා. තාත්තා තදයා හින්දා ප්‍රින්සිපල් මට කථා කලේ 'පුතා' කියලා. කිසිම ප්‍රශ්නයක් ඇති උනේ නැහැ.

296. මගේ ලකුණු මාරු වෙලා රිපෝර්ට් එකට වැටිලා තියෙන්නේ කියලා ගෙදර ඇවිල්ල කිවුවා, 39 වෙනියා හොඳ නැති නිසා.

297. 'අනේ,අනේ, මගේ ලකුණු හොරා ගත්තා නේද' නංගි ලොකු අක්කාගෙන් ඇහුවා. නංගිගේ සාමාන්‍යය 35යි, අක්කාගේ 75යි.

298. දවසක් යාලුවෝ එක්ක එකතු වෙලා පේර කඩන්න ගියා පාසලට යාබද වත්තක. ආපසු එද්දී ගේට්ටුවෙන් ඇතුලු වෙනකොට තරු පෙනුනා. විවේක කාලය අවසන් වෙලා නිසා. වතුර බොන්න ගිය විදිහට පන්තියට ඇතුළු වුණා. එහෙත් අපි කාගෙවත් පොත් බෑග් නැහැ පන්තියේ. අපි ළමයෙක්ගෙන් ඇහුව්වා කෝ අපේ බෑග් කියලා? එයා කිවුවා උප විදුහල්පති අරගෙන ගියා කියලා. කට්ටියටම ඔෆිස් එකට එන්න කිවුවාලු බෑග් ගන්න. කව්රුත් බයයි ඔෆිස් එකට යන්න. අපිව දැකලා උප විදුහල්පති 'ආ ළමයි මොකද මේ වෙලාවේ? කට්ටියම ඔෆිස් එක ළඟ'? අපේ බය ටිකක් අඩු වුණා සර් හොදින් කතා කළ නිසා. 'සර් අපේ බෑග් ගන්න'. 'මොන බෑග්ද ළමයි'? අපි වතුර බොන්න ගිය විදිහට සර්ට කිව්වා, එනකොට බෑග් නැහැ කියලා. සර්රුත් අපිත් එක්ක ඇවිල්ලා පන්තියට 'කෝ මේ ළමයින්ගේ බෑග්' කියලා ඇහුවා. ඔෆිස් එකට යන්න කියපු ගැහැනු ළමයා අපේ බෑග් පන්තියේ කබඩ් එකට දාලා. එදා ඒ ගැහැනු ළමයා ගුටි කෑවා හොදට. පස්සේ දන්නේ අපිව බය කරන්න

විහිලුවට කරපු දෙයක් කියලා.එයා හිතුවේ නැතිලු අපි ඔෆිස් එකට යයි කියලා. අපිත් ගියා නෙමෙයි යැවුනා බයට.

299. වැස්ස දාට ටීචර්ලා එන්නේ නැහැ. පන්තියේ ඉන්නෙත් ළමුන් ටික දෙනයි. නාපු ලමයිගේ කිරි, කිරි මන්ඩලයේ පාස්වරිකර්ණය කල චෝකලට්, වැනිලා කිරි බෝතල්, බි බි පැලෙන්න එක එක විදියේ හොල්මන් කථා කියනවා ළමයිනට, හද හද. එක දවසේ කිරි බෝතල 4 බීපු දවස් තියෙනවා. ළමයි මගේ දිහා බලන් හිටියේ, ඒගොල්ලොත් හරියට හොල්මන් වගේ. සමහර දවස්වලට ටින් ටින් පොත් ගෙනිහින් රස කර කර ළමයිට කියලා දෙනවා.

300. පුංචිම කාලේ ඉස්කෝලේ ඇරිලා ආවට පස්සේ ගෙදර වැඩට හිටියා සේවිකාව මාව සවස 4ට විතර නාවලාහොඳට පව්ඩර් දාලා පිරිසිදු ඇඳුම් අන්දලා එක්ක යනවා ලේන් එකේ උඩ පහලට ඇවිද්දවන්න. දවසක් කටකාර මිනිහෙක් මාව දැකල කියනවා ‘ඔහොම පව්ඩර් දැම්මොතින් නමක් වැටේවි, පව්ඩර් බබා කියලා’.

# • සිඟන්නෝ

301. එක දවසක් මම කුරුණෑගලට බස් එකේ යද්දී තරුණ පිරිමි ළමයෙක් නැග්ගා. එයා බස් රියදුරෙක්ලු. අනතුරක් වෙලා මැහුම් බර ගානක් දමලා දැන් ඒක කපා ගන්න සල්ලි නැලු. ෂර්ට් එකේ බොත්තම් ඇරලා පෙන්නුවා විස්වාස කරන්න බෙල්ල ළඟ ඉඳන් බඳ ළඟටම මැහුම්. කාරණේ ඇත්ත, මට කැරකිල්ල වගේ ඒක දැකලා. හැමෝම ලොකු කොළ වලින් දුන්නා. පස්සේ දැන ගන්න ලැබුනා මිනිහා කියන හැමදේම ඇත්ත. ඒත් එයා කවදාවත් ඔය මැහුම් කපන්නෙ නැහැල්ලු. හැන්දෑවට ටවුමෙම කොහේ හරි නිදිලු.

302. මම කොළඹ ලංගම බස් නැවතුමේ බුලත්කොහුපිටිය බසයට නැගීමට සිටිනවිට අසරණ පුද්ගලයෙක් පැමිණියා. ‘මහත්තයෝ මම ඉස්පිරිතාලෙන් ටිකට් කපල ආවේ. මට ගෙදර යන්න බදුල්ලට ටිකට් එකක් ගන්න සල්ලි නෑ උදව්වක් කරන්න. පින් සිද්දවෙයිකියලා කිව්වා. මම කිව්වා ‘හරි මම ටිකට් එකක් අරන් දෙන්නම්’ කියල. එතකොට කියාපි ‘අනේ එහෙම හොඳ නැනේ මහත්තයෝ එක් කෙනෙකුටම කරදර කරන්න, මහත්තය බාගයක් දෙන්නකෝ මම අනිත් ටික තව කාගෙන් හරි ඉල්ලා ගන්නම්’ කියල. මම ‘ඒකට කමක් නෑ’ කියල බදුල්ල බස් එකට එක්ක ගිහින් ටිකට් එකක් අරන් දුන්න මිනිහට. දැන් මමත් මගේ බස් එකට පෝලිමේ ඉන්නවා. අර මනුස්සය අර

ටිකට් එක බදුල්ල පෝලිමේ වෙනත් මගියෙකුට පෙන්නලා මොනවදෝ කියනවා. මට වහාම වැටහුනා. මම ගිහින් ඒ මගියාට කිව්වා 'මමයි මේ මිනිහට ටිකට් එක අරන් දුන්නේ. මේක විකුණන්න නේද හැදුවේ' කියල. ඒ මගියා කිව්වා 'ඔව් මේක අඩු ගානට විකුණනවා කියලා කිව්වා, සැක නම් කොන්දොස්තර මහත්තයගෙන් අහල බලලම සල්ලි දෙන්න කිව්වලු. 'අසරණයා' මගෙන් ගුටි නොකා ගියේ ටිකක් මහලු පෙනුමක් තිබුණු නිසා. මම ටිකට් එක ඉල්ලගෙන අරන් ඉරල දැම්මා.

303. 'හරි බඩගිනියි මහත්තයා, දවස් ගානකින් කෑවේ නැහැ, මට කියක් හරි දෙන්න' කියා සිඟන්නෙක් සිඟමන් ඉල්ලුවා. 'උඹ සිඟන්නෙක් කියලා නම් පෙන්නේ නැහැ, ඉඳා මේ රුපියල් 2 ගනින්, කොහොමද උඹ සිඟන්නෙක් උනේ, කියපන් කියා ඒ මහත්තයා ඇසුවා. 'මමත් සර් වගේ තමයි, ඕනාවට වැඩිය වියදම් කළා' කියා සිඟන්නා කිවා.

304. ලස්ස්සන, වටිනා පිත්තල භාජනයක් රැගෙන හොඳට ඇඳගත් සිඟමන් යදින චීන හිගන්නෝ දැක්කහම ඇතිවන්නේ දුකක් නොව සිනහවකි. ලංකාව දැන් පොහොසත් රටක්ද කියලත් හිතෙනවා. රුපියල් 2වත් උන් වදිනවා, අපේ හිගන්නෝ බනිනවා.

305. කොළඹ දැරණියගල බස් එකට ඔරුගොඩවත්ත හන්දියේදී දි ළමා පොත් වෙළෙන්දෙක් නැග්ගා. පොත් තුනම රුපියල් 100 යි. මිනිහා සැහෙන්න ට්‍රයි කළා පොත්

කියක් හරි විකුණගන්න. හරි උත්සහවන්ත මිනිහෙක් 40ක් විතර වයස ඇති. බස් එකේ සිට් ගානට මිනිස්සු හිටියා, ඒත් එක්කෙනෙක්වත් පොත් ගත්තේ  නැහැ. ටිකක් දුර යනකොට ලැමිනෙට් කරපු බුද්ධ රූප, ක්‍රිස්තු රූප විකුන්නනෙක්, 50ක විතර වයස නැග්ගා, මිනිහත් කෑ ගහලා අනේ හිස් අතින්ම බැස්සා. ඔන්න වැල්ලම්පිටියේදී (බොරු) නොන්ඩියක් ගහපු තරුණ කොල්ලෙක් නැග්ගා 30ක විතර - හිඟන්නෙක්. කිහිල්ල යට කළු උපන් ලපයක්ද මොකක්ද පෙන්නලා කිවුවේ ඔපරේෂන් එකක පාරවල් කියලා. මිනිහා කුඩු කාරයෙක් වත්ද කියලා හිතුනා. හැබැයි හොඳට පින් දුන්නා සල්ලි දෙන අයට. මෙන්න බොලේ නැති සල්ලි එලියට ආවා, රුපියල් 20 පටි එහෙම. මන් හිතන්නේ එක 10 දෙනෙක්වත් සල්ලි දෙන්නැති. නොනාලා දෙන්නෙක් ‘අනේ පවු’ කියනවා ඇහුනා .

306. මහන්සි නොවී සල්ලි හොයන්න පහසුම ක්‍රමය තමයි මේ. හිඟන්නාගේ මාසික ආදායම මහන්සි වෙලා, හරියට වෙලාවට කන්නේ බොන්නේ නැතුව, බාගෙට මැරීගෙන වැඩකරන අපේ මාසික අදායමට වඩා හතර පස් ගුණයකින් වැඩියි. සමහර හිගන්නෝ සල්ලි නොදුන්නම හොඳ වචන වලිනුත් බැණගෙන යනවා.

307. අන්ධ හිඟන්නෙක් පොල්ගහවෙල ස්ටේෂමට එනවා සින්දු කියන්න. හොඳට පෙනවා ඇස් පෙනෙනවා කියලා. ඒත් මිනිස්සු සල්ලි දෙනවා.

308. රත්මලානේ අන්ධ විද්‍යාලයේ මිනිහෙක් සුදු සැරයටියක් එක්ක අපේ ගෙදර ඉස්සරහ ගේට්ටුව ගාව හිටන් ඉන්නවා කියලා ගෙදර මෙහෙකරු ඇවිත් කිවා. ගිහින් දෙන්න කියලා රුපියල් 50ක් දුන්නා. 'මම හිඟන්නෙක් නොවෙයි බෙඩ් ෂීට්, තුවා විකුනන්නෙක්' කියලා රුපියල් 50 අරගෙන පොඩි අළුත් තුවායක් එවලා තිබුනා. මම ලේන් එකේ උඩට දිව ගොස් ඔහුගෙන් සමාව ගත්තා.

309. ඉරිදාට,පෝය දාට බොරැල්ල හන්දියේ හිඟන්නෝ 5ක් විතර ගෙදර ගෙනල්ලා ඒ අයව නාවලා, අලුත්ම ඇඳුම් අන්දලා දවල්ට හොඳට බඩ පිරෙන්න කන්න දිපු සත්ගුණවත් මහත්තයෙක් හිටියා. සමහර වයසක හිඟන්නන්ට නිදා ගන්න ගෙදර තියෙන හාන්සි පුටු දෙක ඉස්සරහා මිදුලේ දාලා තියෙනවා. යනකොට පොඩි තෑගී පාර්සලයකුත් දෙනවා. බොරැල්ලේ හන්දියේ හිඟන්නෝ හැම දෙනෙක්වම වගේ එතුමා දැනන් හිටියා ඔවුන්ගේ නම් ගම්, හිඟමනට ආ හේතුව ආදී සියලු විස්තර එක්ක. එතුමා දැන් නැහැ. ටිකල් පාරට ඉස්සෙල්ලා කොටා පාරේ ඒ හන්දියේ කඩේ කුලියට අරගෙන 'දිනපතා බත් දන්සැල' කියලා හවසට දන්සැලක් දාන්නයි හිටියේ. නමුත් එතුමා නොකියාම අප අතහැරලා ගියා.

310. සමහර අය විතරයි බොරු කරන්නේ. අත පය හොල්ලලා වැඩක් නොකර, කම්මැලියි කමට අනුන්ට අත

දික් කරලා සිගමන් ඉල්ලනවා. මොකක් හරි බොරුවක් කියලා දවසේ වියදම සොයාගෙන එක්කෝ බාර් එකේ, නැතිනම් බස් එකක නැගලා අපුරුවට යනවා.

311. දවසක් මම කළුතරදී හිගන්නෙකුට රුපියල් පහක් දුන්නා. මම කොළඹට සාමාන්‍ය බසයකින් ආවා. හිගන්නා ඒසී බස් එකේ කොළඹට ආවා.

312. ඇයි සමහර අන්ධ සිඟන්නන්ට ලොකු ලොකු සල්ලි කොළ දැක්කහම ඇස් පෙනෙන්නේ?

313. කොම්පඤ්ඤවිදිය පැත්තේදී මහත්මයෙක් සිඟන්නෙක් දැක තම කලිසමේ සාක්කු දෙකටම අත යවා සල්ලි දෙන්න හෙව්වත්, සල්ලි නැති බව මතක් වී, ලජ්ජාවෙන් වගේ හයියෙන් සිඟන්නා මඟ ඇරලා ඇවිදන් ගියා. මහත්මයාව සොයා පසු පසින් වේගයෙන් ගිය සිඟන්නා ‘මෙන්න මහත්තයා රුපියල් 100ක්, මා ගාව තව සල්ලි තියෙනවා, ඔයා ගාව මුකුත්ම නැහැනේ’ කියා ඒ සල්ලි දීලා ගියා. ළඟම තිබුණු කඩේට ගොස් වඩේ එකක් කා, කිරි තේ එකක් බී, ඉතුරු රුපියල් 20 ෂර්ට් සාක්කුවේ දමාගෙන සින්ගන්නාට සිතින් පින් දි දී මහත්තයා බෝඩිමට ගියා.

314. දවසක් ට්‍රැෆික් හන්දියක් ලග මැද තීරුවේ කාර් වලින් සිගමන් යදිනවලු වැරහැලි ඇඳගත් මිනිහෙක් දුප්පත් කම කියමින්. රතු ලයිට් වැටුණු වෙලාවක නතරවූ මෝටර්

ස්ය්කලේ හිටපු මිනිහෙක් හෙල්මට් එකේ වය්සරය උස්සලා දෙදෙනා අතර දෙබස් හුවමාරු වෙලා - හිගාකන්න වෙන්න හේතු සහ පිළිතුරු. සුරා සූදූ මොනවත් නොකරත් දුප්පත් වෙනවා කියනවා ඇසූ කල බයික් එකට නගින්න කියලා, ඒ කතාව ඔහු ලවා ගෙදර නෝනට කියවන්න (නෝනා බනිනවලු දුප්පත් හින්දලු කාර් එකක් ගන්න බැරි).

315. මිනිහාට වයස 55 විතර ඇති; රෝයල් කොලිජියේ ඉගෙන ගත්තේ. තාත්තා ගුවන් යානා කපිතාන්. ලොකු ගෙයක් තිබුනේ කොළඹ 7තේ. තාත්තයි, අම්මායි දෙන්නම දැන් මැරිලා. නංගි බැඳලා කොළඹ 7 මහගෙදර. මිනිහා අද කොළඹ විදී වල හිඟමන් යදිනවා. මුහුණ දෙස ප්‍රවේශමින් බලන්නෙකුට, එදා තිබ්ච්ච විරාජමාන පෙනුමේ නෂ්ටාවශේෂ, අදත් දකින්න පුළුවන්.

316. අන්ධ හිගන්නාගේ සල්ලි පිරිච්ච ටින්කිරි ටින් එක කවුද මදාවියෙක් උස්සන් දිවුවා. දෙවියනේ, අන්ධ හිගන්නා පන කඩාගෙන පිටිපස්සෙන්ම දුවලා හෝරාව අල්ලා ගත්තා. පොලිසියෙන් චෙක් කළා, එයා ඇත්තටම අන්ධ.

# • පිස්සෝ

317. ඔන්න දවසක් මානසික රෝගීන් ඉන්න රෝහලක දොස්තර කෙනෙක් සුව වේගෙන එන රෝගීයෙක් ගේ සාමාන්‍ය දැනීම පරීක්ෂා කරන්න හිතුවලු. ඉතින් රෝගීයා ගෙන්නලා ප්‍රශ්න අහගෙන ගියාලු. දොස්තර: ඔයාගේ ඇහැක් කවුරු හරි තුවාල කලොත් මොකද වෙන්නේ? රෝගියා: මම කණ වෙනවා. දොස්තර: ඔයාගේ ඇස් දෙකම තුවාල කරොත්? රෝගියා: මම අන්ධ වෙනවා. දොස්තර: ඔයාගේ කන් දෙක කපලා දැම්මොත්? රෝගියා: මම බිහිරි සහ අන්ධ  වෙනවා. දැන් දොස්තරට ව්‍යාකූලලු මේ උත්තරය ගැන.  දොස්තර ඇහුවලු: ඔයාගේ කන් දෙකම කපලා දැම්මොත් ඔයා කොහොමද අන්ධ වෙන්නේ? රෝගියා: ඇයි මහත්තයෝ මගේ කන්නාඩි දෙක පහලට වැටිලා ඇස් දෙක නොපෙනෙනවනේ; කන් දෙක නැත්තම්.

318. එක ගමක පිස්සු මනුස්සයෙක් පාරේ කාටවත් යන්න නොදී යන හැම කෙනාගේම පස්සෙන් පන්නවලු. එක දවසක් මැදිවියේ කාන්තාවක් දරට ගිහින් දරමිටියකුත් අරගෙන එන අතරේ මේ පිස්සු මනුස්සයා ඒ කාන්තාවට පන්නන්න පටන් ගෙන ඔන්න ගොඩක් දුර පැන්නුවලු. බැරිම තැන කාන්තව අතේ තිබුණු කැත්තයි,දරමිටියි බිමදා නැවතත් දුවනවලු. පිස්සු මනුස්සයා වැටුණු කැත්තත් ඇහිද ගෙන කාන්තාව පිටුපස ලුහුබැද ඇයට කිට්ටු උනාලු. දැන්

කාන්තාව කරන්න දෙයක් නැති නිසා නැවතී අත් දෙකෙන්න්ම ඔලුව අල්ලාගෙන ඇස් දෙක පියා ගත්තාලු දැන් කොටයි පිස්සා කියා. පස්සේ පිස්සු මනුස්සයා කාන්තාවට ඇඟට තට්ටුවක් දාලා කිව්වලු මේ කැත්ත අතට අරන් ඔයා දැන් මට පන්නන්නකෝ කියලා පිස්සා ඉස්සර වෙලා දිව්වලු.

319. පිස්සන් කොටුවේ හිටපු මිනිහෙක් ගෙදර යවන්න කියලා ගහකට නැග්ගලු. එතනට වෛද්‍යවරු පිරිසක් ඇවිත් කිව්වලු අපි ඒක කරලා දෙන්නම් බහින්න කියලා. මේ මනුස්සයා බැස්සේම නැතිලු. පස්සේ වෛද්‍යවරු කිව්වලු බැස්සේ නැත්නම් ගහ කපනවා කියලා. ඒත් බැස්සේ නැතිලු. ඔය අතරේ එතනට ආපු තව පිස්සෙක් කිව්වලු සර් මම එක විනාඩියෙන් බස්සනම් කියලා. වෛද්‍යවරු පුදුම වුනාලු. පිස්සු මනුස්සයා ගහ ලගට ගිහින් කිව්වලු බැහැපන් නැත්නම් ගහ කපනවා කියලා. කියපු ගමන් අර මනුස්සයා සුරුස් ගහලා ගහෙන් බැස්සලු. වෛද්‍යවරු ඇහුවලු අපි බහින්න කිව්වම බැස්සේ නැහැ ඇයි දැන් බැස්සේ කියලා. එතකොට පිස්සා කිව්වලු, පිස්සුද සර් මෙයාත් පිස්සෙක්නේ, ඒ කියන්නේ කිව්වොත් ෂුවර් එකටම කරනවා; මිනිහා ෂුවර් එකටම ගහ කපනවා බව මම දන්නවා, ඒකයි බැස්සේ කියලා.

320. දොස්තර – ඇයි ඔයා ඔය බල්ලට ඔච්චර වැඩ දෙන්නේ? පිස්සා – වාට්ටුවේ කංකානම් මහත්තයා කියනවා ඇහුනා උන පුරුකේ දාලා බල්ලාගේ වලිගය කෙලින්

කරන්න බැහැ කියලා, ඉතින් මම මේ බට පුරුකේ දාලා බලනවා.

321. මානසික රෝහලට ආ අමුත්තා - මේ 8වෙනි වාට්ටුව කොහෙද තියෙන්නේ? පිස්සා - වාටුවේ අයගෙන් අහන්න. අමුත්තා - මොන වාට්ටුවේ අයගෙන්ද අහන්නේ? පිස්සා - 8 වෙනි වාට්ටුවේ අයගෙන්.

322. 1වැනි පිස්සා- කොහෙද යන්නේ? 2වැනි පිස්සා - මම මේ නාන්න යනවා; 1වැනි පිස්සා- ආ මං හිතුවා නාන්න යනවා කියලා; 2 වැනි පිස්සා- නෑ, නෑ, මම මේ නාන්න යනවා.

323. 1වැනි පිස්සා 2වැනි පිස්සාට - ශීරුල් අසහාරා කියාල මහත්තයෙක් එයි මාව හබවෙන්න, එයාට කියන්න මම නැහැයි කියලා කියන්න කියලා කිව්වා කියලා කියන්න කියලා.

324. 1වැනි පිස්සා- ගොටුකොල මිටියක් රුපියල් 20 නම් මිටි 2ක් කීයද? 2වැනි පිස්සා - රුපියල් 30යි. 1වැනි පිස්සා- ඒ කොහොමද? 2 වැනි පිස්සා- මම ගමේ ඉන්න කාලේ ගොටුකොල වික්කේ එකක් විස්සයි, දෙකක් තිහයි කියලා.

325. 1වැනි පිස්සා- එළකිරි නරක නොවන්න නම් මොකද කරන්න ඕන? 2වැනි පිස්සා - කිරි එළදෙන ගාවම තියෙන්න හරින්න ඕන.

326. පිස්සන් කොටුවේ ප්‍රධාන දොස්තර කෙටි නිවාඩුවකින් පස්සේ ආපසු ආවා. 2වෙනි දොස්තර එයාට කියනවා, අර මිසිස් ආයුපාල ඊයේ ආවා එයාගේ මහත්තයාව ගෙදර එක්කන් යන්න; මහත්තයා යන්න බෑ කිව්වා කියලා. ප්‍රධාන දොස්තර කියනවා මම කියලා තියෙනවනේ ආයුපාල මහත්තයාගේ මොලේ කිසිම වරදක් නැහැයි කියලා.

327. දවසක් පිස්සන් කොටුවේ පිස්සු මනුස්සයෙක් කණුවකට කන් තබා කිහිප සැරයක් මහත් විපරමින් ඒ දෙස බලන්න විය. මේ දුටු දොස්තර කෙනෙක් ඇවිත් කන තබා පරික්ෂා කරමින් කෝ මුකුත් ඇසෙන්නේ නැනේ කිවලු. පිස්සු මනුස්සයා කියනවලු එක තමයි මාත් මේ බැලුවේ මොකද සද්දයක් නැනේ කියලා.

328. ඔයා මොකද මෙහේ කරන්නේ? අර බෙහෙත් නැති ලෙඩේ මට හැදිලානේ.

329. පිස්සා - දොස්තර මොකද මම බෙර ගහන්න මෙතරම් කැමති? දොස්තර - මමත් හැමදාම බෙර ගහනවනේ, බෙරේ ඇතුලට ගිහිල්ලා. පිස්සා - ඔවු මම දැනන් හිටියා ඔයාට ලූස් කියලා.

330. පිස්සෙක් පිස්සන් කොටුවේ ලිද ළගට වෙලා දෙකායි. දෙකායි කියා කියා කෑගහනවලු. ලොකු දොස්තර මහත්තයා මේ යකා මේ ළිද ඇතුලට අත දික් කර කර

කැගහන්නේ මොකද කියලා බලන්න ගිහින් එබුනලු ලිදට.පිස්සා දොස්තර මහත්තයව කකුල් දෙකෙන් උස්සලා ලිදට දැම්මලු. ජබොක් ගාලා. දැන් කැගහනවලු තුනායී තුනායී කියලා.

331. 1වැනි පිස්සා- තමුසෙට පීනන්න පුලුවන්ද? 2වැනි පිස්සා - ඉඳලා හිටලා. 1වැනි පිස්සා- ඒ කොයි වෙලාවටද? 2 වැනි පිස්සා- මම වතුරට බැහැපු වෙලාවට.

332. එකමත් එක කාලයක අගමැති කෙනෙක්; පිස්සන් කොටුවට ගියාම පිස්සෙක් ඇහුවලු;ඔයා කවුද කියල මම තමයි අගමැති කිව්වා; පිස්සා කිව්වලු ඕක කියල තමයි මාත් මෙහෙ ආවෙ කියලා ඔයාට තියන ලෙඩේටත් බේත් තියෙන්නෙ මෙහේ කියලා.

333. පිස්සෙක් කැම අරං ආව ඇටෙන්ඩන්ට් නෝනාට කියලා තියෙනවා - 'නෝනා නාන්නේ නැතුව නාන්නකෝ නෝනා' කියලා.

# • හොල්මන්,මරණ/මිනීමැරුම්/ජ්‍යොතිෂ්‍ය (බොහොමයක් ප්‍රබන්ධනාත්මකයි, විශේෂයෙන්ම හොල්මන් )

334. අපි මරණ ගෙදරක කෝපි බි බි කැරම් ගගහ රෑ තනි රකිනකොට අපි නොදන්නා මිනිහෙක් භයානක හොල්මන් කථා කියන්න පටන් ගත්තා. මාත් එක්ක ආපු යාලුවා මට කතාකරලා ගෙදර යන් කියලා මාවත් එක්ක අරන් ගියා. මිනිහා ගෙදර ගිහින් කිව්වා එහෙම කලේ ඒ මිනිහා හොල්මනක් හින්දා කියලා. පහුවදා බැලින්නම් යාලුවට සහලෝලා උණ.

335. මම කළුතර ලංකා බැංකුවේ වැඩ කරන දවස්වල සිකුරුදා හවස වැඩ ඉවර වෙලා මෝටර් සයිකලෙන් ගෙදර (නුවර) යන්න පිටත් වෙන්නේ සවස 8ට විතර. හැබැයි එදා පරක්කු වෙලා පිටත් වූ මම පානදුර පහු කරලා පාලම හරියට එනකොට රෑ 12 විතර උනා. ගාලු පාරම පාලුයි, කළුවරයි. සුදු සරමක් සහ කමිසයක් ඇඳගෙන පාර අයිනේ හිටපු මිනිහෙක් එක පාරටම මට අත දැම්මා. මමත් පවු කියලා එක පාරටම බ්රේක් ගැහුවහම මිනිහා දුවලා ඇවිත් ස්යකලේට නැග්ගා. 'මහත්තයා මාව ලුනාව ස්ටේෂන් එක

ගාවින් ගාලු පාරේ බස්සන්න' කියලා රළු හඬකින් කීවා. මම මිනිහව නග්ගගෙන යනවා, මිනිහා  කිසි කතාවක් නැහැ. මට බය මිනිහාට හෙල්මට් නැති නිසා මාව පොලිසියෙන් අල්ලයිද කියලා. පුදුමේ කියන්නේ මිනිහාව මට ඇඟේ ගෑවෙන්නේ නැහැ. මම උවමනාවෙන් පස්සට ඇවිල්ලා මිනිහට තද වෙන්න බැලුවා, මගේ ඇඟේ  ගෑවීගෙන ඉඳගෙන ඉන්නවා, නමුත්, මට දැනෙන්නේ නැහැ. මම පස්ස හැරිලා බැලුවාම මිනිහා ඉන්නාවා සුදුමැලි වෙලා, ඇස් උඩ ගිහින් වගේ. ලුනාවට ඉස්සෙල්ලා, 'ලී බඩු කඩ තියෙන හරියේ නතර කරළා දාලා යන්න' කියලා මිනිහා කිවේ සිහින් හඬින්. මම හිතන්නේ මිනිහාට තේරේන්න ඇති මම මිනිහා ගැන විමසිලිමත් බව. මම ස්යකලේ නතර කළා විතරයි  මිනිහා සුරුස් ගාලා මුහුද පැත්තට ටකරං මඩු අස්සෙන් මාරු උනා. හොඳටම  දාඩිය දාපු මම මොරටුව හන්දියේ රෑ කඩෙන් තේ බොන්න නවත්තලා කතා කරන කොට කොට ඒ අය කිව්වා 'ඔයාට ඔය හම්බවෙලා තියෙන්නේ රිචර්ඩ් අයියා, එයා වැල්ලේ මාළු කාරයෙක්. සිකුරාදා රෑ යන මෝටර් සයිකල්/ත්‍රී වීල් වලට අත දාලා ලුනාව හන්දියෙන් බස්සන්න කියලා ඉල්ලනවා' කියලා. මිට අවුරුදු 8ට විතර ඉස්සෙල්ලා රිචර්ඩ් අයියා පානදුර පාලම ලඟින් සිකුරුදා දවසක රෑ පාර පයින කොට ප්‍රය්වෙට් බස් එකකට හැප්පිලා මැරිලා. ගෙදර ඇවිල්ලා මම වයිෆ්ට කථාව කිව්වුවහම එයා හිනා වෙලා ගණන් ගත්තේ නැහැ.

336. යකා වැහුණු තරුණියකට ආතුරයෙක් ලෙස සුදු රෙද්දක් අන්දලා, සුදු රෙද්දකින් මොට්ටක්කිලියක් පෙරෙව්වම හරි පින් පාටයි, සිරියාවන්තයි. ඒත්, අපි මොනතරම් බයෙන්ද ඉන්නේ ඇය ඇතුලේ යකෙක් ඉන්නවා කියලා.

337. බිබිලේ මූසල වලව්වක බෝඩ් වෙලා හිඳපු කාලේ රෑ ලොකු තඩි මීයෙක් එක පාරටම කෑම කාමරේ එල්ලලා තිබුණු ෆ්‍රේම් කරපු පින්තූරයෙන් ඔලුව එලියට දැම්මා. විනාදී 5ක් ඇතුලත ඌ තුන් සැරයක් එහෙම කළා. පින්තූරේ තිබුනේ ගලා යන නදියක් - මහා පාළු ස්වභාවයක් ඒ රූපෙන් දුන්නා. 3 වෙනි සැරේ මම කෑ ගැහුවා. ගෙදර අයිති කාරයාට ඇවිත් පින්තූරේ උස්සලා බැලුවා, මුකුත් තිබුනේ නැහැ. හැබැයි මිනිහගේ මූණෙන් තේරුණා මිනිහාත් බය වෙලා බව. ඒ ගෙදර බෝඩින් කාරයෝ ඉන්නේ නැතිලු, මමත් ඉක්මනින් ගියා.

338. මන්ත්‍ර බලයෙන් බිහිසුණු යක්ෂයන් බන්ධනය කරගෙන උන්ගෙන් වැඩ ගත් මහත් දස්කම් විස්කම් පෑ එක්තරා වෙද මහතකුයක්කු කඳුබද පැත්තේ හිටියා. යකා ගහපු සුදු වතු සුපිරින්ටෙන්ඩන්ට්ලා පවා මෙතුමා පවා සුවපත් කරලා තියෙනවා. මෙයා කොච්චර බලගතුද කියනවනම් එයාගේ ගෙදර ඇතැම් වැඩ පල කරවාගෙන තියෙන්නේ බන්ධනය කරවා ගත්තු යක්ෂයන්ගෙන්ලු. රුපියල් බාගෙකින් කඩේක බඩු ගේන්න කියලා යක්කුන්ට් කියනවා උන් සතු බලයෙන් වෙද මහතා ආපසු එනවිට එම

රුපියල් බාගේ නැවත ගෙදර තිබිය යුතුයි. මෙසේ එකම රුපියල් බාගෙන් 7 සැරයකට වඩා බඩු ගත් අවස්ථා තියෙනවා.

339. වෙද මහතා සතුව යකුන් ඇතුළු අමනුෂ්‍යයන් පියවි ඇසට වේද දැක ගත හැකි මහා බලගතු අඳුන් තිබී තියෙනවා. වේද මහතා අඳුන් ගලවාගෙන, යකුන්, දේවතාවුන් බන්ධනය කරගෙන තිබෙනවා.

340. යක්ෂයන් අලේල් නටවා, උන්ගෙන් වැඩ ගත් කඳුබඩගම වෙද මහතා අන්තිමේදී මිනිස් වෙස් ගෙන සිටි දේවතාවෙක්ද මෙල්ල කර ඔහුගෙන්ද අනේක වැඩ වැඩ ගත්තා. කම්බිලි නම්වූ මේ මිනිස් වෙස් ගත් දේවතාවාද මහා බලවතතෙක්. ඔහු සහ කඳුබඩගම වෙද මහතා අතර බිහිසුණු ද්වන්ද සටනක් හට ගැනුනා. වෙදමහතා සතු මහා බලගතු තෙල්, අඳුන් සහ පුස්කොළ පොත් සියල්ල කම්බිලි විනාශ කළා පමණක් නොව උපායකින් ඒ වේද මහතාව කිල්ලකට අසු කොට වෙද මහතා සතුවූ බලගතු බන්ධන සියල්ල සුන්නත් ධූවිලි කර දැම්මා. හුළු අතු රැගෙන වනයේ ලෙඩෙකුට සාත්තු කර සෙනගක් සමග ආපසු පැමිණෙමින් සිටි වේද මහතාව කම්බිලි ඇතෙකෙකුගේ වේශය ගෙන ඇවිත් පාගා මරා දැම්මා. මේ සියල්ල වාර්ථා කර ඇති බ්‍රිතාන්‍ය ජාතික, ලංකාවේ සේවය කල, පරිපාලන නිලධාරි, හියු නෙවිල්ගේ පුස්කොල පොත් අදත් ලන්ඩනයේ බ්‍රිතාන්‍ය රාජ්‍ය කෞතුකාගාරයේ බලන්න පුළුවන්.

341. ‘යක්කු යක්කු කිය කියා මල්ලිලා නංගිලා බය කරලා තිබ්බොත්, එක්කන් යනවා ඔයාව ඔන්න ඇත්තම යක්කු පෙන්නනන්න’. තාත්තා එහෙම කිව්වයින් පසු අයියා අපිව බය කරන එක නතර උනා.

342. ‘මියගිය මහත්තයාගේ භූත ආත්මය හැමදාම රෑට ගෙදර ඇවිදින අඩි ශබ්ධය මට ඇහෙනවා’ කියා පුෂ්පා රාජමන්ත්‍රී නමැති මගේ අම්මගේ මිතුරියක් ඇගේ මියගිය සැමියා ගැන මගේ අම්මාට කියනවා මට ඇහුනා.

343. ‘රෑට වහලා තියන ගෙදර බත් මුට්ටි ඇරලා කවුද බත් බෙදා ගන්නවා. ඒත් මට කිසිම බයක් ඇති වෙන්නේ නැහැ, මගේ පුතා නම් බය වෙලා මට ගුලිවෙනවා’ එසේ කිවේ අම්මා කෙනෙක් පාසලේ ගුරුතුමාට. ‘කොහොමද ඒ’ කියා ගුරුතුමා ඇහුවහම ඇය කිවා ඒ ඇයගේ මැරුණු මහත්තයා කියා. ‘දන්නේ කොහොමද’ කියා ඇහුවහම; ඒ එයාමලු.

344. **1964** මම නවාතැන් ගත්තේ අක්බාර් හෝල් එකේ. රෑට කොරිඩෝර් වල අශ්ව කුර හඬ ඇහෙනවලු, සමහර වෙලාවට හයියෙන් අශ්වයා දුවනවාත් ඇහෙනවලු. හැබැයි, කවුරුවත් අශ්වයෙක්ව දැකලා නම් නැහැ, සද්දේ විතරයි. කුස්සියේ බණ්ඩයියාගෙන් ඇහුවහම කිවුවේ යුද්ධ කාලේ මේ හෝල් එකේ නැවතිලා ඉඳලා තියෙනවා බ්‍රිතාන්‍යය හමුදාව, එකේ හිටපු අශ්වයා පිටින් ගිය කැප්ටන් කෙනෙක් කියලා තමයි අපේ විශ්වාසය කියලා.

345. බොරැල්ල කනත්තේ කාලයක් තිස්සේ වැඩ කරන සේවකයෙකු කියපු කතා 2ක් - (i) හොල්මන් අවතාර විශ්වාස කරන්නේ නැති කාණ්ඩායමක් අලුත වළ දාපු සොහොනක් උඩ රෑ ගත කරන්න ඇවිල්ලා ඉන්නකොට කවුදෝ' ඒ අයට ගල් ගහන්න පටන් අරගෙන. එහෙම ගහලා තියෙන්නේ හොල්මනක් කියලයි ඒ එක් උන්නැහේ කෙනෙක් කිවුවේ. (ii) ඉතා ලස්සනට සුදුම සුදු පාට ඇඳුම්කෝට්/ ඇඳගත් මහත්තයෙක් රෑ සේවකයන්ව කනත්තේ මිනි කාමරය දෙසට යොමු කරනවාලු. ඉන්පසු බිත්තිය තුලට එයා ඇතුල් වෙලා අතුරුදහන් වෙනවලු. සේවකයෝ කීප දෙනෙක් සිහිසන් නැතුව ඇදගෙන වැටිලා තියෙනවා.

346. අනියම් පෙම්වතා ගැන ආරංචිය විදේශගතව ඉන්න තම සැමියාට ආරංචි කරයි යයි සිතා ඔහු සමඟ එක්වී තම මව මරා නිවසේ වැසිකිලි වලකට දැමූ දියණියකගේ කෲරතර ක්‍රියාවක් කොට්ටාව, කටුකුරුන්ද ප්‍රදේශයෙන් වාර්තා වුනා. පොලිසිය මෙම සැකකටයුතු සිරුර ගොඩ ගත්තේ සිද්ධියෙන් වසර 2ට පසුවයි. සිරුර සාරියකින් ඔතා තවත් සාරියකින් ගැට ගසා තිබුනා. මළ සිරුර වසර දෙකක් තිස්සේ වැසිකිලි වලේ හොඳටම දියවී ගොස් තිබුනා. අභිරහස හෙළි වුනේ සැමියා ආපසු ලංකාවට පැමිණ මියගිය මෑණියන් ගැන දැඩි සේ සොයන්න ගැනීමෙන් පසුවයි.

347. ගම්පොල විදුලි බල මණ්ඩලයේ සේවය කළ විදුලි රැහැන් පරීක්ෂකවරයකු නිදි යහනේදී ඝාතනය කර තිබුනා.

ඔහුගේ ගෙලෙහි තියුණු කැපුම් තුවාලයක් තිබුණු අතර උරහිසෙහි දෙපළකද කැපුම් පහරවල් කිහිපයක් තිබුනා. තම සැමියා ලේ විලක් මැද වැටී සිටි බවයි බිරිඳ ප්‍රකාශ කලේ. පොලිස් සුනඛයන්ගේ සහයෙන් ඝාතනය සිදු කලේ බිරිඳ විසින්ම  බව සොයා ගත්තා. ඔහු ඝාතනයට ලක්වීමට පෙර ගත් රාත්‍රී ආහාරවලට තදින් නින්ද යැම සඳහා යම් රසායනිකයක් මිශ්‍ර කර ඇති බවයි  රජයේ රස පරීක්ෂක කිවේ.

348. 44 වියැති, අම්පාර  නගරයේ ප්‍රසිද්ධ වෙළෙඳ ව්‍යාපාරික ආයතනයක හිමිකරුවකු කිසියම් පුගලයෙක් විසින් ඔහුගේ නිවසේදී දෙඅත් බැඳ ගෙල සිර කර ඝාතනය කර තිබුනා. ඝාතනයට ලක්වූ ව්‍යාපාරිකයා විවාහකයකු වන අතර, දික්කසාද වීමෙන් අනතුරුව ඔහු තම  නිවසේ තනිවම සිට ඇති බව හෙළිවුනා.  ඝාතනය සිදු කර තිබෙන්නේ ඔහුගේ නිවසේ තාවකාලිකව නැවතී සිටි, එම ව්‍යාපාරිකයාගේ හිතවතකු වන අම්පාර හාඩි ආයතනයෙන් අස් කරන ලද 35 හැවිරිදි  හිටපු සිසුවෙකුයි.

349. පදිකයින්, ව්‍යාපාරිකයින්, ත්‍රීරෝද රථ රියැදුරන් හා මිතුරු වී ඔවුන්ට විෂ සහිත බීමක් පානයට සලස්වා සිහිමුර්ජා වූ පසු ඔවුන්ගේ මුදල්, රන් ආභරණ, ජංගම දුරකථන ඇතුළු වටිනා දෑ කොල්ලකන කල්ලියක් ඉතා සාර්ථක ලෙස තම 'ව්‍යාපාරය' කර ගෙන ගියා.  එක ත්‍රීවීල් රියැදුරෙක් මිය ගියා. ඉන්පසුව, මේ අය පරිගණක තාක්‍ෂණය යොදා ගෙන රුපියල් දහසේ ව්‍යාජ නෝට්ටු

නිපදවන්න පටන් ගත්තා. ව්‍යාජ මුදල් මාරු කිරීම සඳහා ගොස් සිටියදී කල්ලියේ දෙදෙනෙක්ව තිස්සමහාරාමයේදී අහු උනා. පොලිසියට කොටුවන විට ඔවුන් අත රුපියල් ලක්ෂ 4ට වැඩි හොර නෝට්ටු තිබී අසු වුනා.

350. හොරොව්පතාන ප්‍රදේශයේදී මොට්ට ආයුධයකින් හිසට ගසා 51 හැවිරිදි පුද්ගලයෙකු ඝාතනය කර තිබුනා. භූමිදානයෙන් දවස් 7ට පස්සේ ඒ මිනිහාවම අනුරාධපුරයේ කඩ 50හේදි දැක්කයි කියලා කෙනෙක් ශපත කරනවා.

351. අහුන්ගල්ල ප්‍රදේශයේ සැමියකුගේ ගෙල කපා ඝාතනයට බිරිඳව සැක පිට අත් අඩංගුවට ගත්තා. සැමියා අනියම් බිරිඳක් සමග පවත්වාගෙන ගිය ඇසුරක් සම්බන්ධයෙන් ඇති වූ පවුල් ආරවුලක් නිසා සැමියාව මරුවායයි ඇය පාපොච්චාරණයක් කළා. පොලිසියෙන් මිදී පලා ගිය ඇය, දින දෙකකට පසු අතුරුගිරිය හෝටලයකදී ගෙල වැල දාගෙන මිය ගොස් සිට හමු වුනා.

352. තම නෙත් අඳ බිරිඳගේ මරණය සිදුකර පලාගොස් සිටි 60 වියැති ඇගේ සැමියාව අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් වුයේ විශේෂ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් වෙස්වලාගෙන ගොසින්. ඝාතනය සඳහා යොදා ගත් ආයුධය අදාළ යුවළ ජීවත්වූ නිවසේ දුම්කොළ මිටියක් යට සඟවා තිබියදී පොලිසිය විසින් සොයාගතතා. මේ පුද්ගලයා මීට පෙරද මිනිස් ඝාතන දෙකක් සිදු කල අයෙක්.

353. මිගමුව කලපුව ප්‍රදේශයේ ඉස්සන් ගොවිපළක් අසළ තිබී අභිරහස් ලෙස මියගිය පුද්ගලයෙකුගේ මළසිරුරක් හමුවුනා. මළසිරුර හමුවූ ස්ථානයේ සිට මීටර් 10 ක් පමණ දුරින් වස වර්ගයක් සහිත බෝතලයක්ද හමුවී තිබුනා. එහෙත්, පසුව හෙළි උනා ඔහුගේ සහෝදරයා විසින් පවුල් ආරවුලක් මත ඔහුව කපා කොටා මරා දමා ඇති බව. වස කුප්පිය මළ සිරුර දෙසට විසි කර තිබුනෙත් සහෝදරයා විසින්ම බවත්.

354. බිරිඳක විසින් සිය අනියම් සැමියා සමඟ එක් වී තම ස්වාමිපුරුෂයා ඝාතනය කොට නිවස අසල දොළ පාරක ඇති වතුර වළක සඟවා තැබුවා. මළසිරුර දින නවයකට පසු රක්වාන පොලිසිය මගින් සොයාගත්තා. පොල්ලකින් පහරදීමෙනුයි ඝාතනය සිදු කර ඇත්තේ. නිවස අසලින් ගලා බසින ඇළ මාර්ගයක වතුර වළක දමා ගල්වලින් වසා තිබුණු සිරුර පොලිසිය සොයාගන්නවිට ශරීරයේ කොටස් සතුන් (කබරයන්) කා විසින් විනාශ කර, සිරුර මුළුමනින්ම විකෘති තත්වයට පත් ව තිබුනා.

355. සිය අනියම් සැමියා සමග යතුරු පැදියෙන් ඇඹිලිපිටිය ප්‍රදෙශයේ ගමන් කරද්දී කාන්තාවක් පසු පසින් හඹා ආ ඇයගේ ස්වාමිපුරුෂයා ඇයට පිහියෙන් ඇන ඝාතනය කර තිබුනා. 'පහුගිය අවුරුදු පහක කාලයක ඉඳන් මගේ නංගිට ඔය මිනිහගෙන් ගොඩාක් කරදර සිද්ද සිද්ධ වුණා. දැනට අවුරුද්දකට කලින් ඔය මිනිහා මේ ගෙයි සාලේ මැද්දේ නංගිව බිම දමා ගෙන කකුලේ ඇඟිලි

තුනක්ම කඩුවකින් කපලා, ඇගේ ස්ථාන හතලිස් පලක තුවාල සිද්ද කළා. ප්‍රතිකාර ගන්න රෝහලේ මාස තුනක් විතර නැවතිලා හිටියා. කකුලේ තුවාලේ නිසා අවුරුදු දෙකක් ම නංගි ඇවිද්දේ අත්වාරුවකින්. ඔය සිද්ධියෙන් පස්සේ මිනිහත් එක්ක එක ගෙදරක ජීවත් වෙන්න බැරිය කියල තේරුම් ගත්ත නංගි මේ ගෙයි පැත්ත පළාතකවත් එයාව වැද්ද ගත්තේ නැහැ. පස්සේ දික්කසාදේ ඉල්ලලා නංගි උසාවියේ නඩුවක් දැම්මා.' මරණ පරීක්ෂණය දා එසේ කිවේ මියගිය අයගේ අක්කා කෙනෙක්.

356. අවුරුදු 50ට විතර ඉස්සර වෙච්ච දෙයක් - අප්පච්චි ගහක අත්තක හිටපු බස්සෙකුට හඳ එළියේ බයවෙලා දුවගන ඇවිත් කුස්සි පිළිකන්නේ කුණු දාන වලේ ජබොස් ගා ඇද ගෙන වැටුනා. හොඳටම ඇඟ තැළුනත් මුකුත් නෑ වගේ හිටියා. දවස් 3ට විතර පස්සේ අම්මා තවලා, තැලුම් තෙල් ගාලායි අප්පච්චිගේ තැලුම් සුව කලේ.

357. අපේ මාමා කෙනෙක් පොඩි කාලේ තවත් කොල්ලෙකුත් සමග රෑ 9.30 බයිස්කෝප් එකක් බලන්න ගිහිල්ලා පයින්ම එනකොට පාරේ මඟ තියෙනවලු මිනී පිට්ටනියක්, ඒ හරියට එනකොට රෑ 12ට විතර ඇතිලු. ඉතින් මිනීපිට්ටනියට ලංවෙද්දි ගස්කොළන් පොඩිකරගෙන පිඹගෙන (නාසයෙන් පිඹින හඬ) යම්කිසි දෙයක් තමන්ගෙ පැත්තට එනවා වගේ ඇහෙනවලු. නැවතිලා ටිකක් වෙලා ඉදිද්දි සද්දෙයක් නැහැලු. ආයෙත් ඉස්සරහට යන්න පටන් ගන්නකොට ගස්කොළන්

පොඩිකරන මහා සෝසාව ඇහෙනවලු. ඉතින් මේ දෙන්නා නැවතිලා තීරණය කෙරුවලු මේ නම් අනිවාර්යයයෙන්ම මහසෝනා තමයි, අපි මිනීපිට්ටනිය පහුකරන්න ගියොත් අපිව බිල්ලට ගන්නවා ඒක හින්දා එළිවෙනකම් ඉඳලා යමු කියලා. ඉතින් මේ දෙන්නා ඒ හරියෙ තිබුණු ගහකට නැගලා හිටියලු. රෑත් සැරෙන් සැරේ ගස් පොඩිකරන සද්දෙ ඇහිලා හොඳටම බය වුණාලු. උදේ එළිවෙලා ගහෙන් බැහැලා මිනීපිට්ටනිය පැත්තට බයෙන් යද්දි දැක්කලු කොහෙදෝ ඉඳලා ලනුව දිගට කඩාගෙන ආපු තඩි හරකෙක් මිනී පිට්ටනියෙ තිබුණු අතු පාත්වෙච්ච කජු ගහක අත්තක පැටලිලා එතන තිබුනු පින්න අකුල පොඩිකරලා. මේ ගොල්ලන්ගේ  අඩි සද්දෙට වඩාත් බයවුන හන්දා තමයි රෑ පිඹලා තියෙන්නෙ.

358. විදානේ ආතා කියලා උස, කෙට්ටු සියා කෙනෙක් අපේ ගමේ හිටියා. හෙනරාජ තෛලය කියලා ජීවම් කරපු මහා බලගතු තෙලක් එයා ගාව තිබුනලු. ඒ තෙල ගා ගත්තහම වෙඩි වදින්නේ නැතිලු. පළාතේ ග්‍රාමසේවක (ගම්මුලාදෑනි) විරසකයට ළඟටම ඇවිත් දෙතුන් වතාවක් වෙඩි තියලා තියෙනවා. විදානේ ආතාට මුකුත් වුනේ නැහැ.

359. කොරනේලිස් සියා කියලා නපුරු සියා කෙනෙක් හිටියා. දවසක් ඒබ්‍රහම් කියන අහිංසක මිනිහෙකුට ගහලා (ඒ මිනිහා එයාට උසුළු විසුළු කළාය  කියාලා), ඒ මිනිහාගේ කකුල නොන්ඩි කළා, මිරිස් ගලක් කකුල උඩට අත හැරලා. සියා මාස 6ක් හිරේ හිටියා. ඉඳලා ආ දවසෙම සිය දිවි නසා

ගත්තා.

360. එක්තරා බලගතු අඳුනක් ගල්වා ගත්තාම යක්ෂ ප්‍රේතාදී අමනුස්සයන් දකින්න පුලවන්. එහෙම දැක්ක කෙනෙක් ඉන්නවා කියලා කියනවා. රිකිල්ලගස්කඩ පැත්තේ මොරගොල්ල කියන දුෂ්කර ගමේ ගල් කන්දක ගුහාවක තමයි ඒ අඳුන ගලවාගෙන මිනිහා ඒ අයව දැකලා තියෙනවා කියලා කියන්නේ.

361. 'මම දවසක් රෑ ගෙදර ඇඳක නිදාගෙන ඉද්දී එක පාරටම කවුදෝ කෙනෙක් ඇඳත් එක්ක උස්සලා බිම අතහැරියා. මාව ඇහැරුනා, පොඩි දුවට ගානක් නැතුව වගේ ඔහේ නිදි', සිනාසෙමින් මට මෙසේ කිවේ මා සමඟ පොලිසියේ එවකට එකට වැඩකළ තවත් කාන්තා ලඝු ලේඛිකාවක්. මේ කතාව අද, අවුරුදු 30ට පස්සේ තාමත් හොඳට මතකයි.

362. වාස්තු විශේෂයඥයෙක් බිරිඳට කියලා දොරකොඩට තැඹිලි ගස තිබීම අපලයි කියලා, මහත්තයා ගෙදර එනකොට තැඹිලි ගහ බිම. මහත්තයට කොච්චර තරහ ගියාද කියනවනම් එවලේම ගොවිජන සේවා එකට ගිහිල්ලා දෙමුහුන් තැඹිලි පැලයක් සල්ලි දීලා අරන් ඇවිත් ඒ ගහ තිබුන තැනම ඉන්දුවා.

363. අපි සේමනේරියේ ඉන්න කාලේ අපේ යාලුවෙක් හිටියා, මිනිහා හොල්මන් අවතාර වලට අභියෝග කරන මහා වීරයා.හොල්මන්, අවතාර කියලා දෙයක් නැහැ කියලා තමයි නිතරම කියන්නේ.ඉතින් අපි මිනිහට අභියෝග කළා පුලුවන් නම් මහ රෑ දොළහට පාළු කනත්තකට ගිහින් ඉදලා එන්න කියලා. අපි මිනිහට දුන්නා ලොකු පොල්පරාල ඇණයක් පුලුවන්නම් කනත්තේ මැද හරියට බිමට තියලා ගහලා එන්න කියලා, අමාවක දවසක රෑ 12 ට. අපේ යාලුවත් අය්යෝ සිම්පල් නේ කියලා ගියා. කනත්ත තිබුනේ මුහුදු වෙරල අයිනේ. පැය 2කට වඩා ගියා මිනිහා ආපහු ආවේ නැහැ. අපි ගියා හොයන්න. මිනිහා කනත්ත මැද සිහි නැතිව වැටිලා. වතුර පොවලා සිහිය අරන් දුන්නහම මිනිහා කියනවා සොහොන මැද රෑ 12ට හරියට අනේ ගැහුවලු. නමුත් මිනිහට එන්න දෙන්නෙම නැතිලු, කවුද පිටිපස්සෙන් අදිනවලු .මිනිහා හොදටම බයවෙලා ඵුල් ට්‍රයල්ලු එන්න. එන්න දෙන්නෙම නැතිලු. කෑ ගහලත් තියෙනවා. මුහුදේ සද්දෙට කාටවත් ඇහෙන්නේ නැහැ. ඒ පලාතක ගෙදරක් වත් නැහැ. ටෝච් එක ගහලා බැලුවහමයි තේරුනේ, අනේ මැන් ඇනේ ගහලා තියෙන්නේ ඇදන් ගිය දිග රේන් කෝට් එකත් අල්ලලා. වැඩිහිටියෙක් කිවුවා අපි පරක්කු උනා නම් මිනිහා මැරෙන්න උනත් තිබුනා ඒ තරම් බයෙන් මිනිහා ඉදලා තියෙන්නේ කියලා.

364. තමන්ගේ කාමරේ මිනි පෙට්ටියක් තියාගෙන හිටපු වයසක මාමා කෙනෙක් හිටියා, ඇදට එහායින්. රෑට

නිදාගත්තේ මිනී පෙට්ටියේ. ඒකට නගින්න ලී පඩිත් එයා හදාගෙන. මැරුණට පස්සේ ඒ පෙට්ටියටම දාලා වැළලුවා.

365. මුරුතලාවේ වාසය කල මගේ හොඳම යාලුවෙක් කිවුව කතාවක් - 'මම දවසක් රෑ 5 කනුව හන්දියෙන් බස් එකෙන් බැහැලා ගෙදර එනකොට, පාරේ අයිනේ ඉඳලා කවුද කළුවරේ මගේ ඇඟට කෙළ ගැසුවා. ඊට පස්සේ, මම කෑ ගහලා අහල පහල මිනිස්සු කැඳවලා, හුළු අතු පත්තු කරලා හොයලා බැලුවා, ඔහේ කවුරුවත් නැහැ. හැබැයි ෂර්ට් එක ඉස්සරහා තඩි සුදු පාට සෙම ගුලියක්. අම්මා කිවුවා කිවුවා ෂර්ට් එක නැවත අඳින්නේ නැතුව පුච්චලා දාන්න කියාලා'.

366. බාගෙට වහලා තියෙන ජනේලෙන් රෑ 12ට එබිලා බැලුවහම දැක්කා වත්ත පහළ ඇත කොහිල පඳුර ළඟ සුදු පාට උසට උසේ උඩ පහලට වැනෙන දෙයක්. පිරිත් දාලා නිදාගෙන පහුවදා උදේ ගිහින් බැලුවහම එතන මුකුත් නැහැ. අදත් මේක මතක් වෙනකොට ලොමු දැහැ ගැන්වෙනවා.

367. අපේ අක්කා කෙනෙක් බ්‍රසිල් රටට ගිහිල්ලා ඇවිත් එහෙදි ඉඳගෙන ගත්තු ටැරෝ කාඩ් කියවන බිස්නස් එකක් පටන් ගත්තා. හොඳට, හරියටම කිවුවා. ඒත් සෙනග ආපු නැති නිසා බිස්නස් එක වහලා දැම්මා.

368. මුහුදෙන් ගසා ආ බෝතලයක් ඇර බැලූ මිනිසෙකුට එම බෝතලය තුලින් හුමාලය මෙන් දුමක් පිටවී ඒ තුලින් මිනිස් රුවක් මතුවී කියනවා 'මම තමයි මේ බෝතලයට අරක් ගත් භූතයා, දැන් නුඹ මාව නිදහස් කළා, නුඹට සිද්ධවෙනවා නුඹ ගේ ජීවිතයෙන් මා වෙනුවෙන් වන්දි ගෙවන්න කියා. නුඹ කොහොමද මැරෙන්න කැමති; නුඹ මැරෙනවට අකැමති නම් මට සිද්ධ වෙනවා මා වෙනුවට නුඹව මේ බෝතලය ඇතුලට දාලා වහන්න කියලා. මරණයට බයවූ මිනිසා කියනවා 'හා එහෙනම් මාව ඔය බෝතලයට දමා වසන්න කියා'. ඒ අයුරින් ඒ මිනිසා බෝතලය ඇතුලට යනවා. හුමාලය බවට පත්වී භූතයෙක් වෙනවා. ඒ බෝතලය මුදේ පාවෙනවා. මිනිහගේ පවුලේ අය තාම මිනිහව හොයනවා.

369. දවසක් සාත්තරකාරයෙක් කෙනෙකුට කියලා 'ඔබ අහවල් දින අහවල් වෙලාවට නයෙක් දෂ්ට කර මිය යනවා මේ පොලවේ' කියලා. මේක බොරු කරන්න හිතාගෙන ඒ දිනය වෙලාව වෙනකොට ගොඩ බිම හිටියොත්නේ නයි දෂ්ට කරන්නේ කියලා, නැවක නැගී කල් තියා මුහුදට ගිහින්, කම්මැලිකමටත් එක්ක චිත්‍ර ඇඳ ඇද ඉඳලා. නැව් තට්ටුවේ උඩට මතුවී තලා නොදාපු යකඩ ඇණයක් දැකලා, සාස්තරකාරයට සමච්චල් කරන්න වාගේ මළකඩ ඇණය අසල තම අත්ල නයි පෙනේ වගේ හදාගෙන කොලොප්පමට වගේ ෂූ.. ෂූ.. කියමින් ඉඳලා ඇඳපු නයි පින්තූරත් අනිත් අතේ තියාගෙන. හරියට අර වෙලාවට

නැව පැද්දී මළකඩ ඇණය ඇඟිල්ලක වැදිලා තුවාල වෙලා පිටගැස්ම හැදිලා, අමාරුවෙලා, ගොඩ බිමට එන කොටම ඔහු මැරිලා.

370. මුහුදේ පාවී එන, කට වැසු බෝතල අදටත් ටහිටි දූපත් වාසින් අරින්නේ නැහැ.

371. බඩු මූට්ටුවලට, රෙදිපිළි  වලට වරින්වර ගිනි තියන භූතයෙක් ගැන මේ මෑතකදී මිගමුව පැත්තෙන් වාර්තා වුනා. පොලිසියෙන් කියලා තියෙනවා ඒවා කරලා තියෙන්නේ මනුෂ්‍යයෙක් කියලා, ඒත් ගෙදර අය ඒ පැහැදිලි කිරීම  පිළි අරගෙන නැහැ.

372. ආරියදාස කියලා තනිකඩ මිනිහෙක් හිටියා. දූප්පතෙක් වගේ පෙනුනත් මිනිහට සල්ලි තිබුනලු. ගමේ වින්කලේට එහා, කඩ කාමරේක මිනිහා හිටියේ. බය්සිකලේට හුලං ගහන්න වින්කලේට යනකොට මම මිනිහාව දකිනවා. කෙට්ටු, කළු මනුස්සයෙක්.  මම කතා කරලත් ඇති. ‘ආරියදාස ගහක එල්ලිලා මැරිලා’ කියලා උදේම ගමේ ආරංචිය පැතිරිලා ගියා. මමත් පැදගෙන ගියා බය්සිකලේ පවනට බඳු වේගයෙන්, කඳු නැගලා.  මෙන්න වදේ ලොකු නුග වගේ ගසක ඉහල අත්තක එල්ලිලා ඉන්නවා  ආරියදාස.  බලන්න බය නිසා මම ඇස් දෙක දිහා බැලුවේ නැහැ. සරම විතරයි ඇඳලා හිටියේ, කමිසයක් වත් නැහැ. සල්ලි පොලියට දීලා මිනිස්සු ආපහු ගෙවලා නැති

නිසා වේදනාවටලු ආරියදාස සිය දිවි හානි කරගත්තේ. අහිංසක මිනිහෙක්.

373. අළුත මරුන ගෙදරක මේසෙට තියන බත් වල කවුද වැලි දාලා. කවදාවත් බත් ටික කන්න හම්බවෙන්නේ නැහැ, වැලි. පෙරේත තටුවක් හදලා මල ගිය පරාන කාරයා කන්න කැමති කෑම ජාති තියල වහලා පුරා සතියක් පෙරේත තටුව අළුත් කළා. හැමදාම ඇරලා බලනකොට මොනවා හරි කෑම ජාතියකින් පොඩ්ඩක් කඩාගෙන කාලලු. ඒ හාදයා ගොඩක්ම කන්න කැමති ඇඹුල් කෙහෙල් ගෙඩි ¾ විතර කාලා. ඊට පස්සේ බත් වලට වැලි ආවේ නැහැ.

374. අපේ අක්කා කෙනෙක් රෑ හොස්පිටල් ඩියුටි ඉවර වෙලා බස් එකෙන් බැස්සහම ගෙදර එක්කරගෙන එන්නේ මම හරි තාත්තා හරි. අපි බොහෝ විට හුළු එළියක් පත්තුකරන් තමයි අක්කාව එක්කන් එන්නේ. දවසක් රෑ අපටත් නොකියාම අක්කා තනියෙන් බස් එකෙන් බැහැලා එනකොට කවුද දඟකාර කොල්ලෙක් මැස්සක් පිටිපස්සේ හැංගිලා ඉඳන් ‘සෝමා අක්කේ, සෝමා අක්කේ’ කිය කියා හැංගෙනවා. හොඳටම බයවූ අක්කා ‘කවුද, කවුද’ කියලා අහනකොට සද්දයක් නැහැල්ලු. අක්කා දාඩියදාගෙන, ගැහි ගැහි ගෙදර එක පිම්මේ දුවගෙන ඇවිත් ඇඳට වැටුනා. නිදා ගත්තේ නැහැ. පහුවෙදා බැලින්නම් අක්කාට දිශ්ටියක් වැහිළලු. ප්‍රදේශයේ හොඳම කට්ටඩියා කැඳෙව්වා. තොවිලේ දවසේ මහා රෑ කට්ටඩියා දෙහි, ගැට, දුම්මල

පන්දම් එහෙම ලෑස්ති කරලා, ආතුරයාව වන අක්කාව වටකරගෙන, බෙර ගසමින්, මන්තර ජප කර කර ‘මාහසෝනා’, ‘රීරි යකා’, ‘ඔඩ්ඩි යකා’ ආදී වශයෙන් නම් අඩ ගහ ගහා යක්කු කැඳෙව්වා. යක්කු ටික ‘දන’ ගැහුවට පස්සේ, දොළ පිදේනි දෙන්න කියලා නියම කළා. මෙන්න මැරිලා වගේ හිටිය අක්කා නැගිට්ටා. සතියක් වැඩට නොගිය අක්කා නැවත වැඩට ගියවිට මුළු රෝහලේ කාර්ය මණ්ඩලයම දන්නවලු සෝමාදේවී හෙවාමන්නආරච්චිට යකෙක් ගහලා ‘එලොව ගිහින් මෙලොව’ ආව විත්තිය.

375. මාමගේ මිනිය වලලලා ගෙදර මල බත කාලා නිදා ගන්න යනකොට වහලට කවුද ගල් ගහනවා. ‘ඕක අර මිනිහගේ වැඩක්’ කියලා නැන්දා කිවා. අපි රෑම කනත්තට ගියා. මෙන්න මාමා වලලපු මිනීවල උඩ කවුද හිටගෙන ඉන්න ජායාවක් වගේ පේනවා. අපි ලඟට එනකොට මුකුත් නැහැ, ගොක්කොල සැරසිලි දාපු තොරණ විතරයි. ඔය ගොක්කොල තොරණ සුළඟට පැද්දීලා කියලා පොඩි බාප්පා කිවා. මාමාගේ රූපේ හිටෝලා පොල් තෙල් පානක් පත්තුකරලා ‘අනේ මාමේ අපෙන් වරදක් උනා නම් සමාවෙන්න, ඔයාව හොඳ තැනකට යන්න කියලා අපි පින් දෙන්නම්’ කියලා වැඳලා ගෙදර ආවා, ‘ආයි අපිට ගල් ගහන්න එපා’ කියලාත් ඉල්ලුවා. ආයි ගල් ගහලා තිබුනේ නැහැ.

376. මැරුනහම මිනී පෙට්ටියේ තියෙන තමන්ගේ මුහුණ කළුවේ යයි බයවූ මවක් ඉස්පිරිතාලේදී දුවට මිනියේ මුණ සුදු කරන ක්‍රීම් ආලේපයක් දුන්නාලු.

377. මගේ නිවස සෑදීම සඳහා බාස්ලා වගයක් රැගෙන ආවා අපේ දුර ගම් පළාතෙන්. අපි ඉදිකළ නිවසේ යට තට්ටුවේ එක කාමරයයි තිබුනේ.බාස්ලා වැඩ කලේ නැවතිලා. අපේ ඉදිකරන නිවස අසලින් ලොකු මඩුවක ඔවුන් නවාතැන් ගෙන තිබුනේ. 7,8 දෙනෙක් සහ සියලු බඩු මුට්ටුද සිමෙන්තිද ඇතුළු ටකරන් සෙවිලි වහලයට උඩින් ඔවුන් සිටි මඩුවේ තිබුණා. දවසක් සෙනසුරාදා රෑ නැවතී හිටියේ එක බාස් කෙනකේ පමණයි. රෑ මැදියමේ දම් අතුවල තරගෙට වහමින් වවුලෝ කෑගහනවා. වැසිදිනයන් වූ හෙයින් රාත්‍රිය පුරා ඇද හැලෙන සිරි සිරි පොදේ ටකරමට වවුල්ලු අතුවලින් දම් ගෙඩිද සමග ලොකු වැහි වතුර කැට ගල් ගහනවාක් මෙන් වැටුණා. අපිට එය සුපුරුදු වුවත් වැඩට පැමිණි අයට ඒක හොල්මන් පරානයක් කියලා හිතිලා හොඳටම බයවෙලා. එළි වෙනකම් අපිට දොරට ගහනවා නිදිය ගන්න බැහැ 'නෝනා, නෝනා හොල්මන් මට වැලි ගහගෙන ඇඳේ හැප්පිලා දුවනවා' කියලා කියනවා. අපි ටෝච් එක ගහල පෙන්නුවා වවුල්ලු දං අතුවල එල්ලිලා ඉන්නවා. ඔහුට කොපමණ කිවුවත් තව ටිකකින් ආයෙත් දොරට ගහනවා. මිනිහා පහුවදාම සහලෝල උණ කියලා ගෙදර ගියා, අයි ආවේ නැහැ. එතන හිටපු හොඳම බාස්.

378. අපි කුඩා කාලේ ගමේ කෙල්ලොයි කොල්ලොයි හඳ තියනදාට රෑට හොඳ වැඩ කරනවා බයක් දැනුනේම නැහැ. එක එකා ගෙදරින් එලියට යන්නේ, අම්මේ මම කුමාරිලාගේ දිහා යනවා, මාමලගේ ගෙදර ගිහින් ටිකකින් එන්නම්, අතුලට ටිකක් සනීප මදි බලලා එන්නම් ආදිය කියලා. ඒ පැත්තේ ටෙලිෆෝන් ඒ දවස්වල තිබුනේ නැහැ.විසිල් පාරක් තමයි කරදරයක් වුනොත් දෙන පණිවිඩය. අපි යන්නේ කෙලින්ම කනත්තට. 10ක් 15 ක් අපි එකතු වෙලා හොයනවා මිනි ඔලු. අපි කෙල්ලෝ උදව් දෙනවා විතරයි.කොල්ලෝ ටික ඕවා අරන් ගිහින් මහා රෑම තරහ වෙලා ගමේ ඉන්න කට්ටියගේ ගෙවල් වල දොර ලග මිදුලෙන් හරි එළියේ කළගෙඩි පොලෙන් හරි තියල යනවා. පහුවදාට අපිව නෙමේ අහුවෙන්නේ. තරහ වෙලා නයි වෛරෙන් ඉන්න මිනිසුන් නැවතත් රණ්ඩු අලුත් කර ගන්නවා.හරි සවුත්තුයි කියලා හිතෙනවා අපි කරපු වැඩ දැන් හිතෙනකොට.

379. රෑක එලි බැස්සාම දැක්කේ, හවස වලලපු මළ මිනිය කටු කැලේක දාලා ගිහිල්ලා. මිනි පෙට්ටියයි, සූට් එකයි අරන්.

380. අපේ මාමා කෙනෙක් අපේ හොල්මන් කථා කියනකොට කියනවා මම නම් ඔය මොකාටවත් බය නැහැ ඔය පත්තැයන්ට හැර කියලා.

381. පිට්ටනි වල ලී කුරුස. මල්වඩම් අපේ යාළුවන් එක්ක තරහා වුණ ගැහැනු ළමයින්ගෙ ගෙවල් ඉස්සරහා තියලා ඇවිල්ලා තියෙනවා.

382. කළුකුමාරයා වැහුණු තරුණ කෙල්ලකට ලොකු තොවිලයක් කළා. දක්ෂ කට්ටඩියෙක් ගෙනල්ලා නිල්, රතු, මල්, පුළුටු ජාති, ගොක් අත්තක්, රතු කුකුලෙක් එහෙම රැස් කරලා කළුකුමාරයා කැඳෙව්වා. පහුවදා දවල් කහ නූලක් බැන්දා. පස්සේ දැනගන්න ලැබුනා එයාගේ බෝයි ෆ්‍රෙන්ඩ් බූට් එක තිබ්බට පස්සෙලු ලෙඩේ හැදිලා තියෙන්නේ කියලා.

383. ඩ්‍රයිව් කරගෙන යනකොට රෑ 12ට බොරැල්ලේ මිනී කනත්තේ තාප්පේ උඩින් තඩි රතු ඌරෙක් පැනලා දුවනවා දැක්කා කියලා යාලුවෙක් ශපත කර කර කිවුවා. මේ ලඟදි හම්බ වෙලා ආයි ඇහුවා, මිනිහා කියනවා කථාව ඇත්තලු.

384. අහල පහල ගෙවල් වල කොල්ලන්ට පාඩුවේ ඉන්න දෙන්න නැති කෙල්ලක් හිටියා. කොල්ලෝ ටික එකතු වෙලා හඳ ඇති දාක සොහොනට ගිහින් මිනී ඔලුවක් ගෙනවිත් මැටි වලන්දක ඇතුලට දමලා, හිමීහිට ගෙදර දොරට හේත්තු කරලා, දොරට ගහලා දිව්වා. පහුවදා ඉඳලා කෙල්ලව සවුත්ලන්ඩ් හොස්ටල් එකේ බෝඩ් කරලා.

385. සුනියම් දේවතා බලයෙන් අංජනම් එලි බලන වරමක් ලැබුණු නැන්දා කෙනෙක් හිටියා. හරියට කිරි ගහට අන්නා වගේ අංජනම් කිව්වේ. සල්ලි ගත්තේ නැහැ. පූජා වට්ටි ගත්තෙත් නැහැ. ඒ නැන්දා මැරිලා දැන් ගොඩක් කල්. මිනිස්සු තවම දේවාලේ දෙසට සල්ලි විසි කර යනවා.

386. මල ගෙදරක් ඉවර වෙලා එළියේ පෙරේත තටුව දාලා. එකේ තිබුණු ඉදුණු කෙහෙල් ගෙඩි කාපු යාළුවව මතක් වෙනවා. ගෙදර මිනිස්සු හිතලා තියෙන්නේ මැරිච්ච පෙරේතයයි ඇවිල්ලා කාලා තියෙන්නේ කියලා, ඒ අයට ෆුල් සැට.

387. ඔන්න අසූවේ දශකයේ අපේ අහළ පහළ ගෙදරක කැපිල්ලක්. අළුත මැරිච්ච ගෙදරක. පිදේනි තටුව රවුමට පැදුරකින් වටකරලා තිබුනා. කට්ටඩියා පොල් මලක් අරන් ගේ වටේ යනවා, ගෝලයා පන්දමත් අරන් දුම්මල ගගහා යනවා. ඔහොම ගිහින් අර පැදුරෙන් වටකරපු එක ඇතුලට පොල්මල දාලා පිදේනි තටුව අවුස්සලා ගියා. ටිකකින් මල් පැල ගාවට ඇවිත් මන්තර කියලා ගෝලයට කියනවා ගිහින් බලනවා පිදේනි තටුවේ මොකුත් ලකුණක් නැද්ද කියලා. ගෝලයා ගිහින් එබිලා බලලා කෑගහනවා, ‘මේ මේ ඇවිත් එහෙන් මෙහෙන් පහුරුගාලා බුක්ති විඳලා තියෙන්නේ’ කියලා. බලනකොට ඇත්ත, ඒකේ ටිකක් හැලිලා තියෙනවා. ගෙහිමියා දන්නේ නැහැ කට්ටඩියා පොල් මල දාලා ඇවිස්සුවා කියලා. මම හොරෙන් කිවුවා. ඒත්

මිනිහගේ අන්ධ විශ්වාසෙට මිනී වලේ ගිහින් මහා බලගතු මන්තර කියලා මතුරලා ජපකරලා කපන්න කියාලා තවත් සල්ලි දුන්නා.

388. දවසක් හොරු දෙන්නෙක් කළුවරේ අම්බරැල්ල ගහකින් හොරෙන් ගෝනියක් පිරෙන්න අම්බරැල්ල කඩාගෙන අරන් යනගමන් පාලු සොහොන් පිටියකට තාප්පෙන් පැනලා අම්බරැල්ල ටික දෙන්නට බෙදා ගන්නවලු, හීන් හඬින් 'උඹට එකයි මට එකයි' කියමින්. මේ ජාමේ ඒ අසල දෙවට පාරේ වැඩ ඇරිලා ගෙදර යන සිකුරිටි මල්ලියෙක් මේක ඇහිලා දුවලා පණ කඩාගෙන, දුවද්දී පොලිසියේ රාළහාමිට අහුවෙලා, 'සොහොනේ යක්කු මළමිනී බෙදාගන්නවා ඇහිලා බයටයි දුවන්නේ' කිවුවත් පිළිඅරගෙන නැහැ. බොරුද බලන්න බය වුණ තැනට එද්දී හොරෙක් කියනවලු 'තාප්පෙන් එහා පැත්තේ දෙකට මොකද කරන්නේ' කියලා. ඇසුන සැනින් ගිය දෙන්නා ගම කඩාගෙන දුවලා බයට, 'දෙක' කියලා තියෙන්නේ තමන් දෙන්නට කියලා හිතාගෙන. නමුත්, හොරා කියලා තියෙන්නේ අම්බරැල්ල ගෝනිය තාප්පෙන් එහාට දානකොට මෙහාට වැටුණු අම්බරැල්ල ගෙඩි දෙකක් ගැන.

389. හඳ පානේ මිනී ඔලු එකතු කරන්න ගිය හැටි තාම මතක්වෙනවා.

390. මහා රෑ බලපිටිය වැල්ලේ සුදු ඇඳ ගත්ත අවතාර ගැහැනියක් ඇවිදිනවා කියලා ටව්මේ ප්‍රචාරයක් ගිහින් සෙනග සේරම වගේ වැල්ලට ඇදීලා. බස් ස්ටෑන්ඩ් එකේ හිටපු මිනිස්සු ගාලු යන අන්තිම බස් එක (රෑ 1130) අමතක කරලා වැල්ලට දුවලා. බැලින්නම් සුදු පාට ඇඳපු හික්කඩුවේ හෝටලේක උස සුද්දියක් රෑ බලපිටියට වෙනකම් ඇවිදගෙන ඇවිල්ලා, ඒ අමාවක දා රෑ, වැල්ලේ සක්මන් කරනවලු. මිනිස්සු හිතලා තියෙන්නේ හොල්මනක් කියලා.

391. යකා වැටිච්ච මිනිහෙකුට තොවිලේදී යකදුරා ලෙඩාට යකඩ ඇණයක් අතට දීලා, රෙද්දක් පොරවලා, කාමරයක දාලා වහලා, නටපු යක්ස සන්නිය මතක් වෙන කොට තාම බයත් හිතෙනවා, හිනාත් යනවා.

392. නැන්දා කෙනෙක් නිවසේ දෝෂයක් කියලා කොහෙන්ද පොල්ගෙඩි 4ක් ගෙනාවා ජීවම් කරපුවා.ඒ දේවාලේ කපු මහතා හතර මුල්ලේ එල්ලන්න කියලා. දවසක් මම මිදුලේ කතා කරමින් නැන්දම්මේ,ඇයි මේ පොල් පැල වෙලා හතර මුල්ලේ කියා ඇසුවා. අනේ දුවේ අපිට හරිම අපල කාලයක් වෙලා තිබුනා, පසුගිය කාලේ. කරන කියන දේවත්, හොයන දෙයක්වත් ඉතුරු නැහැ.මේ ආරක්ෂාවට පස්සේ හරීම හොදයි කිවුවා.ඒ වුණාට නැන්දම්මේ මේ පොල්ගස් මහා විශාලෙට ලොකු වුණහම මේ ගේ ඔයාලට කඩන්න වෙනවනේ,මේ පොල්ගස්

ගලවලා දේවාලෙකට පූජා කරන්න කියලා කිවුවා. ඇය එසේ කළා. නමුත් ඒක ගැළවූ නිසා නැවතත් එම නිවසට අසුබ කාලයක් පැමිණ ඇතැයි ඇය පවසන්නේ දුකින්.

393. දුන්කාල්පිටියේ සුසාන භූමිය ලඟින් රෑට කළු ඇඳ ගත්තු මිනිහෙක් රෑට යන කරත්ත කාරයන්ට අත දාලා කථා කරලා මීගමුවට ගිහින් ඇරලවන්න කියනවා කියලා කතාවක් ඒ දවස්වල (රටට නිදහස ලැබීමට ඉස්සර) ලොකුවට තිබුනා. හැමෝම විශ්වාස කලේ ඒ බිලා, දුන්කාල්පිටිය - මීගමුව මහපාරේ වැටිලා හිටපු කරෝලිස් අප්පු කියන කරත්තකරු කියලා. කිසිම රෑ කරත්ත කාරයෙකුට කරෝලිස් අප්පුගෙන් කරදරයක් නැහැ. රෑ 2ට විතර තමයි කරෝලිස් අප්පු මුහුදු වෙරළේ/කනත්තේ ඉඳලා පාරට එනවා කියන්නේ. හැබැයි කරත්තේ km 10ක් පමණ ගෙවලා මීගමුවට ගියහම කරත්තේ ඇතුලේ හිටපු කරෝලිස් අප්පු නැහැල්ලු. මිනිහා කලපුව ලඟදි කාටවත් නොකියා බැහැලා යනවා කියලා තමයි කරත්ත කාරයෝ කිව්වෙ, විශ්වාස කලේ. හැබැයි දවසක් කොච්චිකඩේ යන කරත්තෙක මිනිහා නැගලා ගිහින් කරත්ත කාරයත් එක්ක මිගමුව ටව්මෙන් කෝපිත් බිලා (වචනයක් වත් කථා නොකර) මුහුදු වෙරල ලඟදි අතුරුදහන් උනාලු. ඒ කරත්ත කාරයා හොඳටම බය වෙලා, උණසන්නිපාතේ හැදිලා සති දෙකකින් පමණ පස්සේ මිය ගිහින්.

394. මුහුද ළඟ පාලු වලව්වක් වගේ ගෙදරක වයස 70 පැන්න මහලු යුවලක් ගෙදර ඇතුලේ සාලේ ලයට් දාගෙන රෑ 12 – උදේ 4 විතර වෙනකම් කෝපි බිබී ගේ ඇතුලේ

ඉන්නවාලු. ළඟ පාතින් කවුරුහරි පයින් හරි ස්යිකලෙක (පුෂ්/මෝටර්) යනවානම් අඩ ගහලා ඇතුලට අරගෙන කෝපි බොන්න දීලා, නොයෙක් ප්‍රශ්න අහනවලු. සල්ලි තියෙනවානම පරිස්සම් කරලා දෙන්නම් කියනවලු. පුදුමේ කියන්නේ උදේ 5න් පස්සේ මේ යුවල දකින්න නැතිලු, ආයි පහුවෙන්දා රෑ වෙනකම්.

395. මම බාන්ස් ප්ලේස් එකේ ගෙදරක බෝයි වැඩේ කරනකාලේ ගෙදර නෝනා රෑ 12ට විතර අපිව කුද්දලා හොඳටම බයවෙලා අපට කියනවා එයාගේ කාමරේ කබඩ් එක අස්සේ හොල්මනක් ඉඳන් සද්ද කරනවා කියලා. මුලදී මුලදී අපි හිනා උනා. පස්සේ අපිත් ගිහින් බැලුවා, කතාව ඇත්ත. කබඩ් එක ඇතුලෙන් 'කරාස් කරාස්' ගලා සද්දයක් එනවා, නවතිනවා ආයි සද්දේ එනවා. කබඩ් එක ඇරලා බැලුවත් මුකුත්ම නැහැ. මාසයක් විතර ඔහොම උනා හැමදාම. නෝනා දවසක් මාවයි ගෙදර අම්මෙවයි ඇරියා රාජගිරියේ පේන අහන තැනකට. පේන කාරයා කිව්වා ගෙදර, කාමරේ භූතයෙක් ඉන්නවා, තොවිලයක් කරන්න ඕන කියලා. ආයි කිව්වා හාමුදුරුවෝ ගෙන්නලා පිරිතක් කරන්න, බැරි නම් අඩු ගානේ ගිහි පිරිතක් කරලා, කිරි අම්මලා 10 දෙනෙකුට දානයක් දෙන්න කියලා. ඔන්න ඉතින් ඒ වැඩ වලට අපි කළමනා ලැස්ති කරන කාලේ නෝනා ආයි බයවෙලා ඇවිල්ලා හරියට රෑ 12ට අපිව කීද්දුවා. අම්මේ ගිහිල්ලා නෝනාගේ කාමරේ කබඩ් එකේ ලාච්චු එලියට ඇදලා එකේ තියෙන බඩු එකින් එක එලියට

අරගෙන චෙක් කළා. පලවෙනි ලාච්චුව චෙක් කරලා ඇතුලට දාලා දෙවෙනි එක චෙක් කරන කොට මෙන්න බොලේ පුංචි මියෙක් ඉන්නවා, පොතක් ඇතුලේ ගුලිවෙලා. ඒකා  අර ලොකු වෙන ජාතියේ මීයෙක් නෙවෙයි. මේකා තමයි හැමදාම සද්දේ කරලා තියෙන්නේ එකම වෙලාවට. මම මියාව පොතත් එක්කම ගෙනිහින් එළියේ බින් එකට දාලා පියනෙන් වහලා ආවා. පහුවෙන්දා කුණු ලොරිය ඇවිත් බින් එක ක්ලියර් කළා. එදායින් පස්සේ සද්දේ නැහැ.

396. ඔන්න එක දවසක්කොඩි විනයක් ගන්න කියලා යකැදුරෙක් ගේනාවලු. හැබැයි ඊට කලින් දා ඒ ගෙදර පැත්තේ යකදුරාගේ ගෝලයෙක් ටිකක් රෑ බෝ වෙලා ඇවිත් කොඩි විනයක් වළලා ගියාලු. මේ මනුස්සයා මේක කරනවා කිතුල් ගහක හිටපු ගෙදර  රා මදින කොල්ලා දැකලා තියෙනවා. පස්සේ, ඒ ලෙවල් පාස් ඒ  කොල්ලා ගහෙන් බැහලා කොඩි විනය අරගෙන හොඳටම අසූචි තවරලා ආපසු යට කරලා වහලා ගිහිල්ලා. ගෙදර මහත්තයට කියලාත්  නැහැ. වැඬේ හරි බව දන්නා යකදුරා පහුවෙදා ඇවිල්ලා ඇහුවලු  ‘කොඩිවිනයක් තියෙනවා, අහුඋනා මේක ගන්න ඕනේ අතින්ද කටින්ද’ කියලා. ඉතින් ගෙහිමියා වැඳගෙන මුකුත් නොදැන කිවාලු, ‘අනේ දෙවියනේ කටින්ම ගන්න එහෙනම්’ කියලා.

397. ළමයි 3 දෙනෙක් සමඟ කෝච්චියට පැන්න මවකගේ අවතාරය තමන් දුටු බව බුළුගහපිටිය දුම්රිය ස්ථානයේ වැඩ

කරනවා යයි කියූ පෝටර් මහතෙක් කිවා. ඊ කෝච්චියට ටැබ්ලේට් එක දී දුම්රිය ස්ථානය තුල වෙත යනවිට ඇය බංකුවක් මත ඉඳන් හිඳලා. 'ඔයා කවුද, මොකද මෙතන කරන්නේ' කියලා ඇහුවහම 'ඇයි මතක නැද්ද, මම ළමයිගේ අම්මා; මගේ අවයව ඇහින්දේ ඔයානේ' කියලා, ඒ අම්මා එහෙම කියලා අන්තර්ධාන වෙලා. ඇත්ත,ඒ සිද්ධිය දවසේ අවයව ඇහිඳලා තියෙන්නේ මේ පෝටර්. පෝටර් කලන්තේ දාලා වැටිලා සතියක් පඩි සහිත නිවාඩු ගිහිනුයි හොඳ වෙලා ඇවිල්ලා තියෙන්නේ.

398. අමාවක දිනක රාත්‍රියේ ගෙදර වහල උඩින් කවදාවත් නැතුව වව්ලන් රංචු පිටින් කෑ ගසා රවුමට රවුමට පියෑඹුවා. අම්මා කිවා මොකක් හරි අසුබ දෙයක පෙරනිමිත්තක් කියලා. පහුවදා උදේ ආරංචි උනා අබරන් කියන කරත්තේ වැඩ කරපු මිනිහා අපේ වත්තේ කෙලවරේ පාළු, ජඹුර ලිඳකට පැනලා මැරිලා කියලා.

399. අපේ බාප්පාගේ ගෙදර ඇන්ටිගේ සහ පුතාගේ ඇඳුම් මලකඩ කන්න පටන් අරං. දුඹුරු පාට මලකඩ තිත් හැම ඇන්දුමේම වගේ. සාස්තරයකට කිවූවලූ මැරිච්ච බාප්පා පෙරේතයෙක් වෙලා කරන දේවල් කියලා. බාප්පාට ආදරේ පුතා රෙදි සෝදන ඇඳුම් කුඩු පරික්ෂා කරහම තෙරුනලූ ඒවා ඇන්ටි මිට අවුරුදු 4ට එහා ගත්තුවා කියලා. මලකඩ ඇවිල්ලා තියෙන්නේ පරණ වූ රෙදි සෝදන කුඩු සහ ටැප් වතුර සම්මිශ්‍රණයෙන්.

400. පාළු, විශාල ගෙදරක තනියෙම ජීවත්වෙන මැදිවියේ මහතෙක් කිවූ කථාවක්: 'මම හැමදාම රෑට උනුකරපු වතුර එකක් ලොකු බෝතලේකට දාලා ෆ්‍රිජ් එකට දානවා. පහුවදා උදේ නැගිටලා වතුර බොන්න හදනකොට බෝතලෙන් භාගයයි වතුර තියෙන්නේ. මේක සති 4ක් විතර උනා, පස්සේ වතුර නොදා හිටියා. මගේ මැරිච්ච අයියා අයිස් වතුර බොන්න හරිම ආසයි, මට හොඳටම ෂුවර් මේක එයාගේ වැඩක්'.

401. අපේ ගේ පිටිපස්සේ මහා මුකලන් කැලේ. දවසක් රෑ 12ට උල ලේනෙක් කෑ ගහන්න වුනා මහා මුසල විදියට. අම්මා කිවුවා 'හෙට කවුරුහරි මේ ගමේ මැරෙන්න ඕන කියලා'. දවල් ආරංචි උනා හැංගිලා හිටපු මිනිමරුවෙක්ව අල්ලන්න පොලිසිය එක්ක ගමට ආව ගමේ ග්‍රාමසේවකව ඒ මිනීමරුවා වෙඩි තියලා මරලා කියලා. බෙහෙත් කොටපු තුවක්කුවකින් වෙඩි තියලා තියෙන්නේ. මිනීමරුවා කලින් උජාරුවට කියලා තිබුනලු මම 'මකුරුප්පේ ගල උඩට ග්‍රාම සේවකව ගෙන්වනවා කියලා'. ග්‍රාම සේවක මරපු ගමන්ම මිනිමරුවාව අල්ලන්න ආපු මහා සෙනග හිස් ලූ ලූ අත දුවලා. දවස් 2කින් පස්සේ STF එක ඇවිත් කුණු වෙච්ච මල මිනිය ගන්නකොට බාගයක් විතර ඒක සිවල්ලු සහ හබන් කුකුලන් විසින් කාලාලු.

402. බොරැල්ල කනත්තේ ගෙවල් වගේ විශාල සොහොන් කොත් (සමහරක්, දැනට අවුරුදු 150ට වඩා පැරණි) ඇතුලට සුදු ඇඳගත් ලස්සන රූමත් තරුණියක් කනත්තට සවසට යන මහත්වරුන්ට කථා කර රැගෙන ගොස්, ඔවුන්ව ඒ ‘අඳුරු ගුහා’ තුල තනිකර අතුරුදහන් වෙන කථාවක් පසුගිය දවස්වල් අහන්න ලැබුනා.